## 2019/06/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/06/11 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2019.06.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව විශේෂයෙන්ම අපවත් වී වදාළ පල්ලත්තර සුමනජෝති නායක හිමිපාණන් වහන්සේ හා මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, 2019 ජුනි මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

**(අ)02. 2019.05.14 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.05.14 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු **මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් 2019.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. රණවිරුගම සුභසාධක සංගමය විසින් යොමු කරන ලද ප්‍රජා ශාලාවට පිවිසෙන මාර්ගය පිළිසකර කිරීමට කොන්ක්‍රීට් සිළිංඩර් 02 ක් ලබා ගැනීම සම්බන්ධ 2019.06.05. දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. රණවිරුගම සුභසාධක සංගමය විසින් යොමු කරන ලද ක්‍රීඩා පිටිය ගොඩ කර ගැනීම සඳහා අවශ්‍ය පස් ලබා ගැනීම සම්බන්ධව 2019.05.28 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- පස් ලබා ගැනීමට යෝජිත ඉඩම ප්‍රාදේශීය සභාව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීම සිදු වී නොමැති බැවින්, ඉල්ලීම් කරන ලද පස් ප්‍රමාණය ලබා දීම කල නොහැකි බවත්, අවස්ථානුකූලව සාමාන්‍ය පස් කියුබ් ප්‍රමාණයක් ලබා දීමට තීරණය කරන ලදී.

04. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන-2019 සම්බන්ධව 2019.06.06 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

05. ජාතික විගණන කාර්යාලය විසින් 2019.05.31 දින යොමු කරන ලද නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ

ජාතික විගණන පනතේ 11 (I) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පින්ඩන වාර්තාව සභාගත කරන ලදී.

06. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද ගම්පෙරළිය වැඩසටහන- 2019 මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධව 2019.05.16 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

07. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද සුබිත පුරවර කුඩා නගර සංවර්ධන වැඩසටහන - 2019 සම්බන්ධව 2019.05.15 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

08. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන - 2019 සම්බන්ධව 2019.05.16 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

09. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද ගම් පෙරලිය වැඩසටහන - 2019 මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධව 2019.05.16 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

10. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද විමධ්‍යගත සංවර්ධන සැලැස්ම - 2019 සම්බන්ධව 2019.05.17 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

11. මැතිවරණ කොමිෂන් සභාව විසින් යොමු කරන ලද රජයේ පාසල්වලට/පාසල් ගොඩනැගිලිවලට හා රජයේ ආයතනවල ගොඩනැගිලිවලට/පොදු ස්ථානවලට/නව ගම්මානවලට/මංමාවත්වලට, ජීවතුන් අතර සිටින ක්‍රියාකාරී දේශපාලනඥයින්ගේ නම් යෙදීම සම්බන්ධව 2019.05.10 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2019 උපමාන පාදක සංවර්ධන ප්‍රදාන අංශය - පළාත් පාලන මාර්ග- නව වැඩ සම්බන්ධව 2019.05.27 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

13. පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද 2019 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව 2019.05.28 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- ඉහත ලිපියට අනුව ගෝණදෙනිය දිසානායක මාවත සංවර්ධනය කිරීමට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම සඳහා RDA එකට යොමු කිරීමට තීරණය කරන ලදී

14. පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ගේ ඡන්දයෙන් තෝරා ගෙන ඇති පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ තනතුරු පුරප්පාඩු වූ විටකදී එකී පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා නියමිත කාල වකවානුව තුල ක්‍රියා කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව 2019.05.28 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

15. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද විමධ්‍යගත සංවර්ධන සැළැස්ම - 2019 සම්බන්ධව 2019.05.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

16. පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද පොදු ස්ථානවල වැසිකිලි සංකීර්ණ ඉදි කිරීම සඳහා වන අයවැය යෝජනාව -2019 සම්බන්ධව 2019.05.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

17. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් යොමු කරන පොදු ස්ථානවල වැසිකිලි සංකීර්ණ පද්ධති ඉදි කිරීම සඳහා වන අයවැය යෝජනාව සම්බන්ධව 2019.05.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

18. සත්සිත් භික්ෂු එකමුතුව, උඩලමත්ත විසින් යොමු කරන ලද දිළිඳු පවුලකට නිවසක් ඉදි කරදීමට දායක වීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

19. පී.ඩී. යුරේකා මල්කාන්ති සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද 2019 අභ්‍යන්තර විගණන සැළැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව 2019.04.02 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

20. බී.ජී. පියතිලක, රියදුරු , නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද දසමස් වැටුප් අත්තිකාරම් මුදල ලබා ගැනීම සම්බන්ධව 2019.05.31 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

21. ඩබ්. ඒ. ශාන්ත , සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද රබර් මුද්‍රාවක් සකස් කර ගැනීම සම්බන්ධව 2019.06.06 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

22. සංවර්ධන අංශය, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද ට්‍රාන්ස්පේරන්සි ෂීට් යොදා වහලය අළුත්වැඩියා කිරීම සම්බන්ධව 2019.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

23. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද සෞඛ්‍ය කම්කරු මහතුන්ට අවශ්‍ය උපකරණ ඉල්ලීම සම්බන්ධව 2019.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

24. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද කොම්පෝස්ට් පොහොර ඇසුරුම් මිළදී ගැනීම සම්බන්ධව 2019.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

25. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද කොම්පෝස්ට් අංගනය නොදිරණ කසල බැහැර කරනු ලබන ස්ථානය අළුත්වැඩියා කිරීම සම්බන්ධව 2019.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

26. චන්දිමා සෙනවිරත්න, කළමනාකරණ සහකාර, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද වාහන වෙන්දෙසිය සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- මේ සඳහා සුදුසු දිනයක් ලබාදීමට තීරණය විය.

27. ඒ. කේ. රුක්මන්, උඩවැලිවිට්තලාව විසින් යොමු කරන ලද කඩ කාමරයක් පැවරීම සම්බන්ධව 2019.05.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- ගිවිසුම පරික්ෂා කර බලා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කරන ලදී.

28. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද සෞඛ්‍ය කම්කරු මහතුන්ට අවශ්‍ය උපකරණ ඉල්ලීම සම්බන්ධව 2019.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

29. එල්. ජී. දයානන්ද, එන්.වී ගුණපාල, නව නගරය, තල්ගස්වල විසින් යොමු කරන ලද තල්ගස්වල පොදු වෙළඳපොල භූමියෙහි පිහිටි කඩ කාමර 05 සම්බන්ධව 2019.05.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- අදාළ කඩ හිමියන් දිනයක් නියම කර කැඳවා සාකච්ඡා කිරීමට හා ඒ සම්බන්ධව තීරණයක් ගැනීමට තීරණය කරන ලදී.

30. ගා/නාප්‍රාස/සං/01/කර්, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද 2020 අයවැය සකස් කිරීම සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

31. කේ.එච්.ජී. ඩී. අනුර කුමාර , නියාගම, තල්ගස්වල විසින් යොමු කරන ලද සහනයක් ලබා ගැනීම සම්බන්ධව 2019.06.11 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- අනුර කුමාර මහතාගේ ලිපියට අනුව සහනයක් ලබා දීම සම්බන්ධයෙන් මහ සභාවේ අකමැත්ත ප්‍රකාශ කරන ලදී.

32. ගරුමන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා පෙනී සිටින උඩවැලිවිටය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ පවතින එල් 15888 දරණ නඩුව සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- ඉහත ලිපියට අනුව විමර්ශන නිලධාරී ඇතුළු නියෝජිතයන් සමඟ සාකච්ඡා කර නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු සභා අරමුදල් මගින් ගෙවිය හැකි දැයි සොයා බැලීමට තීරණය කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ)1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

i. නාගොඩ ප්‍රාදේශීය සභාවේ බැංකු සැසඳුමේ පවතින නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක කාලයක් ඉක්මවා ඇති පහත සඳහන් දින, අංක හා මුළු වටිනාකම රු. 73305.52 ක් දරණ චෙක්පත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමටත් බැංකු සැසඳුමේ හඳුනා නොගත් බැර යටතේ ඇති රු. 1500.10 ක මුදලක් හා උප ලේඛන 2 යටතේ ඇති අංක 27 ගිණුමට තැන්පත් වී ඇති මුදල වන රු. 322.28ක් උප ලේඛන අංක 04 යටතේ වැඩිපුර තැන්පත් කිරීම් ලෙස ඇති රු. 807.70 ක් හඳුනා නොගත් බැර යටතේ ඇති රු. 1246.08 යන මුදල් ආදායමට ගැනීමට යෝජනා කරමි.

උපලේඛන 03

| දිනය | චෙක්පත් අංකය | වටිනාකම |
|---|---|---|
| 2006.02.24 | 262565 | 1,359.50 |
| 2006.02.24 | 262566 | 2,000.00 |
| 2006.02.24 | 262567 | 2,000.00 |
| 2006.02.29 | 771529 | 450.00 |
| 2006.02.29 | 775016/278663 | 2,685.00 |
| 2007.01.30 | 7766256 | 3,010.00 |
| 2007.12.19 | 759220 | 9,746.00 |
| 2008.03.07 | 785428 | 380.00 |
| 2008.03.13 | 811133 | 949.00 |
| 2008.12.24 | 312651 | 650.00 |
| 2008.12.24 | 312650 | 550.00 |
| 2008.12.24 | 843624 | 4,000.00 |
| 2010.05.26 | 852195 | 875.00 |
| 2010.10.19 | 323728 | 350.00 |
| 2010.02.23 | 327499 | 2,857.00 |
| 2012.03.09 | 329180 | 4,406.00 |
| 2012.03.29 | 329208 | 2,857.00 |
| 2012.04.09 | 329248 | 2,857.00 |
| 2012.07.19 | 331788 | 1,300.00 |
| 2012.08.27 | 332869 | 150.00 |
| 2012.10.31 | 335297 | 745.00 |
| 2013.02.13 | 336524/343678 | 600.00 |
| 2013.04.08 | 343618 | 2,430.00 |
| 2013.05.29 | 344493 | 400.00 |
| 2014.02.05 | 375960 | 440.00 |

| | | |
|---|---|---|
| 2014.02.05 | 375961 | 4,135.00 |
| 2014.02.12 | 375980 | 1,600.00 |
| 2014.07.30 | 395506 | 1,700.00 |
| 2014.09.22 | 396864 | 1,003.00 |
| 2014.11.25 | 398159 | 100.00 |
| 2015.04.22 | 402456 | 576.00 |
| 2015.06.15 | 402546 | 10,186.02 |
| 2016.01.25 | 037893 | 4,659.00 |
| 2016.08.03 | 043491 | 550.00 |
| 2016.10.12 | 056318 | 750.00 |

**උප ලේඛන 02**

අංක 27 ගිණුමට තැන්පත් වී ඇති මුදල

| | |
|---|---|
| 291.28 | |
| 26.00 | |
| 5.00 | 322.28 |

**උපලේඛන 04**

| වැඩිපුර තැන්පත් කිරීම් | වටිනාකම |
|---|---|
| 2001.01.17 | 112.00 |
| 2004.09.24 | 250.00 |
| 2005.01.28 | 287.50 |
| 2007.07.11 | 3.20 |
| 2005.06.29 | 4.00 |
| | 0.50 |
| | 0.50 |
| 2007.02.26 | 50.00 |

| | | |
|---|---|---|
| 2008.12.19 | 100.00 | 807.70 |

**හඳුනා නොගත් බැර**

| | | |
|---|---|---|
| 2006.12.14 | 250.00 | |
| 2004.09.29 | 115.00 | |
| | 631.03 | |
| 2007.08.02 | 250.00 | |
| | 0.05 | 1,246.08 |

2,053.78

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

ii. උඩුගම මහජන පුස්තකාලය සහ පෙර පාසල් 15 සඳහා අවශ්‍ය නාම පුවරු ලබා ගැනීම.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iii. මාපලගම උප කාර්යාලයට හා උඩුගම උප කාර්යාලයට ඇඟිලි සළකුණු යන්ත්‍ර 02 ක් සවි කිරීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iv. ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා යොදා ගෙන ඇති ඇප්තොප්වත්ත ඉඩම් කොටස විධිමත්ව ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

v. වර්තමානයේදී අත්‍යවශ්‍ය ප්‍රමුඛ කාර්යයක් බවට පත්ව ඇති ජාතික ආරක්ෂාව පදනම් කර පසුගිය අප්‍රේල් මස 21 වන දින සිදු වූ අන්තවාදී මිලේච්ඡ ප්‍රහාරය හෙලා දකින මෙම සභාව මෙවැනි අමානුෂික ක්‍රියාවක් අනාගතයේදී සිදු නොවීම පිනිස **එක රටක් පොදු නීතියක්** යන සංකල්පය ශක්තිමත් කිරීම සඳහා රටේ නීති සම්පාදනය කරන ආයතනය වන පාර්ලිමේන්තුව ඉතා කඩිනමින් අවශ්‍ය නීති රීති සංශෝධනය කර ජාති ආගම් කුල මල භේද මෙන්ම පාට පක්ෂ භේද අතහැර සියළු ජන කණ්ඩායම් එකට අත්වැල් බැඳ **එක රටක් පොදු නීතියක්** යන සංකල්පය ශක්තිමත් කිරීමට පෙරමුණ ගත යුතු බව යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

vi. බී.ජී. පියතිලක, රියදුරු , නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද දසමස් වැටුප් අත්තිකාරම් මුදල ලබා දීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

vii. ඩබ්. ඒ. ශාන්ත , සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද රබර් මුද්‍රාවක් සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

viii. සංවර්ධන අංශය, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද ට්‍රාන්ස්පේරන්සි ෂීට් යොදා වහලය අළුත්වැඩියා කිරීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත වියෙ**

ix. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද සෞඛ්‍ය කම්කරු මහතුන්ට අවශ්‍ය උපකරණ ලබා දීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

x. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද කොම්පෝස්ට් පොහොර ඇසුරුම් මිළදී ගැනීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

xi. කේ.ජී. මානෙල් සුදර්ශනී, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද කොම්පෝස්ට් අංගනය නොදිරණ කසල බැහැර කරනු ලබන ස්ථානය අළුත්වැඩියා කිරීම.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

xii. පී.ඩී. යුරේකා මල්කාන්ති සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද 2019 අභ්‍යන්තර විගණන සැළැස්ම මහාසභාව විසින් පිළිගත යුතු බවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

**18.** ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

<u>2019.06.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>

**ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)**

**01.2018 දෙසැම්බර් මස විදුලි බිල්පත්**

2813038709 - කැකුළු පෙර පාසල - රු. 240.00

**2019 මාර්තු මස විදුලි බිල්පත්**

4593739918 - මාපලගම උප කාර්යාලය - රු. 496.20

**2019 මැයි මස විදුලි බිල්පත්**

4507357802 - සමනළ පෙර පාසල - රු. 368.10
2813038709 - කැකුළු පෙර පාසල - රු. 240.00
4599064300 - ගෝණදෙනිය පෙර පාසල - රු. 349.80
4591713210 - ප්‍රධාන කාර්යාලය - රු. 8283.20
8617046104 - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය - රු. 825.60
4594192319 - උඩුගම උප කාර්යාලය - රු. 1649.10
2810125104 - දීප්ති පෙර පාසල - රු. 386.40
8616373802 - උඩුගම පොල - රු. 240.00
4509082800 - උදාර පෙර පාසල - රු. 295.08
4593739918 - මාපලගම උප කාර්යාලය - රු. 734.10
8616374000 - මාපලගම ටොයිලට් කම්ප්ලෙක්ස් - රු. 240.00
4501090200 - මාපලග/ම වෙලඳ සංකීර්ණ කොරිඩෝව - රු. 240.00
2813189405 - තල්ගස්වල පෙර පාසල - රු. 477.90

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය ජල බිල්පත (2019.04.22 – 2019.05.21)-රු. 1839.81

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.04.16- 2019.05.15) - රු. 688.50

**04.මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2019.05.25) - රු. 68.86

**05. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

**2019 මැයි**

0912296537 - ප්‍රධාන කාර්යාලය (සභාපති නිල කාමරය) - රු. 4873.44
0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 758.87
0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 7858.58

**2019 අප්‍රේල් සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201**

2019.04.01 – 2019.04.30 දක්වා - රු. 4527.27

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. රාජකාරි අවශ්‍යතා සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1350.00

ii. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 මැයි මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

iii. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ට සුළු අක් මුදල් ලබා දීම එච්.ඩබ්.පී.අමරනාත් මයා, ම.සෞ.ප. (වසම් 02ක් සඳහා) - රු.2000.00

**<u>07.අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2019 අප්‍රේල් මස</u>**

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 9053.90 |

**<u>2019 පෙබරවාරි මස</u>**

| | | |
|---|---|---|
| පී.ජී. චන්ද්‍රදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 999.27 |

**<u>2019 මැයි මස</u>**

| | | |
|---|---|---|
| යූ.ජී. රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.3396.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.7075.50 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු.7680.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.8360.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.6211.50 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 9788.00 |
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 2705.17 |
| පී.කේ. චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3240.00 |

**<u>08.2019 මැයි මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 2502.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 3000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |

**<u>09. 2019 මැයි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන | - ගරු සභාපති | - රු. 2500.00 |
| චන්ද්‍රිකා දයාවංශ මිය | - ලේකම් | - රු.1000.00 |
| පී.ඩී. යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 960.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 1950.00 |
| අයි. චතුරි චින්තිකා | - සංවර්ධන නිලධාරී | - රු. 530.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.1190.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු.2800.00 |

**<u>2019 මැයි මස</u>**

| | | |
|---|---|---|
| ජී.පී.ජී. ශ්‍රීණිකා මිය | - කළමනාකරණ සහකාර | - රු.1760.00 |
| බී.ඩී. එල්.දිල්රුක්ෂි කුමාරි මිය | - පුස්තකාලයාධිපති | - රු.2460.00 |
| රුචිනි චතුරිකා මිය | - කළමනාකරණ සහකාර | - රු.1960.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 3360.00 |
| වයි.ජී. ගංගා පද්මිණී මෙය | - පුස්තකාල සහායක | - රු.4400.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.1705.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 878.00 |

**10. එච්.ඩබ්. ප්‍රියන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සදහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/05/24) - රු. 504.00

**11. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

i. විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10000.00

**12.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

**<u>2019 අප්‍රේල් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 35 ක් | - රු. 3640.00 |
| RD 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 65 ක් | - රු. 6760.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 160 ක් | - රු. <u>16640.00</u> |
| **එකතුව** | **- රු. <u>27040.00</u>** |

**13. කේ.ජී. ධනසිරි මයා තෙල් පිරවුම්හල, ගා/නාගොඩ**

**<u>2019 මැයි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 599ක් | - රු. 62296.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 275 ක් | - රු. 28600.00 |

252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 255 ක් - රු. 26520.00

LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 120 ක් - රු. 12480.00

තණකොළ කපන යන්ත්‍රය හා චේන්සෝව සඳහා ගබඩා කර තැබීමට පෙට්‍රල් ලීටර් 4- රු. 540.00

**එකතුව - රු.130436.00**

**14.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 ජුනි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00
ii. 2019 අප්‍රේල් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම්- රු. 2520.00
iii. 2019 මැයි මස සභා වාර්තාව පිටපත් 30 ක් සහ එස්.බී. ප්‍රින්ටර්ස් ආයතනයේ සංශෝධිත මිළ ගණන් වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2415.00

**15.එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 මැයි - රු.5310.00

**16.ඒ.ඩී. කරුණාරත්න,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 අප්‍රේල් - රු. 5600.00

**17.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**

i. වැටුපෙන් අය කර ගත් මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේශනය කිරීම 2019.01.01-2019.03.31 - රු. 4525.00

**18.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක පී 15977 ට අදාළව 2019.05.31 කැදවන ලද නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු , නඩු අංක එල් 16242 ට අදාලව 2019.05.31 නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු.6000.00

**19. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.18530.00

**20. ඒ.ජේ.ජී. ස්ටේෂනරිස්, ගාල්ල**

Pay roll පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යා වන මුද්‍රිත පරිගණක කඩදාසි බන්ඩලයක් ලබා ගැනීමේ බිල්පත - රු. 1650.00

**21.** **අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්ගලික සමාගම, පිටිගල**
වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම
( බි. අ. 21682) - රු.105250.00
වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම
( බි. අ. 21676) - රු. 49800.00

**22.** **සී/ස රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව, මාතර**
කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සේවයේ යෙදෙන කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ
මිළදී ගැනීමට මුදල් ගෙවීම - රු. 26550.00

**23.** **සවුත් නෙට් ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල**
HP 1005 ප්‍රින්ටර් යන්ත්‍ර 2 හිම අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු. 9300.00

**24.** **එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජුනි මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**25.කළමනාකරු, මහජන බැංකුව, තල්ගස්වල ගි.අ.272-1001100000027**ට බැර
ආයුර්වේද මධ්‍යස්ථානයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක වැසිකිළි පද්ධතිය ඉදි කිරීමේ කර්මාන්තයේ
සෘජු ශ්‍රමික කම්කරුවන් සඳහා ගෙවීමට රජයේ ආධාර ගිණුමට බැර කරන ලද මුදල නැවත පොදු
අරමුදලට බැර කිරීම -රු. 9800.00

**26.** **දයානි පුද්ගලික සමාගම, මාපලගම**
ප්‍රාදේශීය සභා කොම්පෝස්ට් අංගනයේ ඇති වතුර මෝටරය අළුත්වැඩියා
කිරීමේ බිල්පත - රු. 1550.00

**27.** **ඊ.ඒ. එස්. කේ. එදිරිසිංහ මයා, එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**
i. 252-6478 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු. 2250.00
ii. LL 7103 ටිපර් රථය අළුත්වැඩියා කිරීම් බිල්පත - රු.10925.00

**28.** **කේ.ටී.ආර්. ජී. උමාල් කිරිඇල්ල මයා,ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**
PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු. 2350.00

**29.** **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
2019 මැයි - රු.13000.00

**30.** **දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම්**
බී.ජී. පියතිලක මයා - රු.240940.00

**31. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**
දුම්රිය බලපත්‍ර බිල්පත් සඳහා මුදල් ගෙවීම
එම්. ඒ. ඩිලානි චන්ද්‍ර ප්‍රභා මෙය ( යාපනය- ගාල්ල දක්වා ) - රු. 12720.00

**32. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2019 මැයි මස 14 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2312.00

**33. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**

i. 2019 මැයි මස 14 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු.4995.00

**34. එම්. එච්. සන්ධ්‍යා මිය, ඌරල, වදුරඹ**

2019.04.09 දින පැවති සභා වාරය සඳහා මහජන නියෝජිතයින් සඳහා සංග්‍රහ වියදම් (කැවුම්) - රු. 1200.00

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන) - 2017**
**සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන**
**35.** චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල
කෙත්සිරි බෝධිරාජාරාමයේ චෛත්‍ය ඉදිකිරීමේ කටයුතු සඳහා සිමෙන්ති කොට්ට 10 ක් මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 9600.00

**රජයේ ආධාර**
**පළාත් නිශ්චිත - 2018**
**36. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**
ආයුර්වේද මධ්‍යස්ථානයේ ජල සැපයුම හා වැසිකිලි පද්ධතිය ස්ථාපනය කිරීම කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් - රු. 73685.00

**37. දයානි පුද්ගලික සමාගම , මාපලගම**
ආයුර්වේද මධ්‍යස්ථානයේ ජල සැපයුම හා වැසිකිලි පද්ධතිය ස්ථාපනය කිරීම කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් - රු. 5060.00

**අංක 01 සිට 37 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

➢ **(ඉ).2 කර්මාන්ත යෝජනා**

**ගරු උප සභාපතිතුමා හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

❖ **ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සභාවට පවරාගෙන ගැසට් කිරීම

ii. උඩවැලිවිටිතලාව ප්‍රධාන මාර්ගයේ තාර ගැලවී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කිරීම

iii. ගල්ලනමුල්ල මාර්ගය ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් යොදා ප්‍රතිසංස්කරණය කිරීම

iv. උඩවැලිවිටිය ක්ෂේත්‍රාරාම විහාරස්ථානයේ අපවත් වී වදාල පොරවගම ප්‍රේමානන්ද ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් දින 05 ක් විදුලිය ලබා දීම සහ ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා වැය වූ රු. 15000.00 ක මුදල සභාවේ පොදු අරමුදලින් ගෙවීමට කටයුතු කිරීම (කුමාර සවුන්ඩ්ස් ආයතනයට)

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

❖ **ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. පහත සඳහන් මාර්ග සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

**<u>219/A හෝමදොල</u>**

i. පුංචිදෙනිය මාර්ගය
ii. මැණික්කඩේ අසල සිට 50 දක්වා මාර්ගය
iii. හිල්සයිට් මාර්ගය
iv. බැද්දෙගෙදර හංදිය සිට නෙළුවැල්ගම මාර්ගය
v. නො.02 බන්ගලාව අසල ආරන්‍ය පාර
vi. 09 කන්ද මාර්ගය
vii. අක්කරවත්ත මාර්ගය
viii. මඤ්ඤොක්කාහේන මාර්ගය
ix. 65 මාර්ගය
x. ජනඋදාන ගම්මානය මැද පාර

**<u>218 B උඩුගම</u>**

xi. පොලොන්නරු කඩේ අසළ මැද පාර
xii. බැද්දෙගෙදර හන්දියෙ මැද පාර
xiii. අම්බලන්ඕවිට පාර
xiv. හල්ඕවිට පාර
xv. ගුලනකන්ද පාර

**<u>219 C උඩුගම උතුර</u>**

xvi. ගල්ලන්දල ඇල ඉහළ මාර්ගය
xvii. කහබිලියවත්ත මාර්ගය
xviii. කොන්ඩගලවත්ත මාර්ගය
xix. තානායම් පාර
xx. ඇළ ඉහළ මැද පාර
xxi. දොලේකඩේ අසළ පාර

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- ❖ **ගරු මන්ත්‍රිනී කේ.කේ. ඉනෝකා විජේවර්ධන මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

i' දකුණු පළාත් සභා හිටපු මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ලැබී ඇති රු. 20000.00 න් උඩවැලිවිටිතලාව ගල්ලනමුල්ල මාර්ගයේ අතුරු මාර්ගයක් වන කොණ්ඩුගොඩ මාර්ගය සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රිනී කේ.කේ. ඉනෝකා විජේවර්ධන මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- ❖ **ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. අලුත්වත්ත කොට්ඨාසයේ අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ අලුත්වත්ත මංසන්ධියට යාබඳව ඇති ඉඩම් කොටස්වලින් එක් කොටසක් වන අලුත්වත්ත උඩුගමු කැල්ල දක්වා යන මාර්ගය හා ගාල්ල උඩුගම ප්‍රධාන මාර්ගයේ දැනට ඉදි කර ඇති කඩ සංකීර්ණයට පිටුපසින් තිබෙන අක්කර 01 කට ආසන්න ඉඩම් ප්‍රමාණය නාගොඩ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම

ii. එම භූමියේ ළමා උද්‍යානයක් ඉදි කිරීම

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- ❖ **ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. කුඹුරුහේන නාවින්න වැව අසළ මාර්ගය ඉතා ලිස්සන සුළු බැවින් අදාල ආයතන වෙත යොමු කර මාර්ගය දෙපසට ආරක්ෂිත වැටක් ස්ථාපිත කිරීම

ii. **215 බී අලුත් පහළ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයට පානීය ජල ව්‍යාපෘතියක් ලබා දීම**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම රු. 410,000.00

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද** මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම **ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ii. පුහුල්හේන වෙදහේන මාර්ගය සංවර්ධනය කිරීම රු. 68,000.00
iii. 28 ප්‍රදේශයේ මිනිරංවල කන්ද මාර්ගය සංවර්ධනය කිරීම රු. 15,000.00
iv. උඩලමත්ත ගල්කන්දහේන මාර්ගය ආරම්භක ස්ථානයට සිළිංඩර් යෙදීම රු. 39,000.00
v. මාපලගම වත්ත හරහා දිවෙන මලාමුර පෝද්දිවල වතු මාර්ගය සංවර්ධනය කිරීම රු. 2,000,000.00
vi. නාගොඩ සංවර්ධනගම වත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම රු. 1,000,000.00
vii. තල්ගස්වල වත්ත නො.02 කොවිල මාර්ගය සංවර්ධනය කිරීම රු. 1,000,000.00

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

viii. PF 7360 කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය සඳහා අවශ්‍ය උපාංගය ලබා ගැනීම රු. 1264.00

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද** PF 7360 කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය සඳහා අවශ්‍ය උපාංගය ලබා ගැනීම **ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ix. SPRD 9457 දරණ ට්‍රැක්ටරයේ අළුත්වැඩියාව රු. 182,500.00

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින්,SPRD 9457 දරණ ට්‍රැක්ටරයට සිදු වී ඇත්තේ කුමක්ද යන්න පිළිබඳ එදිරිසිංහ මෝටර්ස් විසින් වාර්තාවක් ලබා ගෙන ඉදිරි සභාවට යොමු කරන ලෙසත්, ඩිපෝ ඉංජිනේරුවරයා විසින් ලබා දී ඇති වාර්තා සහ ට්‍රැක්ටරය ධාවනය කල කිලෝමීටර් ප්‍රමාණය ඉදිරි සභාවට යොමු කරන ලෙසත්, දැන්වූ අතර **මහ සභාව විසින් දළ ඇස්තමේන්තුව අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලදී.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

(ඊ) කාරක සභා වාර්තා

(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා

- **2019 මැයි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරංශය සළකා බැලීම සඳහා මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම**
- **2019 මැයි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම**

**11.වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම වෙනත් කරුණු යටතේ කතා කරන්න අදහස් කළේ, අපේ ගම්වල, අපිව මෙතනට පත් කර එවපු ජනතාවගෙන් අපට බරපතළ විදිහේ ඉල්ලීම් රැසක් තියෙනවා. ඒ අහිංසක මිනිස්සු වෙනුවෙන් වර්තමාන රජය මේ අවස්ථාවේ වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තියෙනවා. ලක්ෂ හයකට සමෘද්ධි සහනාධාර ලබාදීමේ වැඩසටහන. ඒ පිළිබඳව සතුටින් කතා කරනවා වගේම, අපි මේ වෙලාවෙ සඳහන් කරන්න ඕන. අපේ රජය මගින් මේ සමෘද්ධි සහනාධාර වැඩසටහන දේශපාලනමය වශයෙන් සලකලා, අපි අපේ පාක්ෂිකයන්ට ලබා දුන්නයි කියලා ගම්වල චෝදනාවක් තිබුණා. හැබැයි ඒ කටයුතු යහපාලනයක් බවට පත් කරන්න තමයි වර්තමාන රජය පත්වුණේ. ඒ නිසා අපේ තිබුණු අඩුපාඩු නැතුව යහපාලනය කියන පාලනයක් රටේ ස්ථාපනය කරන්න තමයි වර්තමාන රජය පත්වුණේ. ඉතින් අද අපට ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේ සමෘද්ධි සහනාධාරය ලබා දීමේ ප්‍රධාන බලධරයා වෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමා. සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමන්ලා තුමියන්ලා තමයි ගමේ මේ සහනාධාරය ලැබිය යුතු අය හා නොලැබිය යුතු අය කවුද කියල තෝරල දෙන්නෙ. ඒ වගේම ඒ අදාළ රජයේ නිලධාරීන් අවසන් බලධරයා හැටියට ප්‍රාදේශීය ලේකම්තුමාට/ලේකම්තුමියට තමයි මේ සම්බන්ධ වගකීම පැවරුණේ. නමුත් වර්තමානයේ මේ සමෘද්ධි සහනාධාරය ගැන කල්පනා කලාම, මේක තේරීම් කටයුතු කරන්නේ දේශපාලනික වශයෙන්. ඒ වගේම අපේ කිරිඇල්ල ඇමතිතුමා, පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරු ඉදිරියේ ප්‍රසිද්ධියේම සඳහන් කළා. මේ සමෘද්ධිය ලැබිය යුතු වන්නේ, සමෘද්ධිය දියයුතු වන්නේ එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන්ට පමණයි කියන අදහස. ඒ සම්බන්ධව අපි ඉතාම කණගාටුවට පත්වෙනවා. යම් විදියකින් එසේ පාක්ෂිකයන්ට සැලකීමේ අවශ්‍යතාවයක් තිබෙනවා නම්, ඒ සැලකීම කළ යුතු යම් ක්‍රියාපටිපාටියක්, රජයේ නිලධාරීන් හැටියට ඒ තෝරා බේරා ගැනීම් වල එදා තිබුනා. අපේ පාලන සමයේ අපි කවදාවත් නොකරපු සිදුවීම් ටිකක් මේ වෙලාවේ සිදු වෙලා තියෙනවා. මේ සමෘද්ධි වැඩසටහන වෙනුවෙන් නිස්කාරනේ වැයකරන මහා විශාල වියදමක් පිළිබඳව අනුර කුමාර අපේ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ තොරතුරු රාශියක් හෙළි කළා. මම දන්නා පරිදි, අපි පුවත්පත් වලින් තොරතුරු ලබා ගන්නවා. අපට එතකොට පැහැදිලිවම පෙනෙන දෙයක් තමයි. සමෘද්ධි සහනාධාර ලබාදීමේ උත්සව කටයුතු සඳහා සහභාගීවෙන මැතිඇමතිවරුන්ට, ඒ උත්සවයට සම්බන්ධ වන ජනතාවට ටී ෂර්ට් ආදිය ලබාදීමෙන් රු. ලක්ෂ 270 කට වඩා වැඩි මුදලක් මේ සඳහා වියදම් කරලා තියෙනවා. මේ උත්සව සඳහා මුදල් ලැබෙන්නේ කොහෙන්ද කියන එක පිළිබඳව අපි සොයා බැලුවම, අපට දැනගන්න ලැබුණා. මේ සියලු මුදල් අරගෙන තියෙන්නේ සමාජ ආරක්ෂන අරමුදලින් කියලා. සමාජ ආරක්ෂණ අරමුදල කියන්නේ අහිංසක මිනිස්සු වෙනුවෙන්, අහිංසක මිනිසුන්ගේ රුපියල් 100,200 එකතුකරලා, ඒ මිනිස්සුන්ගෙ මරණයක් සිදු වුන වෙලාවක,

ආපදාවක් සිදුවුන වෙලාවක, ඒ අයට යම් සහනයක් සලසන්න ගොඩනගපු අරමුදලක්. නමුත් වසර තුනකට වැඩි කාලයක් තිස්සේ මෙහි ප්‍රතිලාභ ගෙවන්නේ නැතුව, මේ ප්‍රතිලාභ තියා ගෙන ඉදලා, ඒ ප්‍රතිලාභ වලින් තමන්ගේ දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා මේ මුදල් වැය කරලා තියෙනවා. මේ ලැබිච්ච තොරතුරු අනුව මම හිතන්නේ මුළු ලංකාවෙම මාසයක් තුල, සියලු සමෘද්ධිලාභීන්ට සමෘද්ධි සහනාධාරය මේ වියදම් වුන මුදලින් ලබා දෙන්න පුළුවන්. ඒ වගේම, එහිදී ලබාදෙන ටී-ෂර්ට් නිෂ්පාදනය කරන්නේ රජයේ මැති ඇමතිවරුන්ගේ ආයතනවලට සම්බන්ධ ආයතන මගින්. මේවායින් මුදල් චක්‍රාකාරයෙන් තමන්ගේ පාක්ෂිකයන්ට ලැබෙනවා. ඒ ආකාරයට වැඩපිළිවෙළක් තමයි සකස් කරලා තියෙන්නෙ. ඒ වගේම එදා අපේ කාලයේ දී, අපේ ගම්වල, සමෘද්ධි සහනාධාරය දිය යුතු කෙනා කවුද, නැති කෙනා කවුද කියලා තෝරන්න අපට ඡන්දය කරපු අපේ පාක්ෂිකයන් ගියේ නැහැ. ඒ සඳහා සහභාගි වුණේ සමෘද්ධි සංවර්ධන නිලධාරින්. නමුත් වර්තමානයේ මේ සමෘද්ධිය ලබා දීමට සුදුසු පුද්ගලයින් තේරීම සඳහා ගමට යන්නේ එක්සත් ජාතික පක්ෂයට දැඩි ලෙස වැඩ කරපු, මැතිවරණ ප්‍රචාරක වැඩ රැස්වීම් තියපු නිවෙස් වල පුද්ගලයන් තමයි. ඒ වගේම අහිංසක මනුස්සයෙක් සමෘද්ධි සහනාධාර ලබා ගැනීමට ගිය විට, සමෘද්ධි නිලධාරියා ගාවට නෙවෙයි යන්න වෙලා තියෙන්නේ. මේ අසවලා හමුවෙන්න, අන්න එයා තමයි මේක කරන්නේ කියලා, ගමේ එක්සත් ජාතික පක්ෂයට වැඩ කරපු පුද්ගලයාගේ ගෙදරට යන්න වෙලා තියෙනවා. ඒ වගේම සමෘද්ධිය ලබා දීමට සුදුසු වන්නේ මාසික ආදායම රුපියල් 3500.00 ක් නොඉක්මවන කෙනෙක් තමයි තෝරන්නේ. මම සමෘද්ධි සහනාධාරය පිළිබඳව මනාපයකින් කතා කරනවා නෙවෙයි. වැඩියෙන් සහනාධාරය දෙනවා කියලා කියන්නේ, මේ සමෘද්ධි ව්‍යාපාරය කියන්නේ මේ මිනිස්සු තමන්ගෙ සංවර්ධන වැඩපිළිවෙලවල්, තමන්ගේ ආදායම, සපයගන්න වැඩපිළිවෙළින් ඇත් වෙන වැඩපිළිවෙළක්. ඒ වගේම මේ සමෘද්ධි සහනාධාර ලබාදීමේ වැඩපිලිවෙලේදී ප්‍රාදේශීය ලේකම්තුමිය, සමෘද්ධි සංවර්ධන නිලධාරි හරහා සකස් කරන ලයිස්තුව අනුමැතියට යැව්වම, අමාත්‍යාංශයේ දී මේකට දේශපාලන මැදිහත් වීමක් සිදුවෙලා, ඇමතිතුමාගේ නැත්නම් මන්ත්‍රීතුමාගේ නිර්දේශය සහිත ලේඛනය මේකට අමුනලා, ඒ ලේඛනයට තමයි මේ ලබා දීම සිදුවෙන්නේ. හැබැයි මෙහි නීත්‍යානුකූල වගකීම පැවරෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමාතුමාට හෝ ප්‍රාදේශීය ලේකම්තුමියට, හෝ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට. විශේෂයෙන් මම මේ වෙලාවේ සිහිපත් කරනවා. මේ කාරණයේදී මැදිහත්වීමේ සහ සාධාරණව කටයුතු කිරීමේ වගකීම ප්‍රාදේශීය ලේකම්තුමියට තියෙනවා. එහෙම නොවෙන්නට අපි පැහැදිලිවම සඳහන් කරනවා ප්‍රාදේශීය ලේකම් හරහා මේ කටයුතු කිරීමේදී, මේ දේශපාලන මැදිහත්වීම් දැඩි ලෙස තියෙනවා නම් එතුමියන්ලටත් අනාගතයේ, අපේ පාලනයක් යටතේ, යම් වෙලාවක මේවට වග උත්තර දෙන්න සිදුවේවි. අපේ රජයක් යටතේ ඒවාට නීත්‍යානුකූල කටයුතු කිරීමේ වගකීම අපේ රජයකට පැවරෙන්න ඕන කියන කාරණය මම මේ වෙලාවෙ සිහිපත් කරනවා. මේවා මෙහෙම කතා කරනකොට අපේ මන්ත්‍රීතුමන්ලා බොහොම සතුටින් ඉන්නවා. නමුත් මම ඔබතුමාට පැහැදිලිවම කියනවා. තමුන්නාන්සේලා බලයට පත්වුණේ අපි කරපු වැරදි දස දහස් ගුණයකින් වැඩිකරලා කරන්න නෙවෙයි. ඒවා නැති කරල යහපාලනයක් ගේන්න. ජනතාව අපි ප්‍රතික්ෂේප කරලා ඔබට බලය දුන්නේ ඒ වැරදි නිවැරදි කරගන්න කියන එකත් මම මේ වෙලාවේ සිහිපත් කරනවා. වර්තමාන රජයට අපි මේ වෙලාවේ ඉතා කාරුණිකව ඉල්ලීමක් කරනවා. මේ සමෘද්ධි සහනාධාර ලැබිය යුතු පිරිස් දේශපාලන භේදයකින් තොරව තෝරා ගැනීමේ වගකීම ඔබට තියෙනවා. ඒ නිසා ගම් වල මිනිස්සුන්ට අසාධාරණයක් සිදු නොවෙන්න, ඒ මිනිස්සු අපහසුතාවට පත් නොවන විදියට වගකීමෙන් කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහිදී පක්ෂ, පාට බලන්නේ නැතුව මේ කාරණයට මැදිහත් වීම තුළින් ඔබතුමන්ලට වාසියක් සිදුවේවි. ඒ වගේම සමෘද්ධි සහනාධාරය අහිමි වෙන අහිංසක මිනිස්සු වෙනුවෙන් යම් සහනයක් සලසන්නට ප්‍රාදේශීය බලධරයා හැටියට කටයුතු කරනු ඇතැයි විශ්වාසය අපට තියෙනවා. ඒ වගේම අපේ මන්ත්‍රීවරුන්, ඔබතුමන්ලා ගම්වල ඉන්න මන්ත්‍රීවරු හැටියට මේ වෙලාවේ යම් යම් අසාධාරණකම් පිළිබඳ තොරතුරු ලැබෙනවා. ඒ නිසා ඉතා වැරැදි ආකාරයෙන් සිදුවන දේශපාලන

මැදිහත්වීම් නතර කරන්නට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින්, ඔබ සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ වනිගරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම තව කොටසක් එකතු කරනවා. මමත් අවුරුදු දාහතක් සමෘද්ධි සංවර්ධන නිලධාරී කෙනෙක් වශයෙන් සේවය කරලා තියෙනවා. විශේෂයෙන්ම මේ ගැන දැනුම් දෙන්න ඕන අපේ වනමල් මන්ත්‍රීතුමාට හා නන්දන මන්ත්‍රීතුමාට. මොකද අපේ ගමේ අය පුද්ගලිකව අඳුනන්නේ ඔය දෙපළ නිසා. ඒ නිසා පොඩ්ඩක් අහගෙන ඉන්න. මගෙ ළඟ තියෙනවා 2015 වර්ෂයේ අලුත් පහල වසමේ සමෘද්ධි නාමලේඛනය. මම පොඩි සංගණනයක් කරල තියෙන්නෙ. පුද්ගලිකවම දන්න සමෘද්ධිලාභීන් 66 දෙනෙක් ඉන්නවා. එයින් එක්සත් ජාතික පක්ෂයට අයත් 36 දෙනෙක්, එක්සත් ජනතා නිදහස් සන්ධානයට අයත් 28 දෙනෙක් සහ ජනතා විමුක්ති පෙරමුණට අයත් එක් කෙනෙක් ආදී වශයෙන් සමෘද්ධිලාභීන් ඉන්නවා. එතකොට අපේ ආණ්ඩුව කාලයේ වැඩිපුර සමෘද්ධිය ලබා දීලා තියෙන්නෙ එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන්ට. නමුත් ඔබතුමා කියනවා 2015දී සමෘද්ධි ව්‍යාපාරයේ අසාධාරණයක් සිදු වුණයි කියලා. මෙන්න වර්තමාන සමෘද්ධි නාමලේඛනය මට ලැබුණු හැටි අහන්න එපා. මේකේ ප්‍රාදේශීය ලේකම් අනුමත කර ඇති ලේඛනයේ ඇත, ඇත කියලා සඳහන් වෙන්නෙ 95%ක්ම එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ නම්. අනිත් ඒවට අනුමත නැත කියලා තියෙනවා. මේ ලේඛන සමෘද්ධි නිලධාරී අත්සන් කරලා තියෙන්නේ. ඒ නිසා ඕන වෙලාවක පරික්ෂා කරන්න පුළුවන්. මේක ඇත්ත සිද්දියක්. ඒක නිසා තමයි මම මේක ඔප්පු කරල පෙන්නුවේ.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් ද, ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන්ද අවසරයි. විශේෂයෙන්ම සමෘද්ධි වැඩසටහන ගැන දැන් කතිකාවත් දෙකක් විතර සිදුකෙරුණා. ඇත්තටම අපටත් ඒ ගැන පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මගේ වසම කැප්පිටියගොඩ වසමෙ සමෘද්ධි සහනාධාරය පිළිබඳ මම සොයා බැලුවා. මෙවර අඩුආදායම්ලාභීන් හැටියට තෝරලා තියෙන්නෙ මාසික ආදායම රුපියල් 50000.00 න් පහල අය. මොකද කාර් එකක්, ත්‍රීවිල් එකක් තියෙන අයට පවා සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න සුදුසුකම්ලාභීන් හැටියට නම් කරලා, ලිස්ට් එකේ නම තියෙනවා. විශේෂයෙන්ම පසුගිය රජය කාලයේ දී සමෘද්ධි සහනාධාර වැඩසටහනේදී සමෘද්ධි නිලධාරී මහත්ම මහත්මීන්ට ප්‍රශ්න රැසක් ආවා. හැබැයි දැන් තියෙන තත්වෙත් එක්ක බලනකොට, ඒවා වැරදි නෙවෙයි. දැන් ඊට වඩා ප්‍රශ්න රාශියක් තියෙනවා. ඉතින් ඒ පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. එක් කොට්ඨාසයක විතරක් නෙවෙයි. සැම කොට්ඨාශයකම මෙවැනි ප්‍රශ්න ඇති. බලධාරීන් එක්ක ඔබතුමන්ලා ගිහිල්ලා සාකච්ඡා කරලා ඒ වැරදි නිවැරදි කරලා, මේ සමෘද්ධි සහනාධාරය අවශ්‍යම පිරිසට විතරක් දෙනවා නම් හොඳයි කියලා තමයි අපි දකින්නේ. ඇත්තටම වැසිකිලියක් පවා නැති මිනිස්සුන්ට මේ සහනාධාරය නැහැ.

ඒ වගේම මේ සභාවට පැමිණි දවසේ ඉඳලම ඉල්ලීම් කිහිපයක් කළා. නාන තොටුපොළවල් පිළිබඳ ඉල්ලීමක් කළා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරමින් පසුගිය සභා වාරයේදී තොටුපලවල් සංවර්ධනය කිරීමේ කටයුත්තට ඔබතුමා අනුමැතිය ලබාදී තියෙනවා. ඒ වෙනුවෙන් අපේ ස්තුතිය පිරිනමනවා.

ඒ වගේම අපේ හිටපු පළාත් සභා නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමා නාගොඩවත්ත පාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් ලක්ෂ 10ක මුදලක් ලබා දීමේ කටයුත්තට දායකත්වය ලබා දීලා තියෙනවා. ඒ සඳහා මාගේ ස්තුතිය පුදකරමින්, සියලු දෙනාටම තෙරුවන් සරණ ප්‍රර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ. අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. එමෙන්ම මම සමෘද්ධිය ගැන පොඩි වචන කිහිපයක් කියන්නම්. චන්ද්‍රසිරි මහත්මා, පියල් මහත්මා කිව්වා. 99% ක් සමෘද්ධිය තියෙන්නෙ එක්සත් ජාතික පක්ෂ අයට. එතකොට මම අහන්නේ මේ වන තුරු ඒ 99% ට එක්සත් ජාතික පාක්ෂිකයන්ට නේද සමෘද්ධිය නොදී තිබිලා තියෙන්නෙ කියලා.

මගේ දෙවැනි කාරණය තමයි, පහුගිය දිනවල අපේ ප්‍රදේශයේ සියලුම වීථි පහන් ප්‍රතිසංස්කරණය කළා. ඒ පිළිබඳව ඔබතුමාට වගේම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

අනෙක් කාරණය තමයි අපේ ප්‍රදේශයේ දැන් කතා කළ මාර්ගය වගේම ප්‍රශ්නයක් තමයි මට හිතෙන්නෙ ඉදිරියටත් තියෙන්නේ. මොකද පාරට අඩි 60 ක ප්‍රමාණයක් වෙන් වෙලා තියෙද්දී, මගේ නිවස ඉදිරිපිට නිවැසියන් නව නිවසක් හදනවා. මේ වනවිට ඉදිකිරීම් සිදු කරමින් පවතිනවා. ගමේ මිනිස්සු මගෙන් අහනවා. ඒකට පිළියමක් නැද්ද කියලා. ඔබතුමියලගේ කාලසීමාව තුළ මේ වගේ දේවල් ගමට වෙන්න දෙන්න එපා කියලා කියනවා. ඒ වගේම මීට කලින් ඒ ගෙදරම අනිත් ගේ හදනකොට ග්‍රාම නිලධාරීතුමියට පැමිණිලි කරලා, එතුමිය මැදිහත්වෙලා ඉදි කිරීම නවත්වලා තියෙනවා. නමුත් දැන් ඉදි කරමින් පවතින නිවසේ කොන්ක්‍රීට් කණු හිටවන්නෙ ඒ අඩි 60 ප්‍රමාණය තුල. ඊට අමතරව වහල ගහනකොට, තවත් ප්‍රමාණයකින් පාර වැහෙන්න බලනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔවුන් මේ ගැන මාත් එක්ක පෞද්ගලිකව අමනාප වේවි. නමුත් අපේ කාලසීමාව තුළ මෙවැනි දේවල් ඇතිවෙන්න දුන්නොත්, පසුව මෙන්න මේ කාලෙ තමයි මේ දේවල් සිදු වුණේ කියලා අපට චෝදනා නගාවි.

ඒ වගේම උඩවැලිවිටිය බටහිර ජල ව්‍යාපෘතියක් තියෙනවා. මට හිතෙන්නේ සභබන්දු මහත්තයාගේ කාලයේ සකස් කරලා තියෙන්නෙ. ව්‍යාපෘතිය මගින් ගෙවල් හතර, පහකට විතර බොන්නවත් ජලය ලබා ගන්න විදිහක් නැහැ කියලා පැමිණිලි කළා. මම කිව්වා ඒ ගැන ඔබතුමාට ලිඛිතව ඉදිරිපත් කරන්න කියලා. යම්කිසි ගෙදරකින් එන වතුර ප්‍රමාණය නවත්තගෙන ඉන්නවයි කියල තමයි මිනිස්සු කියන්නේ. ඒ ගැන සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම සියලුදෙනාට ස්තූතිවන්ත වෙමින්, මගේ කතාව අවසන් කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් අවසර දෙන්න. පුංචි නිවැරදි කිරීමක් කරන්න ඕන. නෙරංජලී මන්ත්‍රීතුමිය ප්‍රකාශයක් කළා. සමෘද්ධි සහනාධාරය 99%ක්ම ලබා දුන්නෙ එක්සත් ජාතික පාක්ෂිකයන්ට කියලා මම කිව්වා කියලා. මම හැබැයි එහෙම ප්‍රතිශත ගෙනහැර දැක්වූයේ නැහැ. හැබැයි එතුමිය කියපු කාරණයට එකක් එකතු කරන්න අවශ්‍යතාවය තියෙනවා. ඒ තමයි මේ අලුතෙන් තෝරපු ලේඛනය. පැහැදිලිවම අපේ ගම්වල නම් මම දන්නෙ නැහැ. ඔබතුමියන්ලගේ, ඔබතුමන්ලගේ ගම් වල කොහොමද කියලා මම දන්නෙ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ක්‍රියාකාරිකයන් තමයි මේ නම් ලිස්ට් එක තේරුවේ. අපේ රජය පැවති කාලයේ කිසිම දවසක ලංකාවේ කොහෙන්හරි රජයේ සේවකයෙක් මේ සමෘද්ධිලාභීන් හැටියට ලේඛණයක ඇතුලත් වෙලා තිබුන නම්, අපට ගෙන හැර පාන්න. අපි කිසිදාක කරපු නැති වැඩක්. අද රජයේ සේවකයින්ගේ නම් පවා මේ ලේඛනවලට ඇතුළත් වෙලා තියෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඇතුළත් වෙලා තියෙනවා. ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කියපු විදිහට රු. 50000.00 සීමාව දැම්ම නම් හොඳයි. මේ අසාධාරණ විදියට ලේඛනයන් හදලා 100% ක් ඔබේ පාක්ෂිකයො කියලා බැර කරනවා නම්, ඒකෙ මම ලොකු අඩුපාඩුවක් දකිනවා. මම නැවත වරක් අභියෝග කරනවා. පුළුවන්නම් අපේ රජය පැවති කාලයේ ලංකාවේ කොහේ හරි සමෘද්ධි සහනාධාර ලැබෙන්න ඕන තෝරාගන්න නාම

ලේඛනයක රජයේ සේවකයෙක් සිටියනම්, තොරතුරු ඉදිරිපත් කරන්න. එදාට අපි මේ තනතුරෙන් ඉවත් වෙන්න වුණත් සූදානමින් ඉන්නේ. අපි එය අභියෝගයක් හැටියට කරනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා වගේම සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේ ඔබතුමාට ස්තුතිය, ගෞරවය පුද කරන්න ඕන. අපි කලක් සිටම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. වීථි ලාම්පු ටික අළුත්වැඩියා කරල දෙන්න කියලා. මම හිතන්නේ මගේ කොට්ඨාශයේ දැනට 95% ක්ම සකස් කරලා තියෙනවා. ඊයේ අපේ කොට්ඨාසයේ වීථි පහන් සවිකිරීම් සිදු කරලා ඉවර වෙනකොට හවස 6.30 විතර වෙලා. නිශාන්ත, කැළුම්, ලෙස්ලි ඉතාමත් උනන්දුවෙන් කටයුතු කළා. ඔවුන්ගේ රාජකාරිය වුණත් ඊට එහා ගිහිල්ලා, දැඩි කැපවීමකින් යුතුව ඒ කටයුතු කළා. ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාවේ මුළු බල ප්‍රදේශයේම වීථි ලාම්පු ටික ඉක්මනින් සකස් කරල දීල සභාවට නැගෙන චෝදනා ටික නවත්තගන්න තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව. කැළුම්, ලෙස්ලි නිශාන්ත තුන්දෙනාටම මං මේ වෙලාවෙ මගේ ස්තුතිය ගෞරවය පුද කරනවා. ගරු සභාපතිතුමාටත් ස්තුතිය පුද කරනවා ඉක්මනින්ම අපට වීථි ලාම්පු සකස් කරල දීම පිළිබඳව.

ඒ වගේම ගරු සභාපතිතුමනි, සමෘද්ධිය පිළිබඳව දිගින් දිගටම කතා කරන්න යන්නේ නැහැ. නමුත් කිව යුතු දෙයක් තියෙනවා. අපගේ හෝමදොල කොට්ඨාශයේ 99%කටත් එහා ගිය එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන්ට තමයි සමෘද්ධිය ලබාදීලා තියෙන්නේ. එවේලෙම මම තරංග මන්ත්‍රීතුමාට කතා කරලා, මොකක්ද මේ සමෘද්ධිය දෙන ක්‍රමවේදය කියලා ඇහුවා. එතුමන්ලාගේ පාක්ෂිකයන්ට දුන්නට කමක් නැහැ. ඒ ක්‍රමවේදයේ වැරැද්ද තියෙන්නෙ. සභාපතිතුමනි, අපේ ආණ්ඩුව තුළින් ලබා දීපු අපේ අයගෙ නම් කපලා, ඒගොල්ලන්ගෙ අයගෙ නම් මේ ලිස්ට් එකට ඇතුලත් කරළා තියෙනවා. අපේ ගම තුළ ප්‍රබල එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන් එක්කෙනෙක් දෙන්නෙක් එකතුවෙලා, දේශපාලනය සම්බන්ධද කියලා මම දන්නෙ නැහැ. ප්‍රාදේශීය දේශපාලනය සම්බන්ධද කියලා අපි දන්නේ නැහැ. නමුත් තරංග මන්ත්‍රීතුමා කිව්වේ එතුමාගේ සම්බන්ධයක් නැහැ කියලා. කලින් ලැබුණු නාමලේඛනය අපි බැලුවා. ප්‍රාදේශීය ලේකම්තුමියගේ අනුමැතිය ලැබී තිබුණා. පක්ෂ පාට භේදයක් තිබුණෙ නැහැ. නමුත් ඒ නාමලේඛනය පැත්තකට දාලා, එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන්ට එවලා තිබුණේ වෙන නාම ලේඛනයක්. ඒ නිසා සාධාරණ විදිහට කටයුතු කරන්න කියලා මම කියනවා. අපි මේ වෙලාවෙ කියන්න යන්නෙ නැහැ. ත්‍රීවිල්ද, කාර්ද, තට්ටු නිවාසද තියෙන්නෙ කියලා. නමුත් ඡන්දෙකට ගමට ගියහම ඕවට උත්තර හම්බවේවි. අද තෝරාගැනීමේදීත් එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන්ම කලකිරිලා තියෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමක් කරනවා. ඔබතුමාලගේ පාක්ෂිකයන්ට සලකන්න. නමුත් ගමේ අපේ ආණ්ඩුව තියෙන කාලෙ ස්ථිර වශයෙන්ම ගමේ දෙමළ ජනතාව ඉන්න වසම වුනාට, කිසිම භේදයක් නැතුව අපි සමෘද්ධිලාභීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. එහෙම පක්ෂයක් බැලුවෙ නැහැ. ටොයිලට් එකක්වත් නැති තැනකට සමෘද්ධිය නැතුව, වාහන, තට්ටු නිවාස තියෙන තැන්වලට තමයි සමෘද්ධිය හදලා තියෙන්නේ. ඒ නිසා අපි හිතන්නේ අපේ ආණ්ඩුවක් තුළින් අපි ඒ සමෘද්ධිය කපා හරිනවා කියලා අපට කියන්න උවමනාවක් නැහැ. අපි පක්ෂ, පාට බලන්නැතුව සාධාරණය ඉටුකරන බවත් මතක් කරන ගමන් ම, යහපාලන ආණ්ඩුවට වැඩි දවසක් නැති බව අපි දන්නවා. ඒ නිසා මේ ඉන්න ටික කාලේ හරි ලැජ්ජා සහගත නොවී සාධාරණ අයුරින් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේ වැරැද්ද නිවැරදි කරන්නට මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන ලඟදි එන අපේ ආණ්ඩුව තුළින් අපි සියලු දෙනාටම සාධාරණයක් ඉටුකරන බව මතක් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ලේකම්තුමියනි, ගොඩක් දෙනෙක් සමෘද්ධිය ගැන කතා කලා. මගේ කොට්ඨාසය ගත්තහම නම් කියන්න සතුටුයි. පනහකට අධික පිරිසකට සෙනසුරාදා දිනයේදී සමෘද්ධි හිමිකම ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. මම වගකීමෙන් කියන්නේ. මගේ කොට්ඨාශය තුල කිසිම රජයේ නිලධාරියෙක් ඉන්න තැනකට සමෘද්ධි හිමිකම ලබාදීම සිදු කලේ නැහැ. ඉතාමත් දුප්පත් මිනිස්සු ටිකක් තමයි මගේ කොට්ඨාශයේ ඉන්නේ. අනිත් එක අපි අවුරුදු විස්සක් තිහක් එක ගෙදරට සමෘද්ධිය දෙන්න බලාගෙන නෙවෙයි හිමිකම ලබා දෙන්නේ. යම් කාලයක් තුළදී ඔවුන්ගේ ආර්ථිකය සමෘද්ධිමත් කිරීමේ අරමුණු ඇතිව තමයි මේ සමෘද්ධිය ලබාදෙන්නෙ. අපේ සමන් මන්ත්‍රීතුමා කිව්වා මහින්ද මහත්මයා ගැන. නමුත් මහින්ද මහත්මයා නම් ඉදිරියේදී කොහොමත් එන්නේ නැහැ කියන එක අපි දන්නවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සමෘද්ධිය ඉල්ලුම් කරලා තියෙනවා කිව්වා, ලයිස්තුවෙ නම් තියෙනවා කිව්වා, මම නම් හිතන්නෙ නැහැ. අපි දන්න තරමින් නම් එහෙම නැහැ. ඇත්තටම ගන්නව නම් ගන්න ඕන අපි, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු. අපි කවදාවක්වත් එහෙම කරන්නේ නැහැ. ඒ වගේම කියන්න ඕන. අපි සමෘද්ධිය කැපුවා කියන එක අපිට පිළිගන්න පුළුවන් කතාවක් නෙවෙයි. අපි කාගෙවත් සමෘද්ධියක් කපන්න කිසිම තර්ජනයක් කරල නැහැ. නමුත් සමෘද්ධිය ලැබිය යුතුව තිබිලත්, මෙපමණ කල් සමෘද්ධිය නැතුව අසාධාරණයට ලක්වෙලා ඉන්න මිනිසුන් ඉන්නවා කියලා නම් අපි කියලා තියෙනවා.

අනිත් එක තමයි ගරු සභාපතිතුමා, කොම්පෝස්ට් මධ්‍යස්ථානයට යන පාර මේ මාසේ ඇතුළතදී සංවර්ධන කටයුතු කරනවා. ඒ නිසා ටික දවසක් පාර වහන්න සිදුවෙනවා. කුනු අදින එකත් සති දෙකක් වගේ කාලයක් තුළ නවත්තන්න සිදුවෙනවා. ඒ සඳහා මොකක් හරි විකල්පයක් යොදා ගන්න සිද්ධ වෙනවා. ඒ වගේම සභාපතිතුමා, මම දැනගන්න කැමතියි. අර කොම්පෝස්ට් මධ්‍යස්ථානය අවට ගෙවල්වල මැස්සන්ගෙ ප්‍රශ්නයට දියර එකක් දෙන්නම් කිව්වා. ඒ සඳහා ඉක්මනින් විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ හිතවත් චන්දිමා මහත්මිය නව රැකියාවකට ගියා. ඒ වෙනුවෙන් මා ඇතුළු සියලු දෙනාගේ සුභ පැතුම් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමන්, සියලු මන්ත්‍රීවරුන්, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මුලින්ම ලක්රුවන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න තියෙනවා. මොකද ඔබතුමා ගිය සභාවාරයේදී කිව්වා ලංකාවේ විහාරස්ථාන 7500කට අඩු ප්‍රමාණයක් තියෙන්නෙ කියලා. ඒක නිවැරදි නැහැ. ලංකාවෙ හරියටම ලියාපදිංචි විහාරස්ථාන 8697 ක් තියෙනවා. ලියාපදිංචි නොවුන විහාරස්ථාන එක්ක ඔක්කොම 12188 ක් තියෙනවා. ඒ වගේ ලියාපදිංචි නොවූ විහාරස්ථානයක් ඔබතුමාගේ ගමෙත් තියෙනවා. දක්ෂිණාරාමය. සභා වාර්තාවේ එය නිවැරදි විය යුතු නිසා තමයි මම මතක් කළේ.

සභාපතිතුමනි, ලක්රුවන් මන්ත්‍රීතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයකට විරුද්ධව තමයි. ඒ වෙලාවේ ඉස්කෝලේ මහත්මයා නඩු දැම්මේ. මන්ත්‍රීවරයෙක් හැටියට ඔහු වෙනුවෙන් පෙනී ඉන්න පුළුවන්කමක්, ක්‍රමවේදයක් තියෙනවද කියලා තවදුරටත් අපි සොයා බලලා, ඔහු වෙනුවෙන් පෙනී සිටින්න කියන ඉල්ලීම සිදු කරනවා. මොකද මන්ත්‍රීවරයෙක් හැටියට, එතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයක්වත්, පෞද්ගලික පාරක් වත්, ඉඩමක් වත්, ඔහුගේ නිවසවත්, එතනට අදාළ නැහැ. ඒ අවස්ථාවේ අපේ එකඟතාවයට අනුව, හිටපු අපේ විලේගේ සභාපතිතුමා නඩුවට යම්කිසි මුදලක් ගෙව්වා. මෙය අතහැරලා දැම්මොත් ඊට වැඩිය බරපතළ කාරණයක් වෙනවා. ඒ වෙනුවෙන් චන්දි ගෙවන්න වෙනවා. ඒ නිසා අපි හිතනවා. ඉනෝකා මන්ත්‍රීතුමිය ඇතුළු මේ සියලු මන්ත්‍රීවරු රෝහිත මහත්මයත් එක්ක කතාබහ කරලා, මොනව හරි එකඟතාවයකට එන්න කටයුතු කරමු. අපේ එඬේර ආරච්චි මන්ත්රීතුමා කියන්නේ, මේ පිළිබඳ එකඟතාවයකට ආවෙ නැතොත් ලොකු ගැටලුවක්

කියලා. මොකද සින්නක්කර ඉඩමකට අපි බලෙන් ඇතුළු වෙලා තියෙන්නේ. කොහොම නමුත් මෙය ඉතා බරපතළ සිදුවීමක්. ඒ නිසා මේ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ වනිගරත්න මන්ත්‍රීතුමා සමෘද්ධිය පිළිබඳ කතා කළා. පියල් මන්ත්‍රීතුමා මෙතන නැහැ. නමුත් අපි වගකීමෙන් කියනවා අපි මේ ලැයිස්තුවක් බැලුවෙ නැහැ. ඇත්තටම ඒ අතින් අපි දුර්වලයි. මොකද අපේ ආණ්ඩුවෙන් දෙන ලයිස්තුව, මෙතුමා අරන් ඇවිල්ල තියෙනවා. නමුත් අපි ගත්තෙත් නැහැ. අපි දන්නෙත් නැහැ. ඒ ගැන මම හෙව්වේ නැහැ. මොකද මම නම් කියන්නේ අපේ ගමේ නම් සමෘද්ධිය ලැබිය යුතු පුද්ගලයෝ දහදෙනෙක්වත් නැහැ. සමස්තයක් විදියට ගත්තම මම විශ්වාස කරනවා. හැමෝටම යමක් කමක් තියෙනවා. නමුත් මෙතන ප්‍රශ්නේ තියෙන්නේ තව කෙනෙකුට දෙනවනම්, ඇයි මට දෙන්නෙ නැත්තෙ කියලා. නැත්නම් රුපියල් තුන්දාහක් හාරදාහක් නැති පවුලක් කොහෙද ඉන්නේ කියලා හිතලා බලන්න. නමුත් මෙතන වෙලා තියෙන්නේ සමෘද්ධි නියාමක මහත්වරුන්ට දළු කඩන තැන්වලට, එයාට සේවා සපයනවා නම් එයාට තමයි මුලින්ම සමෘද්ධිය හැදුවේ. ඒවා ගැන පහුගිය කාලේ විවේචනයන් තිබුණා. මේ වැරදෙන ඒවට අපේ විවේචනයනුත් ඇති වෙයි. නමුත් ඉතිහාසය කරපු වරදත් එක්ක තමයි ඉදිරියට යන්නේ. පහුගිය කාලේ මැතිවරණයකට මිනිසුන් දැක්වූ සහයෝගය, මිනිස්සු ගෙන්න ගත්ත විදිය අපි දන්නවා. ඒ වගේම එතුමාලා බඩු බෙදපු විදිහ, එකම ගෙදරට කොහොමද හැමදේම දෙන්නේ. අන්න ඒ වගේ දේවල් වෙලා තියෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එදා හාල් කූපන් තියෙන වෙලාවේ, ඒ වැරැද්ද කරල එයාලට දඬුවම් හම්බවුණා. ඒ යුගයේ නිලධාරීන්ට අපි කියනවා. මේ නිලධාරි අපි කවුරු හරි වැරැද්දක් කරලා තියෙනවා නම්, එයාලට ස්වභාව දහමෙන් දඬුවම් ලැබේවි. සමෘද්ධි සහනය ගැන කෙතරම් සාධාරණය කරන්න හැදුවත්, මොන විදිහට කතා කළත්, බරපතළ විදියට උල්ලංඝනය කළා. මොකද ඔබතුමා ඔය ගැන කතා නොකළත්, අපි මේ අවුරුදු විස්සක් පුරාවට මේ දේශපාලනයේ රැඳිලා ඉන්න කොට අපි දැකපු දේ තමයි. දළු කඩන මනුස්සයාට සමෘද්ධිය නැහැ. නමුත් ඉඩමේ අයිතිකාරයට සමෘද්ධිය තියෙනවා. මේක ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කියන විදිහට වැරදි ඇති. මොන ආණ්ඩුව විසින් වැරැද්ද කළත් වැරැද්ද වැරැද්දමයි. ඒ වගේම සමෘද්ධිය මේ වගේ දෙන්න ගියොත්, අපේ රටට මොකක්ද වෙන්නෙ කියලා අපි දන්නවා. අපේ රට කොහෙද යන්නෙ. අපි මේකට විරුද්ධයි. 1200ට තිබුණු සමෘද්ධිය 3500 කරේ කවුද? මෙච්චර කල් ඒ සමෘද්ධිය ගත්තෙ කවුද? මේ යහපාලනය ඔබතුමන්ලා පට්ට ගහනවා. හැබැයි යහපාලනයෙන් ඔබ ගන්න වැටුප කීයක් වැඩි වෙලාද විදුහල්පතිතුමනි ? ඒ ගැන කථා කරන්නේ නැහැ. මේකේ හොඳ දෙයක් තිබුනට ඔබතුමාලා ඒ ගැන කියන්නේ නැහැ. නමුත් යහපාලනයෙන් වෙනත් ආණ්ඩුවකට කිට්ටු වෙන බැරි දේවල් අපි කළා. මේක ඇතුලේ අපේ පක්ෂ නායකයන්ගේ අඩුපාඩු තියෙනවා. ඒ වගේම මේ ඉන්න සියලු මන්ත්‍රීවරුනට, මේ ප්‍රාදේශීය සභාවෙන් පොහොට්ටුවට බලය දුන්නේ මොනව කරන්නද? ඒ ගැන වචනයක් කතා කරනවද? ගමට ගිහිල්ලා ඔබේ ගමේ පාක්ෂිකයන්ට මොනව හරි කරලා තියෙනවද? අපි වෙරංග මන්ත්‍රීතුමාගෙන් අහනවා. ඔබතුමා මොනතරම් බලාපොරොත්තු ඇතිව ද මෙතැනට ආවේ. ඔබතුමා කිව්වා ඔබතුමාගෙ දීමනාවෙන් මොනව හිර කරනවයි කියලා. ඔබතුමාගේ දීමනාවෙන් මොනව හරි කලාද කියලා මම අහන්නේ නැහැ. මට එහෙම අයිතියක් නැහැ. අපේ අතේ අඩුපාඩු ඇති. අපේ පක්ෂයේ අඩුපාඩු ඇති. ඒ වගේම ඔබතුමාල අද මෙතැන පාස්කු ප්‍රහාරය ගැන කතා කරනවා. සමෘද්ධිය ගැන කතා කරනවා. මෙතන ලක්ෂ අටක් පොළේ බදු සල්ලි නොගෙව ඉන්න විට ඒවා ගැන කතා කරන්නේ නැහැ. කාගෙවත් විවේචන නැහැ. මේකෙ බලන්න මොන තරම් සල්ලි අපට අය වෙන්න තියෙනවද කියලා. මොනතරම් සභාවට පොලු තියලා තියෙනවද කියලා. ඒවා අය කරගන්න කතා කරන්නේ නැහැ. OT එකක් ගැන කතා කරනවා. තේරුමක් නැහැ. මේ සභාවේ අලුතෙන් හිතලා, අලුතෙන් මොනවා හරි කරලා, ගමේ මිනිහට මොකක්ද අපි කළේ කියලා, අපි මාස පහළොවක් තිස්සේ කතා කලත්, අපි කරපු දෙයක් නැහැ. අපි කතා කරන්නේ ජාතික ප්‍රශ්න පිළිබඳ විතරයි. මම කියනවා පුළුවන්නම් ගමේ මනුස්සයෙක් වෙනුවෙන් කරන්න

පුළුවන් දෙයක් කරමු. ඒවගේම සමෘද්ධි වැරැද්ද නිර්මාණය කරලා තියෙන්නේ ඔබතුමාලගේ පක්ෂයෙන්. ඔය වනිගරත්න අපේ විදුහල්පතිතුමා කොහොම කිව්වත්, මගේ ගමේ බරපතල අසාධාරණ විදියට තමයි සමෘද්ධිය දුන්නෙ. දැන් එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය ඉල්ලපු අය මේකට මැදිහත් වෙලා කියලා, ඔය සමෘද්ධි නියාමක මහත්වරු මන්ත්‍රී වෙලා ඉන්නවා නේ. එතකොට එම මැදිහත්වීම කොහොමද කියලා හිතාගන්න. ඒක නිසා මේකෙ මොන ආණ්ඩු කලත්, මේක අසාධාරණකම් සිදු වන සිදුවීමක්. මේ එක්සත් ජාතික පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකුට සමෘද්ධිය තියෙයි කියල මම විශ්වාස කරන්නේ නැහැ. මම නැවතත් කියනවා මේ ලයිස්තුව ගැන මම පුද්ගලිකව දන්නෙ නැහැ. අපේ ප්‍රදේශයේ14 වෙනිදා සමෘද්ධිය දෙනවා කියලා අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්වා. එදා සිදු කරපු වැරැද්ද අදත් කෙරෙනවා නම් ඇත්තටම ඒ ගැන කණගාටු වෙනවා. මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නෙ, මේ වෙන දේ විවේචනය කරලා, ඔබේ ආණ්ඩුව ඔබ සාධාරණීකරණය කරන ගමන්, අපේ සභාවෙන් අපේ ගමට වෙන්න ඕන මොකද්ද කියන එක ගැන කතා කරන්න. අද අබේසුන්දර මහත්මයලගේ ගේ ගාවින් යන්න බැහැ. ඒක ආණ්ඩු ප්‍රශ්නයක්ද? අන්න ඒ නිසා මේ ජාතික ප්‍රශ්ණ පැත්තකින් තියලා, අපි අපේ ගමේ ප්‍රශ්න ගැන කතා කරමු. සභාපතිතුමාට කොච්චර කිව්වත් වැඩක් නැහැ. අපි මෙතනට පත් කරලා තියෙන්නේ ජාතික ප්‍රශ්න නෙවෙයි ගමේ ප්‍රශ්න පිළිබඳව ලොකු බලාපොරොත්තුවක් තියාගෙන.6 සභාපතිතුමාට බලපෑම් කරලා කොහොම හරි ගමේ ප්‍රශ්න විසඳන්න තමයි ජනතාව අපි මෙතනට එවල තියෙන්නෙ. මේ සභාව තුළ ඒ ටික වෙනවද කියන එක තමයි මට තියෙන ප්‍රශ්නය ඒ වගේම පාරවල් සංවර්ධනයට ලක්ෂ 1200ක් විතර ලැබිලා තියෙනවා. ඒ සියලු පාරවල් වලට සභාපතිතුමනි, අනුමැතිය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. ඔබ සියලු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ මන්ත්‍රී මණ්ඩලෙයන් අවසරයි. මම වැඩි කතාවට යන්නෙ නැහැ. මොකද අපේ නන්දන මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයත් එක්ක මම උත්තරයක් දෙන්න ඕන. ඌනපූර්ණයක් එක්ක මම සමෘද්ධිය ගැන කතා කරන්නෙත් නැහැ. මොකද රජයකින් යැපෙන ජනතාවක් බිහි කරනවට වඩා සමෘද්ධිමත් ස්වදේශික ජනයා ජීවත් කළ හැකි ආර්ථික ක්‍රමයක් ගොඩ නඟලා, ඒ තුළින් තමන්ට නිවාස හා ඒ සියලු පහසුකම් ලබා ගන්න පුළුවන් ආර්ථික හැකියාවක් රට තුළ නිර්මාණය කිරීම තමයි වැදගත් වෙන්නේ. සමෘද්ධියෙන් ජීවත් වන පිරිසක් ඉදිරියේදී මේ ලංකාවේ ස්වදේශික ජනයාට ළංකරදීම නෙවෙයි. ආණ්ඩුවක යුතුකම වෙන්නේ. සමෘද්ධියෙන් ජීවත්වෙන යුගයකට අපි යන්න ඕන නැහැ. අපි 21 වන ශත වර්ෂයත් පහු කර ගෙන මේ කාලය තුල සමෘද්ධිය කියන එක මේ රටින් තුරන් කරලා, ස්වදේශික ජනයාට ජීවත්විය හැකි ආර්ථික ක්‍රමයක් ගොඩ නැගීම තමයි ඕනම ආණ්ඩුවක යුතුකම හා වගකීම වෙන්නේ. අපේ මිත්‍ර මන්ත්‍රීතුමනි, මම මේ සභාවට ආපු දවසේ ඉඳලා මගේ වැටුප මම නොයෙක් නොයෙක් කටයුතුවලට යොදවා, යුතුකම් කරල තියෙනවා. ඒ නිසා මම වගකීමෙන් යුතුව කතා කරන්නේ. මම ඒ අවශ්‍ය යුතුකම් කොටස ඉටු කරන්න යොදවල තියෙනවා. ඒ වගේම මම නිවසක් හදලා දීලා තියෙනවා. මට කරන්න පුළුවන් හැම යුතුකමක්ම කරන්න මගේ වැටුප මම පරිත්‍යාග කළ බව මේ අවස්ථාවේ දී මේ සභාව හමුවේ ප්‍රකාශ කරනවා. මම මේක මීට කලිනුත් ප්‍රකාශ කරලා තියෙනවා. ඔබතුමා වැරද්දක් කිව්වේ නැහැ. නමුත් ඔබතුමාට කියන්න ඕන බලාපොරොත්තු රැසක් තියාගෙන තමයි ආවෙ. නමුත් අපට ඒවා ප්‍රාදේශීය සභාව තුළ ඉටු කර ගැනීමට නොහැකි වීම ගැන අපට දුකක් තියෙනවා. මොකද හේතුව අපට ආණ්ඩුවක් නැහැ. ප්‍රාදේශීය සභාව තුළ අපට මේ බලාපොරොත්තු වන සංවර්ධන කටයුතු ,අපේ ඔළුවේ තියෙන දේවල් ක්‍රියාත්මක කර ගැනීමට, ගම තුළ ක්‍රියාත්මක කරගැනීමට අපට නොහැකියාවක් තියෙනවා. අපි කොහොම හරි ඉවසගෙන, ඉදිරියේදී ඇතිවන මැතිවරණයකදී ජයග්‍රහණය කිරීමට බලාපොරොත්තු

වෙනවා. ඒ සඳහා ඉහළින්ම ඇප කැප වෙනවයි කියන පණිවිඩය දෙන ගමන්, ඔබතුමා අහපු ප්‍රශ්නයට උත්තරයක් ලැබුණ කියලා හිතනවා. මම කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද සමස්ත සභික මහත්ම මහත්මීන්ගෙන් ද අවසරයි. සභාපතිතුමනි, මම ගැසට් කරන්න පාරක් ඉදිරිපත් කළා. මේ අවුරුද්දේ ගැසට් කරනවා කිව්වා. එක ගැසට් කරන්න යැව්වද කියලා දැනගන්න කැමතියි. ඒ වගේම ගරු සභාපතිතුමනි, ගරු ආණ්ඩුකාරතුමා පැමිණි අවස්ථාවේදී අපේ කොම්පෝස්ට් අංගනය නිවැරදි ලෙස කටයුතු සිදු වෙන්නේ නැහැ කියලා එතුමා පැහැදිලි කරල දුන්නා. මෙතනින් ලොකු ආදායමක් ලබාගන්න පුළුවන්, ඒ වගේම සේවකයන් කිහිප දෙනෙක් පුහුණුව සඳහා යොමු කරන්න කියලා කිව්වා. මම නම් දකින විදියට සේවකයන් පුහුණු සඳහා යොමු කලානම්, හොඳ ආදායමක් ලබා ගන්නා ගමන්, නිවැරදි ලෙස කොම්පෝස්ට් අංගනය පාලනය කරගන්න පුළුවන්. ඒ සේවකයින් ඒ සඳහා යොමු කලාද කියල දැනගන්න කැමතියි.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මුලන පාර ලයනල් මහතාගේ නිවසේ සිට සම්පත් මහතාගේ නිවස දක්වා පාරේ යන්න බැරි තත්වයකට පත්වෙලා තියෙනවා. අඩුම ගානෙ ඒ පාරේ පයින්වත් ගමන් කරන්න බැහැ. ඒ නිසා බැකෝ යන්ත්‍රයක් යොදවලා පිළිසකර කරලා දෙනවා නම් හොඳයි. ඊළඟට අපේ ගෝනිදණිය පෙරපාසලත්, සෞඛ්‍ය මධ්‍යස්ථානයත් අසල කන්ඩිය කඩා වැටෙනවා. එතන බරපතළ හානියක් වෙන්න පුළුවන්. අපේ සෞඛ්‍ය නිලධාරිතුමා සභාපති තුමාට ලිපියක් මගින් දැනුම් දුන්න කියලා කිව්වා. එතන ලොකු අවදානම් තත්ත්වයක් තියෙනවා. ගර්භනී මාතාවන් හා පුංචි ළමයින් ඉන්න නිසා හැකි ඉක්මනින් පිළියමක් යොදන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ කුරුපනාව තේ කර්මාන්ත ශාලාව පාර හදන්න යෝජනා වෙලා තියෙනවා. ඒ පාරේ සුගත් මහත්මයාගේ නිවස අසල ගල් බැම්ම පාරට ඇවිල්ලා. දැනට අනතුරු කිහිපයක්ම සිදුවුනා. ඉතින් ඒ ගල් බැම්ම නිසා පාර පේන්නෙ නැහැ. ඒ පිළිබඳව අධීක්ෂණය කරලා, ඒක ඉවත් කරන්න ඔබතුමා මැදිහත්වෙලා ඒක ඉවත් කරලා දෙනවා නම් හොඳයි. ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කතාව අවසන් කරනවා. සියලු දෙනාට ස්තුතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසර.යි මම ගිය සභාවේ කතා කළේ නැහැ. අද වෙනකොට මේ සභාවට ආවම අපට හිතෙනවා. මේ රටේ යම් සංවර්ධනයක් සිදුවෙනවා කියලා. මේ ආණ්ඩුවෙන් මෙච්චරකල් නොවෙච්ච දෙයක් අද සිදුවෙලා තියෙනවා. වෙනත් කතාවලදි අපේ මන්ත්‍රීතුමන්ලගේ අදහස් දැක්වීමෙන්, යම් වෙනස් වීමක් වෙලා තියෙනවා කියලා මට දැනෙනවා. ඒක ඔබතුමාල දකින විදියට, හොඳ පැත්තටද, අයහපත් පැත්තටද, කොහොමහරි මහජනතාවට සේවයක් කරන්න මේ රජය ක්‍රියාත්මක කරනවා කියලා අපට දැනෙනවා. මුළු ලංකාවෙම මේ තත්ත්වය එහෙම තමයි. මම ඒ ගැන කතා කරන්න කලින් මුලින්ම අපේ සභාවට සම්බන්ධ ගැටලු කිහිපයක් සභාපතිතුමාට දන්වා සිටිනවා. මේවා කවුරුත් දන්න දේවල්. නමුත් සභාපතිතුමනි, මම මේ මගේ අදහස් දැක්වීම, ඔබතුමා තනියෙන් භාරගත යුතු දේවල් නෙවෙයි. ඔබතුමාගේ කාලෙ නෙවෙයි. ඒ ගැන අවධානය යොමුකරලා, ඉදිරියේදී අපි මේ සභා වාරයේදී ඔබතුමාට හැකියාවක් තියෙනවා නම්, මේ සඳහා පිළියමක් යොදන්න කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා. පහුගිය සඳුදා මම උඩුගම පොලට ගියා එකේ අලුත්ම බිස්නස් එකක් තියෙනවා. අනිත් ව්‍යාපාර සමග කරගෙන යනවා. ඒ වෙන මොකවත් නෙවෙයි. පොලේ ඇවිදින්න බැහැ. ෂොපින් බෑග් එකක් අරගෙන කකුලෙ දාගෙන යන්න තමයි වෙලා තියෙන්නේ. එපමණටම ජරා ජීරන වෙලා. මට ෆොටෝ එකක් ගන්න විදියක් නැහැ. මොකද මං මන්ත්‍රීවරයෙක් විදියට ෆොටෝ එකක් ගත්ත නං වටේ ඉන්න

මිනිස්සු මට බනියි. ඒ මිනිස්සු මේ පක්ෂ-විපක්ෂ කතාව නෙවෙයි කියන්නේ. තමුන්නාන්සේලා සභාව නියෝජනය කරන අය නේද? ඒ නිසා මිනිස්සු මේස් දෙක වගේ දණහිස ගාවට ෂොපින් බෑග් එක දාගෙන ගිහිල්ලා බඩු ගත්තේ. මම කිව්වේ සභාපතිතුමාට තනියෙන් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. වෙරංග මන්ත්‍රීතුමා යම් යම් කාරණා සඳහා ලොකු කැපකිරීම් කළා. නමුත් අද වෙනකොට ඒ මොන වියදම් කලත්, උඩුගම පොළේ තත්ත්වය ඒකයි. කතාවේ සත්‍යතාවය ගැන පොලට යන එන මන්ත්‍රීවරු සාක්ෂි දරයි. ඒ ගැන සොයා බලන්න.

ඒ වගේම තමයි. ගරු සභාපතිතුමනි, ක්‍රීඩා පිටි වල වාහන නතර කිරීම ගැන කතා කරන්න ඕන. අපේ උඩුගම ප්‍රදේශය ගැන තමයි මම කියන්නේ. ඒත් නිරන්තරයෙන්ම ඒ කටයුත්ත සිදුවෙනවා. පහුගිය දවස්වල ඔබතුමාට හා මේ සභාවට මේ සම්බන්ධව ලොකු චෝදනාවක් ආවා. වත්තෙ ගස් එකසිය ගානක් කපලා ගෙනැල්ල වාහන වලට පටවනවා කියලා. මහා ටෙන් වීල්, ලොකු ලොරි ගෙනැල්ලා ක්‍රීඩා පිටිය තමයි පටවන්නෙ. මටත් දුරකථන ඇමතුමක් ආවම, ගිහිල්ලා විස්තර සොයා බැලුවා. මමත් ඇස් දෙකෙන් ඒක දැක්කා. එතකොට පිට්ටනියට සිදුවන හානිය ගැන මම අමුතුවෙන් කියන්න ඕනේ නැහැ. ඒ නිසා අපේ නිසි පාලනයක් නැති නිසා තමයි එහෙම වෙන්නේ. මම ඒ ගැන සභාපතිතුමාගෙන් ඇහුවම, එතුමාගෙන් දුරකථන ඇමතුමක් මගින් අවසර අරගෙන තියෙනවා. ගරු සභාපතිතුමනි, නමුත් අවසානයේ ඔබතුමත් ඒකට මැදිහත් වෙලා එය නතර කිරීමට පියවර ගත්තා. ඒ ගැන ස්තූතිවන්ත වෙනවා. නමුත් දැන් සඳුදා පොළට ගියහම වාහන සීයක් දෙසීයක් විතර පිට්ටනියෙ ගාල් කරලා තියෙනවා. අපේ උප සභාපතිතුමා දකින්න ඇති. උඩුගම මහජන ක්‍රීඩා පිටිය සෙල්ලම් කරන්න නෙවෙයි. රථවාහන පාක් කරන්න තමයි පාවිච්චි කරන්නේ. ඒ නිසා ක්‍රීඩා පිටියෙ ගේට්ටුව වහල දාලා හරි යම් පාලනයක් ඇති කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපි යම් යම් උත්සවවලට ක්‍රීඩා පිටිය ලබා දුන්නාම, දවසට රුපියල් දාහක් වගේ මුදලක් අපට ලැබෙනවා. නමුත් එය නිවැරදි ආකාරයෙන් පිරිසිදු කිරීම් කරල දෙන්නෙ නැහැ. ප්‍රාදේශීය සභාවෙ කිව්වට පස්සේ, ඕනවට එපාවට නැවත බාර දෙනවා. නැවත අපේ කම්කරුවන් 7,8 දෙනෙක් දාලා දවසක් සුද්ද කරල තමයි නැවත යථා තත්ත්වයට ගන්න ඕන. ඒ නිසා ඒ ගන්න මුදල වැඩක් නැහැ. පහුගිය අවුරුදු උත්සව තිබුන අවස්ථාවෙ පුවක් ගස්, කඩවල් ගහපු තැන්වල කුනු ඒ තිබුන බාර දෙනකොට. ඒ වගේම අපේ උඩුගම ශ්‍රවණාගාරය අපි ලබා දෙන කොට යම් මුදලක් ඇප වශයෙන් තියාගන්නවා. අන්න ඒ වගේ ක්‍රමයක් පාවිච්චි කරලා හරි පිට්ටනි වල ආරක්ෂාව ගැනත් සැලකිලිමත් වෙලා, අලුත් වැඩපිළිවෙලක් යොදන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ සඳහා ඇප මුදලක් තියා ගත්තට පස්සේ, අපට ඒ ගැන නැවත සොයා බැලීමේ හැකියාවක් තියෙනවා. ප්‍රශ්නයක් තියෙනවා නම් ඒ ඇප මුදල ලබා නොදී සිටීමේ හැකියාවක් තියෙනවා. ඒ වගේම ශ්‍රවණාගාරයේ අද වෙනකොට බිත්ති වල අලවපු දේවල් ඉවත් කරනකොට, සම්පූර්ණයෙන්ම ප්ලේන්ට් එක ගැලවිලා තියෙනවා. නැවත ප්ලේන්ට් කරන්න අවශ්‍ය වෙලා තියෙනවා. අපි මුදල් ගත්තට ඒ ගැන සොයලා බලන නිලධාරියා කවුද? ඒ නිලධාරියා ඒ කාර්යය හරියට කරනවද නැද්ද කියල මම දන්නේ නැහැ. අද වෙනකොට ඒ ඇප මුදල් ආපහු දීලා තියෙනවා. ඒ කටයුතු වෙනුවෙන් ගනිපු රුපියල් 5000 දුන්නට ඊට වඩා හානියක් කරලා තමයි තියෙන්නේ. ඒ නිසා ඔබතුමා අපේ සභාවට තියෙන සම්පත් පරිස්සම් කරගන්න. මේ නිලධාරීන් හරහා යම් ක්‍රමවේදයක් ආරම්භ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ සභාවට විශාල ලිපි ප්‍රමාණයක් යොමු කරනවා. මේ නිලධාරීන් දෙන සියල්ල සභාවට නොදා මෙතනට කිවයුතු දේ පමණක් ගේන්න කියලා මම යෝජනා කරනවා. සභාවට දවසකට දෙකකට කලින් නිලධාරී කමිටුවක් පත්කරලා මෙම ලිපි ගැන අධ්‍යනය කරළා, සභාවට අවශ්‍ය ලිපි පමණක් සභාවට යොමු කරනවා නම් සභාවේ සහ මන්ත්‍රීවරුන්ගේ කාලය කළමනාකරණය වෙනවා. වාහන සර්විස් කරන්න ඕන නම් ,ඒක සභාවට දැමිය යුතු නැහැ. අනවශ්‍ය දේවල් වලට කාලය නාස්ති කරන්න එපා. සභාවේ රැස්වීම තියෙන දවසට කාලය කළමනාකරණය කරනවා මම දැකලා නැහැ. ගරු සභාපතිතුමනි, මගේ අදහස මම කිව්වේ. මම වැරදි වෙන්න ඇති. ඔබතුමා හිතන

විදියට ඒක ඇත්ත නම් ඒ ගැන සලකා බලන්න කියලා ඉල්ලීමක් විතරයි කරන්නෙ. මම යෝජනා කරන්නේ ඔබ තුමත් එක්ක තර්ක කරන්න නෙවෙයි. සභාවේ ලිපි කියවනකොට අපි මොකක්ද කියලා ඇහුවම, ලේකම්තුමියගෙන් අහනවා. එහෙම නෙවෙයි. කලින් දවසේ නිලධාරීන් ගෙන්නලා, ඒ යෝජනා ටිකක් ලයිස්තු ගත කරලා, ඒ අවශ්‍ය දේ විතරක් ඉදිරිපත් කරනවා නම් හොඳයි කියන එක තමයි මගේ අදහස.

ඒ වගේම තමයි. මම මේ අවස්ථාවේ විශේෂයෙන් ස්තුති කරන්න ඕන. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට. සභාවට අදාල නොවුනත්, පහුගිය දවසක ආනන්දාරාම විහාරස්ථානයට සජිත් ප්‍රේමදාස මැතිතුමා පැමිණි අවස්ථාවේ ගෝනදෙනිය ප්‍රදේශයේ අසනීප තත්වයක් ඇති දරුවෙක්ගේ සැත්කමක් වෙනුවෙන් රු. ලක්ෂ 80 ක පමණ මුදලක් එකතු කරන පවුලක් ඉන්නවා. ඒ පවුලේ ළමයි තුන්දෙනෙක් අසනීප වෙලා ඉන්නේ. අපි ඒ දෙමව්පියන් සමඟ ගිහින් නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා හමුවුණා. ඒ අවස්ථාවේ එතුමා පිටිගලට එන්න කියලා කිව්වා. දැනට මේ මිනිසුන් ලෑලි ගහල බාගයක් ගඩොලින් බැඳපු නිවසක තමයි පදිංචි වෙලා ඉන්නේ. ඒ නිවසේ වැඩ ඉවර කරල දෙන්න කියල නියෝගයක් ලබා දුන්නා. ඉතින් ඒ වෙනුවෙන් අද වෙනකොට ඒ කටයුත්ත ආරම්භ කරලා , මුදල් ලැබිල තියෙනවා. ප්‍රාදේශීය සභාවේ අපේ කොටසට එවැනි නිවසක් ලබා දීම ගැන සජිත් ප්‍රේමදාස මැතිතුමන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ මිනිසුන් යොමු කළේ මම නිසා මටත් විශාල සතුටක් තියෙනවා.

ඒ වගේම අපේ සමන් මන්ත්‍රීතුමා සහ වනිගරත්න මන්ත්‍රීතුමා ඇතුළු උඩුගම ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරු විශාල ලෙස සමෘද්ධි සහනාධාර ලබාදීමේ ගැටලු ගැන කතා කළා. ප්‍රාදේශීය දේශපාලඥයින් ඒකට මැදිහත් වෙලා කියන කොට, මමත් අපේ ගයන්ති මන්ත්‍රීතුමියත් තමයි ඒ ප්‍රදේශය නියෝජනය කරන්නේ. මම සමන් මන්ත්‍රීතුමාගෙන් අහනවා. එහෙම යම් දෙයකට අපි සම්බන්ධ කියලා ඔබතුමාලට යම් නිලධාරියෙක් කියනවා නම්, ගරු මන්ත්‍රීතුමනි, ලේඛන හදන තැනකට අපි සම්බන්ධ වුණා සහ එහෙම දෙයක් සිදු වුණා කියනවා නම් එතන අසාධාරණයක් වෙලා තියෙනවා නම්, මටත් එම අසාධාරණ සිදුවන අය ගැන තොරතුරු දෙන්න. ඒ ගැන කියපු එක ගැන සමන් මන්ත්‍රිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද අපට යම් චෝදනාවක් තියෙනවා නම්, සමන් මන්ත්‍රි තුමා පාක්ෂිකයො, ගමේ මිනිස්සු වෙනුවෙන් පෙනී ඉන්නවා . වනිගරත්න මහත්තය නම් අපට කවදාවත් කියලා නැහැ එහෙම දෙයක්. ජාත් භේදයක්, පක්ෂ භේදයක් නැතුව මම කියන්නෙත් සමන් මන්ත්‍රීතුමා එහෙම දෙයක් තියෙනවනම් මට පුද්ගලිකව හරි කියන්න. ඒ ගැන හොයලා බලලා කටයුතු කරන්නම් කියලා මම කියනවා. යම් අසාධාරණයක් වෙලා තියෙනවා නම් අද වුනත් කියන්න. මොකද මගේ ගෝණදෙනියේ කොට්ඨාශයේ එක සමෘද්ධියක් වත් තවම දීලා නැහැ. ඇත්තටම අපි ඒවට මැදිහත්වීම් කරේ නැහැ. හැබැයි අපට කවුරු හරි ඇවිල්ල කියනවා නම්, අසාධාරණයක් කරලා තියෙනවා කියලා, අපි ඒ අය ගැන හොයා බලනවා. මේ මාසේ 31 වෙනකම් අභියාචනා කරන්න පුළුවන්. ඒක නිසා අපේ ගරු උඩුගම මන්ත්‍රීතුමන්ලගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ තියෙන ලේඛන වල කාට හරි දීපු එකක වැරැද්දක් හරි, ගෝණදෙණියේ, උඩුගම උතුරේ සමෘද්ධිය දෙන්න තියෙනවා ඉදිරියට. ඒවායේ යම් අසාධාරණයක් වෙලා තියෙනවනම්, දිය යුතු සාධාරණ කෙනෙක් ඉන්නවනම්, ලේඛනයට ඇතුළත් වෙලා නැහැයි කියලා ඔබතුමා හොයාගෙන තියෙනවා නම්, අපට කියන්න. ඒ ලේඛන ගෙනත් දෙන්න. එම ලේඛන අපේ අතට ආවෙ නැහැ. එහෙම කියනවා නම් ඔබතුමාලා ඉල්ලීමක් කරන්න. සාධාරණ ඉල්ලීමකට අපි දේශපාලන භේදයකින් තොරව මැදිහත් වෙලා, ඒ ඉල්ලීම කරනවා.

ඇත්තටම මේ රජයට මම ස්තුතිවන්ත වෙනවා. රට පුරාම මේ වගේ තත්ත්වයක් ඇති කරලා, මේ ප්‍රාදේශීය සභාවේ අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ, මේ ප්‍රාදේශීය සභාවට අදාළ දේවල් කතා නොකරන තත්වයකට ඔබතුමාලගේ පාලනය පත්වෙලා. ඔබතුමාලගෙන් කෙරෙන්න ඕන කටයුතු කතා නොකර, මේ රටේම තියෙන සමෘද්ධිය ගැන කතා කරලා, කතාව අවසන් කරන තත්වයට

පත්වෙලා තියෙනවා. ඒ වගේම අපි දකිනවා. මේ රටේ දැන් මොකක් හරි දෙයක් තිබෙන බව පැහැදිලියි. ඔබතුමාව එක පැත්තකින් සතුටු වෙන්න ඕන. අපි මේ එක්සත් ජාතික පාක්ෂිකයන්ට තෝරලා සමෘද්ධිය දෙනවා නම්, මොකද ඔබතුමාලා එහෙම කරේ නැහැයි කියනවානේ. එහෙම නොකරපු හින්දනෙ ඔබතුමාල දිනුවේ. ඔබතුමාල පක්ෂ භේදයකින් තොරව අපේ එක්සත් ජාතික පාක්ෂිකයන්ටත් ඔබතුමාලගේ කාලේ සමෘද්ධිය හදලා දුන්න නිසා තමයි මිනිස්සු ඔබතුමාලට ඡන්දේ පාවිච්චි කරලා ඔබතුමන්ලා මේ ප්‍රාදේශීය සභාවටත්, මැතිවරණවලින් ඔබතුමා ජයග්‍රහණය කරවල තියෙන්නෙ. ඉතින් අපි දැන ගන්න ඕන. අපි දක්ෂ වෙන්න ඕන. එහෙමනම්, අපිට ඡන්දෙ නොදෙන පක්ෂවලට ඕන හරි නම් අපි මැදිහත් වෙලා මේක කරල දෙන්න. එතකොට ඉදිරි මැතිවරණ වලදී ජයග්‍රහණය කරන්න පුළුවන්. ඇත්තටම අද අපි ජයග්‍රහණය කරලා නෙමෙයිනේ මේ කතා කරන්නෙ. ඒ නිසා අපි කරන්න ඕන කටයුත්ත ඔබතුමාලා මතක් කරලා දෙනවා. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. ඔබතුමා ඒ කියන ,ඔබතුමන්ලගේ පාක්ෂිකයන්ගේ ඉල්ලීම් වලට ඇහුම්කන් දීලා මේ ප්‍රාදේශීය සභාවත් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරන්න මේ සමෘද්ධිය හරහා හරි කටයුතු කරන්න අපි කටයුතු කරන බව ප්‍රකාශ කරමින්, ඔබ සියලු දෙනාට සුබ දිනයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමන් ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඇත්තටම මම මුලින්ම කණගාටුව ප්‍රකාශ කරනවා. මෙන්න මේ වගේ ජාතිවාදය අවුස්සන පත්‍රිකා බෙදීම සම්බන්ධව. අපි මේවට විරුද්ධයි. මේවා කරන්න එපා. ඒක වැරදි වැඩක්. අපි ජාතිවාදී වෙන්න හොඳ නැහැ. ගරු සභාපතිතුමනි, මම සියලුම දෙනාට ස්තුතිය පුද කරන අතර, මම මගේ ප්‍රථම ස්තුතිය අපේ ගරු නිශාන්ත මන්ත්‍රීතුමාට පුද කරනවා. එතුමා පිළිගන්නවා දැන් කවුද ඊළඟ සැරේ ඉදිරියට එන්න ඕන කියන කතාව. එතුමා කිව්වා ඇත්තටම සතුටුයි. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම යෝජනා තුනක් ඉදිරිපත් කළා. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවුණත්, මෙතුමන් මෙතනදී ප්‍රකාශ කළා. මම ඒ ගැන අපේ සභාපතිතුමාට ස්තුතිය පුදකරන්න ඕන. මම පලවෙනි යෝජනාව හැටි අපේ දියවරගම්මාන වැව පාරේ ලිස්සන සුළු තැනක් තියෙන්නෙ. එතන ආරක්ෂක වැටක් ඉල්ලා සිටිනවා. අනිත් එක තමයි පානීය ජල ව්‍යාපෘතිය හා සිරිසුනන්ද විද්‍යාලයේ ආරක්ෂාව පිළිබඳ කරුණත් මම යෝජනාවක් ලෙස ඉදිරිපත් කරනවා. මොකද දෙමව්පියන් විස්සක් විතර හැමදාම පාසලේ රැඳී සිටිනවා. එදා වේල හම්බ කරගෙන ඉන්න මිනිස්සු තමයි අද ගිහිල්ලා ළමයි ආරක්ෂා කරන්නේ. ඒ නිසා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, අපටත් ඔය ජාතික පාසල් වල වගේ අපේ පාසල්වලට ආරක්ෂාව සලසා දෙන්න. ඒ අදාළ ස්ථානවලට මේ ඉල්ලීම් යොමු කරන්න කියල තමයි ඉල්ලා සිටින්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, නන්දන මන්ත්‍රීතුමාත් කිව්වා. අපේ ගයාන් මන්ත්‍රීතුමාගේ ගේ ළඟ වතුර බහින්නේ නැති ස්ථානය ගැන. ඒ වගේම තවත් ප්‍රශ්නයක් තියෙනවා. මීට මාස හයකට පෙරත් කතා කළා. දියවරගම්මානයේ වතුර බහින්නේ නැති ස්ථානයක් පිළිබඳව. මැෂින් එකක් පැය 5ක් දාලා කාණුව කපලා දෙන්න කියලා මම සභාවාර කිහිපයකදිම ඉල්ලුවා. පොඩි දරුවන්ගේ ආරක්ෂාව තකා ඒක කරලා දෙන්න කියලා මම නැවතත් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි. මම ජාතික ගැටළුවට එන්න ඉස්සරවෙලා. මේ ඉරිදා දිනයේ අධ්‍යාපන සමුපකාරයේ නිලවරණය පැවැත්වූවා. අපේ ගුරු සංගමය විශාල ජයග්‍රහණයක් ලැබුවා. අපේ ආචාර්ය චන්ද්‍රසිරි මහතාත් හිටියා. සමස්ථ ප්‍රතිඵලය පළාත් නවයෙන් හයක් ලංකා ගුරු සංගමය ජයග්‍රහණය කරලා තියෙනවා. ඒ වෙනුවෙන් අපේ ස්තුතිය පුද කරනවා. උඩුගම කලාපෙන් අපි ඡන්ද 250, 240 වශයෙන් අරගෙන එකතුව 490 ක් අරගෙන තියෙනවා. මෙතුමන්ලා 183ක් හා 169 ක් අරගෙන තියෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, සමෘද්ධිය ගැන වචනයක් හරි කතා කරන්න ඕන. අපේ ගමේ පියල් මන්ත්‍රීතුමා කිව්වා. සමෘද්ධි වැඩසටහනේදී  අයථා කටයුතු සිදු වෙනවා. මේක අද ඊයේ සිදු වුණ දෙයක් නෙවෙයි. දැන් අවුරුදු 71ක් තිස්සේ මේ දේ සිදු වුණා. එදා වඩු වැඩ කරන්නෙ නැති අයට වඩු මැෂින් ලබා දුන්නා. අන්න ඒ වගේ තමයි කටයුතු සිදු වෙන්නේ. ඒ හිටපු සමෘද්ධි නිලධාරීන් ඒ විදියට වැඩ කළා. දැනුත් කෙරෙන්නෙම ඒක. ඇත්තටම අපට ඒ ගැන කණගාටුයි.

ඊළඟ එක තමයි අපේ ජාතික ගැටළුව, අපි සියලු දෙනා දන්නවා මේ රට අරාජික මුඛයට වැටෙමින් සිටින මොහොතක, ඒ බෝලේ පාස් කරගෙන යන වෙලාවේ, දැන් වරාය, තෙල් ටැංකි, ඉඩම් ඇතුළු ජාතික සම්පත් විදේශ රටවල් වලට බිලිදෙනවා. අනිත් එක තමයි, එක්සත් ජනපදය ඇතුළු ලෝක බලවතුන්ට අද අපේ රට පාවා දීලා. ඒ වගේ රට අරාජික කර, මහජන ආරක්ෂාව බිළිගෙන, බදු බරින් පෙළෙන මොහොතක, අපි සියලු දෙනාම එකට පෙළ ගැහෙන්න ඕන. එම නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ. මේ සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්න කියලා. ඒ වගේම ඊයෙ පවෘත්ති වලදී සියළු විද්වතුන් ප්‍රකාශ කළේ ඉදිරියට ශ්‍රී ලංකාවක් කියලා රටක් තියෙද කියලා. ඇත්තටම අපි ඒ ගැන කණගාටු වෙන්න ඕන. ඒ නිසා මේ අවස්ථාවේ ඉඳලා හරි මේකට මුහුණ දීලා මේ ප්‍රශ්න සියල්ල මගහරවා ගන්න කටයුතු කරන්න ඕන. හෙට දොළොස්වැනිදා කොළඹ විශාල උද්ඝෝෂණයක් තියෙනවා. ඒකෙදි මේ රටට වෙන විනාශය මොකක්ද කියලා දැන ගන්න පුළුවන්. අද දවසේ මාධ්‍යය මෙතනට සහභාගි වී නැහැ. ඒ වුණත් අපි ප්‍රකාශ කරන්න ඕන. ඇත්තටම මිනිසුන් අපි මේ ඉන්නේ කෙතරම් දුකකින්ද. මේ රටේ ඉන්න අහිංසක දරුවන්ගේ දේපල තමයි අපි මේ කොල්ල කන්නේ. විදේශ රටවලට විකුණන්නේ. අපි මේ ගැන හිතලා කටයුතු කරන්න ඕන. මේවා බලන්න. ඔබතුමාල ආණ්ඩුවෙන් ඉල්ලල අස්වෙන්න ඕන. අනාගතේ අපේ දරුවන්ට රටක් ජාතියක් තියෙන්න ඕන.

ඒ වගේම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා ගැන වචනයක් කියන්න ඕන. එතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් තමයි. ඒ පාරට ගිහිල්ලා එතුමගෙ මුදලින් නඩු කියන්නේ. ඇත්තටම අපට කණගාටුයි. අපට කරන්න දෙයක් නැහැ. නමුත් අපි සියලු දෙනාගේම වගකීමක් තියෙනවා. ඒ එතුමගෙ ගෙදර හදාගන්න නෙවෙයි සමස්තයක් වශයෙන් තමයි එතුමා ඒ කටයුත්තට සම්බන්ධ වුනේ. ගරු සභාපතිතුමනි, කුඹුරුහේන නාවින්න ප්‍රදේශයේ අසරණ පවුලක් වෙනුවෙන් සත්සිත් භික්ෂු එකමුතුව විසින් ගෙයක් ඉදි කරනවා. ඒ කාර්යයට ඔබතුමාගෙන් සහයෝගයක් බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තමයි. ගිය සභාවේදි අපි කිව්වා නාවින්න ක්‍රීඩාපිටියට වීථි ලාම්පු ලබා දෙන්න. ඒක යථා කාලයේදී ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒක නිසා මේ දූෂණය වංචාව හොරකම නැති, සමෘද්ධිමත් රටක් බිහි කිරීමට සියලු දෙනාගේ සහයෝගය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි,  ගරු මන්ත්‍රීවරුනි, පළමුවෙන්ම මම මේවගේ ජාතිවාදී කොළයක් බෙදීම ගැන මගේ විරෝධය ප්‍රකාශ කරනවා. මේ වගේ අදහස් දරන පුද්ගලයෝ ඉන්න පුළුවන්. එකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි ජාතිවාදී හැඟීමෙන් කටයුතු කරන්න හොඳ නැහැ. දැනටත් මේ ඇවිල්ල තියෙන්නෙ ජාතිවාදය තමයි. මේ තත්ත්වය ඉතා කනගාටුදායකයි. සභාව තුළ මේ වගේ කටයුත්තක් සිදු නොවිය යුතුයි. මගේ පළවෙනි ප්‍රශ්නය තියෙන්නේ නැහිනිගල පාර සම්බන්ධව. පතිනායක මන්ත්‍රීතුමත් දන්නවා නැහිනිගල පාර කාපට් දානවද, කොන්ක්‍රීට් කරනවද කියලා මාතෘකාවට ගන්න එපා. පුලුවන් දවසක ඒක කෙරේවි. දැනට මේ වෙනකොට මේ පාර දොල කානුවක් බවට පරිවර්තනය වෙලා ඉවරයි. මම කියන්නේ සභාපතිතුමා විතරක් නෙවෙයි මේකේ වගකිවයුතු තවත් අය ඉන්නවා. අහිංසක ගම්වැසියෝ තුන් හාරසියයක් එකතුවෙලා, පිටපත් යොමු කරලා, අත්සන් කරලා පෙත්සමක් යවලා තියෙනවා. මම කිසිම කෙනෙක් නිදහස් කරන්නේ නැහැ. අභ්‍යන්තර

කටයුතු, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන, දකුණු පළාත් ගරු ප්‍රධාන ලේකම්තුමාට, පළාත් පාලන කොමසාරිස්තුමාට, දකුණු පළාත් ප්‍රධාන ලේකම්තුමාට, ප්‍රාදේශීය ලේකම්තුමියට, ගරු සභාපති තුමාට, පිටපත් යවලා තියෙනවා. ඊට අමතරව සභාවට හොඳ කළු වලාවක් ආවා. අපි හිතුව හොඳ වරුසාවක් වැහැලා, වැඩේ සාර්ථක වෙයි කියලා. නමුත් ඒක එතනින් ඉවරයි. පැය 24 ක් යන්න කලින් මේ සම්බන්ධ තොරතුරු ගත්තෙ ආණ්ඩුකාරතුමා. ඊට එහා කියන්න තැනක් නැහැ. නමුත් අද රට පත් වෙච්ච තත්වය මේකයි. හැම ලිපිගොනුවකටම ලිපියක් ගිහිල්ලා තියෙනවා. පාරේ වැඩ කරන අහිංසක කම්කරුවාගේ ඉඳලා මේ අත්සන් කරපු මිනිස්සු ඒ පාරෙ යන්නෙ. දැන් මාස 6කට ආසන්න කාලයක් කතා කරල තියෙනවා. නමුත් කිසිම කෙනෙකුට මෙහි අවශ්‍යතාවයක් නැහැ. පාර ගැන දැනෙන්නේ ගමේ මිනිස්සුන්ට, ප්‍රාදේශීය සභාව ඉන්න තමුන්නාන්සේලා අපට, සභාපතිවරයා හැටියට ගමේ පුද්ගලයෙක් හැටියට තමුන්නාන්සේට. කවුරු මේ වැඩේට අත නොගැහුවත්, සභාපතිවරයා හැටියට පක්ෂ-විපක්ෂ කිසිම කෙනෙක් මේ කර්තව්‍යයට විරුද්ධ වන්නේ නැහැ. ඒකට කීයක් හරි වියදම් ගියත්, මේක හදන්න සියලුදෙනාම එකඟ වෙනවා. මේ මොහොත වනවිට මේ හේතුවෙන් හතර දෙනෙක් රෝහල්ගත වෙලා ඇවිල්ලා ඉන්නවා. තුන් භාරදාහක් ගමන් කරන, වාහන දෙතුන් සීයක් දවසට යන, කර්මාන්තශාලා තියෙන මාර්ගයකට සිදු වුන දේ කාට කියන්නද? කාගෙන්ද මේ කටයුතු කරන්නේ කියලා මම කල්පනා කරනවා. අද මම ආවේ කටඹුරාවට ගිහිල්ලා ඒ රවුම් පාරෙන්. මම කියන්නේ පාර කොන්ක්‍රීට් කරන්න එපා. මෙන්න මේ කානු පද්ධතිය සකස් කරලා දෙන්න. එක ව්‍යාපාරිකයෙක් මුළු නැහිලිගලම යටකරගෙන ඉන්නවයි කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. අපි කෙතරම් ලිපි දැම්මත් පලක් නැහැ. මම අපේ සභාපතිතුමාට කනගාටුවෙන් වුණත් කියනවා ඔබතුමා මේ මොහොත වෙනකොට දුර්වලම සභාපතිවරයා හැටියට අපි දකින්නේ. මම පුංචි උදාහරණයක් කියන්නම්, මේකෙ විජේපාල මහත්තයා සභාපති පුටුවෙ ඉන්දෙද්දි ඌරල පහළ ජයවර්ධන පුට්ටු පාලමට එහායින් තියෙන යටලමත්තට වැටෙන පාර මම පළාත් සභාවෙන් සුනිල් සේනානායක මහත්මයගෙන් මුදල් වෙන් කර ගෙන පාලම සකස් කළේ. හැබැයි මේකට යන්න තියෙන්නෙ ශ්‍රී ලංකා පාක්ෂිකයෙකුගේ ඉඩමකින්. මේ පාලම දානකොට අඩි තුනේ පාර අඩි දහයක් බවට ඉබේම පත්වුණා. සභාව පටන් ගන්න පැයකට පමණ කලින් සාරියක් ඇඳගෙන පිස්සු වැටිච්ච කෙනෙක් වගේ දුවගෙන ආවා. මේ පාලම හැදුවොත් මම ගිනි තියා ගන්නවා කියලා කිව්වා. විජේපාල සභාපතිතුමා කිව්වා ඔහේ ගිනිතියා ගත්තත්, මට ඡන්දය නැතිවුනත් මේක ගමට අවශ්‍ය වැඩක්. අපි හෙට ඒ පාරට මුල්ගල් තියනවා. ප්‍රතිපාදන කාගෙන්ද කියලා වැඩක් නැහැ. ගමට අවශ්‍ය දෙයක් හැටියට මම තමයි ඇවිල්ලා මුල්ගල් තියන්නෙ. දැන් සියලු දෙනාම හිතාගෙන ඉන්නේ තමුන්නාන්සේ මේකෙන් දේශපාලනය කරනවයි කියන එක. ව්‍යාපාරිකයෙකුට මුලු ගමක්, ප්‍රදේශයක් යටවෙන්න දෙන්න එපා කියන අවසාන ඉල්ලීම මම ඉටු කරනවා.

ඊළඟට සමෘද්ධිය ගැනත්, මම ගියසැරේ සභා වාරෙදි කිව්වා. තව ටික දවසකින් සභාවට එනකොට සභාව ගිනි ගනී කියලා. දැන් වැඩක් කෙරෙනවා. මාතෘකාවක් දුන්නා. සමස්ත සමෘද්ධි නිලධාරීන්ට මම දෝෂාරෝපණය කරන්නේ නැහැ. පසුගිය කාලවකවානුව තුළ, මේ රටේ අවුරුදු විස්සකට ආසන්න කාලයක් අහිංසක සමෘද්ධිලාභීන් තමයි පෙරටු කරගෙන ගිහිල්ලා මහින්ද රාජපක්ෂ මහත්මයා ආණ්ඩු හැදුවේ. වනිගරත්න මන්ත්‍රීතුමා කියනවා ටී ෂර්ට් වලට මෙපමණ ගානක් වියදම් කරා කියලා. දවස් 52 ආණ්ඩුව හොරාට අරගෙන, හන්දියක් හන්දියක් ගානේ බෝඩ් ගැහුවා. කී දාහක් ගියාද කියල බලන්න. ඒ දවස්වල තමුන්නාන්සේලා ටී ෂර්ට් කඳවුරු බැඳගෙන හිටියෙ. අවුරුදු විස්සක් එක්සත් ජාතික පාක්ෂිකයෝ සමෘද්ධි බැංකු දිහා බලාගෙන හිටියා. උදාහරණයක් කියන්නම්, ඌරල පල්ලෙහා තියෙන එකම කටුමැටි ගහපු ගෙදර මනුස්සයට සමෘද්ධිය දීමට සුදුසු නැද්ද කියලා මම අහනවා. ප්‍රියන්ත ජයවර්ධන කියන මේ මනුස්සයා අවුරුදු විස්සක් පුරාවට සමෘද්ධිය නැතුව හිටියා. දරුවො හතර පස් දෙනෙක් ඉන්නවා. ඉන්නේ කටුමැටි ගහපු ගෙදර. ඒ වගේම මේ සම්බන්ධව අපෙත් අඩුපාඩු ඇති. තමුන්නාන්සේලා ඒවා පෙන්නල දෙන්න. අඩුපාඩු කියනවනම්

නිවැරදි කරවනවා. වැඩක් කරනකොට තමයි අඩුපාඩු වෙන්නේ. අපි කවදාවත් රාජ්‍ය සේවකයෙක් ඉන්නවනම් ඒ වගේ අයට සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න යන්නේ නැහැ. එහෙම තියෙනවනම්, තමුන්නාන්සේලා වගේම අපිත් ඊට එරෙහිව නැගී සිටිනවා. අවුරුදු විස්සක් පුරාවට අපේ මිනිස්සු දුක් වින්දා. කෙනෙහිලිකම් කළා. දැන් මේ කටයුත්ත කෙරෙනකොට ලක්ෂ හයකට සමෘද්ධි සහනාධාරය ලබා දෙද්දී, පවුලක සාමාජිකයන් තුන්දෙනෙක් බැගින් ලක්ෂ 18 ක ප්‍රමාණයක් ඉන්නවා. ජනාධිපතිවරණයට වැඩේ දුන්නොත් කියලා, ඊළඟට ඒකට ජාතිවාදී පත්‍රිකා බෙදනවා. ගරු සභාපතිතුමනි, මේ ජාතිවාදී ප්‍රශ්නය ගැන කතා කරනකොට, අපේ අම්මලා දැන් දරුවෝ හදන්නෙ නැහැ. ඉදිරියේදී පවුලකට ළමයි හතර දෙනකුට වැඩිය බිහිකරනවා නම් එක් පවුලකට මාසිකව රුපියල් එක්දාස් පන්සීයක් ලබා දීමේ ක්‍රමයක් අපි ප්‍රාදේශීය සභාවෙන් ආරම්භ කරමු. ඒ වගේම වෛද්‍ය ෂාෆි තනියෙන් නෙවෙයි මේ වැඩේ කළේ. ඒවට සිංහල හෙද නිලධාරිවරු, සිංහල වෛද්‍යවරුන්, සිංහල කම්කරුවන් ඉන්න ඇති. ඉතින් එතකම් මේ අය බලන් හිටියද? මේ කුමන්ත්‍රණය පිටිපස්සේ ඉන්නේ සිංහල ජාතියද, මුස්ලිම් ජාතිය ද, කියන එක වැඩක් නැහැ. ඒ නිසා අපි මේ වගේ දේවල් වලට මරණ දඬුවම දෙන්න ඕන කියලා යෝජනා කරනවා. මේක ඝාතනයක්. එහිදී මෙවැනි දෙයක් කරා නම් පාට පක්ෂ වැඩක් නැහැ. මිනිස් ඝාතනයට අපි විරුද්ධයි. ඒ වගේම මේ වෙනකොට පාසල් ටික ඇරලා, සමෘද්ධිය දෙනවා, යම් ගමනක් යන්න හදනකොට තමුන්නාන්සේලාට කරන්න දෙයක් නැහැ. මේ සභාවේ සෑම මන්ත්‍රීවරයකුගේ සෑම කොට්ඨාසයකට සංවර්ධන යෝජනා ඇවිල්ලා තියෙනවා. මේ ටික කරනකොට තමුන්නාන්සේලාට කරන්න දෙයක් ඉතිරි වෙන්නේ නැහැ. මේ මොහොත වෙනකොට මේ අර්බුදය නිසා සංවර්ධනය ටිකක් පස්සට ගියා. මේ අර්බුදයේ මේ දේශපාලන හස්තය පිටිපස්සේ හිටියෙ කවුද? අපේ රතන හාමුදුරුවන්ට මම අවසාන වශයෙන් කියනවා. රතන හාමුදුරුවෝ මිනිසුන්ගේ ජීවිත විනාශ වෙලා , අහිංසක අම්මලා අඩ අඩා ඉන්නකොට මේ වේදනාවක් මේ හාමුදුරුවන්ට ආවේ නැහැ. තුන් මාසේ දානේ දෙන්න කිට්ටුවෙනකොට රතන හාමුදුරුවන්ගේ හදවත උණු වුනා. ඊට පස්සේ තමයි මේ උපවාසය පටන් ගත්තෙ. මේ ප්‍රහාරයට පස්සෙන්දා නැත්නම්, හත් දවසේ දානය දෙන්න ඉස්සරවෙලා පල්ලිය ඉදිරිපිට මේ උපවාසය කලානම්, මුළු සමස්ත බෞද්ධ ජනතාවට පණිවිඩයක් දෙනවා. මාස ගණනක් ගිහිල්ලා දේශපාලනය කරපින්නා ගෙන එන හාමුදුරුනමක් හැටියට අපට රතන හාමුදුරුවන් පෙන්වා දෙන්න පුළුවන්. අපට මේක පිළිගන්න බැහැ. මම නිර්භයව කියන්නේ මේක නාට්‍යයක්. උන්වහන්සේ හොඳම නළුවා බවට පත් වුණා. දැන් ප්‍රශ්නයක් නැහැ. ඊළඟට මංගල ඇමතිතුමාට පමණක් නෙමෙයි මුළු සමස්ත බෞද්ධ ජනතාවටම ලැජ්ජයි. ඊයෙ හාමුදුරුවරු සිය ගණනක් මාතරදි සම්බන්ධ වුණා. ඉතින් ඒක නිසා මේ සංඝ ආඥාව පැය හතළිස් අටක් යන්න ඉස්සර වෙලා විනාශ වෙලා ගියා. එවැනි සමාජයක අපි ඇතට විසි වන එක නෙවෙයි තියෙන්නේ. අපි එකතු වෙන එක තමයි වෙන්න ඕන. ධර්මයෙන්, සද්භාවයෙන් ඒ කටයුත්ත කරනවා නම් ඕන කෙනෙක් ඊට ඇහුම්කම් දෙනවා. ඊට වැඩි දෙයක් කියන්න ගියොත් ඇහුම්කන් දෙන්නේ නැහැ. ඒක තමයි අද වෙලා තියෙන්නේ. ඒ පිළිබඳ වත් මතක් කරමින්, තමුන්නාන්සේලා කලබල වෙන්න එපා තව මාස හතරක් පහක් යනකොට සභා බල ප්‍රදේශයේ විතරක් නෙවෙයි. ලංකාවෙම පුංචි පුංචි පාරවල් ටිකත් කාපට් වැටිලා. ලස්සන වේවි. පාරවල් වල අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදුවේවි. ඒවගේම රැකියාවල් ලැබේවි. මේ මොහොත වන විටත් පත්වීම් ලබා දෙනවා. වැරදි නම් මම වචන ඉල්ලා අස්කරගන්නවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලේ, එක්සත් ජාතික පාක්ෂිකයෙක් වුනානම් ඒ නම් අයින් කරල දැම්මා. ඒකට උත්තරයක් දීගන්න බැරුව හිටියෙ. ඒවට උත්තර දෙන්න යනකොට ආණ්ඩුවෙ ආපස්සට කකුලෙන් අදිනවා. මේ හැමදෙයක්ම කුමන්ත්‍රණ. මේ හැම කුමන්ත්‍රණයක් පිටිපස්සෙන්ම රාජපක්ෂ මහත්වරු ඉන්නවා. පාසල වහවි කියලා හිතාගෙන පරණ බෝම්බ ටිකක් පාසල ළඟට ගිහින් තිබ්බා. මම මේ අවස්ථාවේ දී ත්‍රිවිධ හමුදාවට, පොලිසියටම පැය හතළිස් අටක් යන්න ඉස්සර වෙලා 60% කට එහා මෙය මර්ධනය කරපු නිසා ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම හෙට දවසට කරන්න පුළුවන් හැම සංවර්ධනයක් ම සිදු කරනවා. සමෘද්ධිය දිය යුතු අහිංසක මිනිස්සු

ඉන්නවනම් තොරතුරු මට දෙන්න. මම වගකීමෙන් බාරගන්නවා.  අපට පක්ෂ පාට භේදයක් බලන්නෙ නැහැ. අපි 31 වෙනිදා වනතුරු අභියාචනා භාර ගන්නවා. අපි දේශපාලනය කරල ලකුණු දාගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි ඒ අවශ්‍ය කටයුතු ඉටු කරනවා. ඒකෙ කිසිම තර්කයක් නැහැ. සමෘද්ධිලාභීන් හැටියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඉන්නවයි කියන එක මම පිළිගන්නේ නැහැ. ඒ නිසා එම ප්‍රකාශය මම තරයේ හෙළා දකිනවා. මම හිතන්නේ කවුරුත් එහෙම ගන්නෙ නැහැ. මේ ලිස්ට් එක අපි ගාව ඇත්තෙත් නැහැ. අපේ අග්‍රාමාත්‍යවරයා, අපේ රාජ්‍ය මැති ඇමතිවරු එන නිසා අපි එම උත්සවයට සහයෝගය දැක්වූවා. 14 වැනිදා මෙහෙ සමෘද්ධි ලබා දෙනවා. එතනදී අපේ මිනිස්සු එන නිසා අපි සහයෝගය දක්වනවා. දුප්පත්කමත් එක්ක දේශපාලනයේ අපි රැඳෙන්නෙ නැහැ. අවසාන වශයෙන් මම කියන්නේ මෙහෙම කෙනෙක් ඉන්නවනම් අපට කියන්න. අපි කරන්න පුළුවන් දේ කරනවා. ඒ වගේම වැරදි කෙනෙකුට ලබා දීලා තියෙනවා නම් ඒකත් අයින් කරනවා. රාජ්‍ය සේවකයකුට සමෘද්ධිය දීලා තියෙනවා නම් අපි දැනුවත් කරන්න.  ඔවුන්ට අපි කියනවා කරුණාකරලා ඉල්ලා අස්වෙන්න කියලා. ඒ වගේම අපේ ප්‍රදේශයේ ත්‍රීවිල් තියෙන හොඳ ආදායම් මට්ටමක් තියෙන මිනිස්සු සමෘද්ධිය ගන්නවා. ඒ සමෘද්ධිය කපන්න එපා. සමෘද්ධි නියාමක ගෙන්නලා ඒ බව අහන්න කියලා මම කිව්වා. අපේ මිනිස්සුන්ටත් ත්‍රීවීල් එකක් තිබුනට සමෘද්ධිය කපන්න ඕන නැහැ. නැත්නම් දෙගොල්ලන්ගෙම සමෘද්ධිය කපන්න ඕන කියන එක තමයි මම කිව්වේ. එතකොට අසාධාරණයක් නැහැ. මේ වෙනකොට එක පැත්තකින් රට සංවර්ධනය වෙනවා. අනිත් පැත්තෙන් අහිංසකයො ආර්ථික මට්ටමින් නැගී සිටිනවා. අන්න ඒකට ඉරිසියා හිතිලා තමයි හැමෝම කටයුතු කරන්නේ. අපි ඒ මිනිස්සුන්ට මෛත්‍රී කරන්න ඕන. මේ රටේ ආරක්ෂක ඇමති මේ ප්‍රහාරය ගැන දැනගෙන හිටියනම්, ඔහු ඉල්ලා අස්විය යුතුයි කියලා මම ගිය සභාවෙත් කිව්වා. මේ සභාවෙත් කියනවා. එහෙනම් තමුන්නාන්සේලා සියළු දෙනාටම මම මේ කතා කරපු දේවල්වලින් අන්තිම සාරාංශය තමයි අහිංසක දුප්පතුන් වෙනුවෙන් පාර සකස් කර දෙන්න කියා ඉල්ලා සිටිමින්, තමුන්නාන්සේ යම්කිසි තැනක හිරවෙලා ඉන්නවනම්,  එය පළුදු කරගෙන ඉදිරියට ඇවිත්, කටයුතු කරයි කියලා හදවතින් ප්‍රාර්ථනා කරමින්, තමුන්නාන්සේලා සියලු දෙනාට ජය ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මුලින්ම කියන්න ඕන. මේ ජාතිවාදී කියලා මේකට විරුද්ධයි කිව්වට, මම නම් සිංහලයෙක්, බෞද්ධයෙක් හැටියට මේකට විරුද්ධ නැහැ. මොකද ඒ මුස්ලිම් ජනතාවට ඒ හැමදේම පුලුවන්නම්, අපිත් සිංහල බෞද්ධයෙක් හැටියට ඇයි අපට මේවා බැරි. මේක මගේ පෞද්ගලික මතය.  මම නම් මේවට විරුද්ධ නැහැ. මම මුලින්ම ගරු සභාපතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මොකද සභාව සතු ඉඩම් කිහිපයක් පහුගිය දවස්වල පවරා ගැනීමට කටයුතු කළා. ඒ වගේම තමයි සත්සිත් භික්ෂු එකමුතුවෙන් හදලා දෙන නිවස ගැන පහුගිය ටිකේ සිදුවුන දේවල් මම නොදැනුවත් වුණාට, මට තමයි හැකියාව ලැබුණේ ඒ ස්ථානය පෙන්නලා දෙන්න. අපි යම් ආධාර මලු වගයක් ගෙවල් වලට බෙදන අවස්ථාවේදී තෝරා ගත් නිවසකට ප්‍රමුඛතාවය දෙන්න තමයි මම කතා කරලා එතන තෝරාගත්තේ. අද ඇහුවම මට ගොඩක් සතුටුයි. මොකද ඒ දේ සිදුකරනවා නම් අපිත් ඕන උදව්වක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අපේ සහබන්දු මන්ත්‍රීතුමාටයි, වනමල් මන්ත්‍රීතුමාටයි බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මොකද සභාව පටන් ගත්ත දවසේ ඉඳලා එක දවසක් නෑර අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාව මතක් කළා. අපටත් අමතක වුණු වෙලාවල් තිබුණා. නමුත් ඒ දෙපළ හැමදාම එතුමා මතක් කරනවා. අනිත් එක තමයි රතන හාමුදුරුවො ගැන කතා කළා. දැන් ඒ හාමුදුරුවෝ සමහර අයට වැරදි වුනාට, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලනය පෙරළා දමලා, මේ ආණ්ඩුව පත් කරන්න මැදිහත් වුන ප්‍රධාන පුද්ගලයෙක් හැටියට තමයි ඒ හාමුදුරුවෝ නම් කරන්න පුළුවන්. නමුත් ඒ හාමුදුරුවන්ගේ යම්කිසි අයිතිවාසිකම් දිනාගන්න , ජනතාව වෙනුවෙන් මොන

විදිහකින් හරි ඒ පත්කරපු උදවියටත් මාරාන්තික උපවාසයක් කරන්න සිදුවුණා. එතකොට රටේ අනෙක් සාමාන්‍ය ජනතාවට මොනවගේ තත්ත්වයක්ද කියලා හිතාගන්න පුළුවන්.

ඊලග එක තමයි සභාපතිතුමනි, සමෘද්ධිය ගැන කතා කරන්නේ නැහැ. මොකද එතන ප්‍රශ්න තියෙනවා. සාධාරණද අසාධාරණද කියලා ටික දවසක් යනකොට ඔබතුමාලටම ඒ පාක්ෂිකයන්ගෙන්ම දැනගන්න පුළුවන් වෙයි. ඔබතුමාලා ලක්ෂ 18ක ටාගට් එකකට තමයි යන්නේ. ඒ ගැන බොහොම සන්තෝෂයි. ඊළඟට අපි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා, අලුත් පහල ඔබතුමාගේ බල ප්‍රදේශය තුල තව පානීය ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. ඒක නිසා දැනගැනීම සඳහා ඇහුවෙ. ඒ වගේම අපේ කොට්ඨාසයේ ගරු මන්ත්‍රීතුමිය චන්දිමා මහත්මියට නව රැකියාවක් ලැබිලා තියෙනවා. මම හදවතින්ම එතුමියට සුබ පතනවා. දේශපාලනය මොනවා වුණත්, ඒවා අදාළ නැහැ. වෙන කිව යුතු දෙයක් නැහැ. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් ,ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනා සිහිපත් කරමින්, මම මුලින්ම ගරු සභාපති තුමාට සිහිපත් කරනවා. මාපලගම පොදු බස් නැවතුම්පොළේ ඉදී කිරීමට බලාපොරොත්තු වන වැසිකිළි කැසිකිළි පද්ධතිය පිළිබඳව. වසර ගණනක් තිස්සේ මේ සභාවේ ඒ ගැන කතා කළා. මේ වෙලාවේ වත්මන් රජයේ නව වැඩපිළිවෙළ යටතේ මෙවර අයවැයෙන් ඒ සඳහා අවස්ථාව ලැබිලා තියෙනවා. නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය, එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක, සජිත් ප්‍රේමදාස මැතිතුමන්ගේ අමාත්‍යාංශය හරහා මිලියන දහයක් වෙන් කර පොදු වැසිකිළි කැසිකිළි පද්ධතිය මේ වගේ පොදු ස්ථානවල ඉදිකරන්න බලාපොරොත්තු වෙලා තියෙනවා. ඒ සඳහා සභාවට අවශ්‍ය ලේඛන එවලා තිබුණා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මේ කටයුත්ත මේ අවුරුද්දේ වත් අපි කරන්න බලමු. මොකද බලමු කියලා හරියන්නේ නැහැ. අනිවාර්යෙන් කරන්න ඕන. මොන බාහිර බලපෑම් ආවත් මම එදා ඉඳලා හැමදාම මේ කටයුත්තේදී කෙලින් හිටියා. කොහොමහරි මේක මාපලගමට අවශ්‍ය දෙයක්. මොකද අපි නිතර දෙවේලේ මාපලගම මංසන්ධියේ ගැවසෙන පුද්ගලයෙක් හැටියට අපට තමයි ප්‍රදේශයේ මිනස්සු විවිධ අවස්ථාවන් වල දී විවිධ දේවල් කියන්නෙ. අපි කොහොම හරි මේ කටයුත්ත කරගන්න මගේ සහ අපේ ප්‍රදේශයේ සියලු දෙනාගේ උපරිම සහයෝගය ඔබතුමාට ලබල දෙනවා. ඔබතුමාගේ පැත්තෙන්, සභාව පැත්තෙන් කෙරෙන්න ඕන කටයුතු ටික ඉෂ්ට සිද්ධ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ගිංගඟ ආශ්‍රිතව අපේ ප්‍රියන්ති මන්ත්‍රීතුමිය කිව්ව වගේ තොටුපළවල් ප්‍රතිසංස්කරණය කරන්න ගිය සභාවේ කතා කළා. අපේ කාර්මික නිලධාරි මහත්තුරු කීපදෙනෙක් මාපලගම මංසන්ධියෙ තියෙන ගල්වානෙ ගෙදර තොටුපළ සහ එහා පැත්තෙ තියෙන තොටුපල නිරීක්ෂණය කරන්න ගියා. ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරලා ඉක්මනට ඒ කටයුත්ත කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මුලන වාඩිය කන්ද පාර කොන්ක්‍රීට් එක අබලන් වෙච්ච දෙපළක් ගැන මම සභාවාර කීපයකදීම මතක් කළා. මේ දවස්වල පාර හෝදගෙන ගිහිල්ලා කොන්ක්‍රීට් එකක් කැඩිලා යන තත්ත්වයට උදාවෙලා තියෙනවා. අපි ඒ කොන්ක්‍රීට් පාර ආරක්ෂා කරගන්න ඕන. ඒ බව නැවත වාරයක් ඔබතුමාට මතක් කරනවා.

ඒ වගේම සමෘද්ධිය පිළිබඳ කතා කළා අපේ පියල් මන්ත්‍රීතුමා කතා කළා. මේ සමෘද්ධිය සමීක්ෂණ කටයුතු කළේ සමෘද්ධිලාභීන්ගේ අයදුම්පත් අරගෙන ප්‍රදේශීය ලේකම් කාර්යාලය හරහා ඒ වගේම සමෘද්ධි සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, කෘෂි ව්‍යාපෘති නිලධාරි මේ හතර දෙනාම ගෙවල්වලට ගිහිල්ලා, ඒ ගෙවල්වල තියෙන වත්කම් පිළිබඳ සමීක්ෂණය කරලා, ඒ

අනුව තමයි ලේඛන සකස් කළේ. මේ සමෘද්ධිලාභීන් තෝරාගත් ක්‍රමය ගැන ඔබතුමන් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට සමාජයට වැරදි වැටහීමක් දෙන්න එපා. රජයේ නිලධාරීන් හරහා තමයි මේ සියළු දේ කළේ. රජයේ නිලධාරින්ගේ ලයිස්තුවට තමයි සමෘද්ධි නියාමක මහත්ම මහත්මීන් ඒ වගේම අනිත් අයගේ නිර්දේශ මත තමයි ඒ කටයුතු කළේ. හැබැයි මම කණගාටු වෙනවා මේ වෙලාවේ මගේ කොට්ඨාශයේ මගේ දේශපාලන කටයුතුවලට ක්‍රියාකාරීව වැඩ කරපු මිනිසුන්ටත් සමෘද්ධිය නැත කියලා දාලා තියෙනවා. ඉතිං අපට නෑ කියලා දාලා තියෙනකොට දෙන්න පුළුවන්කමක් නැහැ. ඉතින් මේ වගේ අසාධාරණකම් එක්සත් ජාතික පාක්ෂිකයන්ටත් සිදුවෙලා තියෙනවා. අපි මේක දේශපාලනිකව හදපු ලයිස්තුවක් නෙවෙයි. මේකෙ අසාධාරණයක් වුණා නම් අවුරුදු විස්සක් තිස්සේ මේ පිළිබඳ බලාපොරොත්තු තියාගෙන හිටපු එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයින්ට තමයි ඒ දේ වෙලා තියෙන්නේ. සමෘද්ධියෙ යථාර්ථය ඕක. ඉදිරියේදී තවදුරටත් නිවැරදි කරගන්න බලාපොරොත්තු වෙනවා මම සියලු දෙනාටම තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙදි පළමුවෙන්ම මම අපේ සභාවේ ආදායම් තියෙන පොළවල් සම්බන්ධයෙන් කතා කළ යුතුයි. මොකද අපේ සභාවේ ආදායම රැඳී පවතින්නේ මේ පොළවල් කිහිපය මත. ඒ නිසා අපි මේකෙ පක්ෂ විපක්ෂ සියළු දෙනාගේ සහ සභාවේ කාර්ය මණ්ඩලයේ විශේෂ වගකීමක් වෙනවා. මේ පොළවල් පිළිබඳව මීට වැඩිය අවධානයක් යොමු කරලා, මේ සඳහා යම් වැඩපිළිවෙළක් හදාගන්න ඕන. මොකද අපට ලැබෙන ආදායම් තත්ත්වය දිහා බැලුවම ඉතාමත් අඩු ආදායම් තත්වයක් තමයි අපේ සභාවට ලැබෙන්නේ. ඒ නිසා මම අපේ ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. මේ සඳහා විශේෂ වැඩපිළිවෙළක් සූදානම් කරන්න කියලා. ඒ වගේම තල්ගස්වල පොළ පිළිබඳව සභාපතිතුමා සමග මේ සභාවෙන් පස්සේ මට යමක් කතා කරන්න තියෙනවා. ඒක මේ වෙලාවේ ප්‍රසිද්ධියේ කතා කරන්න බැහැ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න ඕන.

ඒ වගේම උඩවැලිවිටිය මාර්ගය සම්බන්ධයෙන් මම අපේ පක්ෂ විපක්ෂ මන්ත්‍රී තුමන්ලට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මොකද මෙම නඩුව නිසා මම ඉතාමත් අසරණ තත්වයකට පත්වෙලා තියෙන්නේ. මමත් රජයේ සේවකයෙක් හැටියට වැටුපකින් මාසේ ජීවත් වෙන්නේ. ඒ නිසා වෙනත් ආදායම් අපට නැහැ. ඒ තුළදී මේ වගේ විශාල වියදමක් කිරීම මට ලොකු පීඩනයක් බවට පත්වෙලා තියෙනවා. ඒ වෙනුවෙන් සභාවෙන් කළහැකි දෙයක් තියෙනවනම්, ඒ දේ ඉටු කරන්න කියලා සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපිට සභාවේ කතා කරන්න අකමැතිම දෙයක් තමයි. අපේ සේවකයන් සම්බන්ධයෙන් සභාපතිතුමා යම් වැඩපිළිවෙළක් අරගෙන තියෙනවා. නමුත් අපි අපිම ස්වයං විවේචනයක් කරගෙන මේ කටයුතු සාර්ථක කර ගන්න ඕන. ඒ නිසා මේ වෙලාවෙදි මම කියන්නේ ගිය මාසේ 4 වෙනිදා උසාවියේ නඩුව ඉවර වෙලා මේ සභාවට පැමිණි අවස්ථාවේදී, අපේ ගරු සභාපතිතුමා විශේෂ රැස්වීමකට සහභාගි වෙලා හිටියා. කාර්යය මොකක්ද කියලා දන්නේ නැහැ. නාගොඩ පොලිසියේ උප පොලිස් පරීක්ෂක, අපරාධ අංශයේ ස්ථානාධිපතිතුමා මෙතන බොහොම සද්දෙට කතා කළා. මොකද සභාවෙ පුටුවල කවුරුවත් නැහැ කියලා චෝදනා කළා. මම අපේ ගරු ලේකම්තුමියගේ ඉල්ලීම කරන්නේ. සභාපතිතුමාට සභාව සෑම කටයුත්තක්ම කරගෙන යද්දී, ඔබතුමියට වගකීමක් තියෙනවා. මේ නිවාඩු සම්බන්ධයෙන්, ඒ වගේම කාර්යාලයේ නිලධාරීන් රැඳී සිටීම සම්බන්ධයෙන්, මීට වැඩිය දැඩි ක්‍රියාමාර්ගයක් අරගෙන ඒ කටයුතු සිද්ධ කරන්න. ඒ අවස්ථාවේ මම හිටපු නිසා දැක්කෙ. කාර්යාලය තුල සියලු දෙනා අවිධිමත් බැහැර යාමක් සිදු වුණා. ඒ කෑම වෙලාව ඒක නිසා අපට මොකුත් කියන්න බැහැ. නමුත් මෙතන මොනවහරි වැඩපිළිවෙළක් ඇති කරලා තමයි ඒ කටයුතු කරන්න ඕන. අපේ මේ නිලධාරීන් සියලු දෙනා වැඩ කරන්නේ නැත්තේ නැහැ. මේ සියලු

නිලධාරීන් වැඩ කරන නිසා මේ නිලධාරීන්ට දොස් කියන්නේ නැහැ. අපි හැමවෙලාවෙම මී ක්‍රමවේදයකට සංවිධානාත්මක විදිහට කාර්යයන් කරන්න ඕන. මොකද මේ ආයතනයේ නිතරම මහජනයා ගැවසෙන, මහජනයා හා නිරන්තරයෙන් ගැටෙන තැනක් හැටියට හඳුන්වන්න පුළුවන්. ඒ වගේම ජනතාවගේ කාර්යභාරය උපරිමයෙන් ඉෂ්ට කළ යුතු නිසා කම්කරුවන් සම්බන්ධයෙන් සභාපතිතුමා යම් වැඩපිළිවෙළක් අරගෙන යනවා. ඒ සඳහා අපෙන් උපරිම දායකත්වය ලබා දෙමින් කටයුතු කරනවා. ඒ වගේම වීථි ලාම්පු සම්බන්ධයෙන් මේ ගරු සභාවේ තිබ්ච්ච අඳුරු මතය මැකිලා ගියා ඒ සේවක මහත්වරු තුන් දෙනෙක් ඒ කටයුත්ත දැන් 80% ක් විතර මේ කාර්යය කරලා තියෙනවා. ඒ නිසා ඔවුන් තවත් දිරිමත් කළ යුතු වෙනවා. ඒ රියදුරු මහත්තයත් ලයිට් හදන්න ඉනිමඟ කරේ තියාගෙන යනවා. මගේ කොට්ඨාශයේ රාත්‍රී 08.30 වෙනකම් ලයිට් හදලා එක දවසින් විදුලි පහන් ටික සම්පූර්ණ කළා. මමත් ඔවුන් සමග කණුවෙන් කණුවට ගිහිල්ලා ඒ කාර්යය ඉෂ්ඨ කළා. අපි පක්ෂ පාට භේද බැලුවෙ නැහැ. එම කාර්යය මණ්ඩලය ආදර්ශයට අරගෙන තමන්ගේ කටයුතු කරනවා නම් මීට වැඩිය අපට සභාවෙන් ලොකු සේවාවක් ලබා ගැනීමේ හැකියාවක් තියෙනවා.

කාල වේලාව කෙසේවෙතත් ස්තුති කරන්න ඕන පුද්ගලයන්ට ස්තූති කරන්න ඕන. මොකද අපි මේ රටේ වත්මන් අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉතාම දූරදර්ශී නුවණක් තියෙන ඇතිව ක්‍රියා කරන පුද්ගලයෙක්. ඒ නිසා රැකියා දස ලක්ෂයක් දෙනවා කිව්වා. අපේ අම්මා තාත්තට පාසල්වල රැකියාව ලබා දීලා තියෙනවා. පඩි නැතිවුනත් රැකියාවක් දීලා තියෙනවා. ඒ පිළිබඳ අපි සතුටු වෙනවා. එසේම මේ වෙලාවෙදි ගෙවල් වල රත්තරං ගොඩ ගැහුවත් වැඩක් නැහැ. අම්මයි තාත්තයි ගෙදර සමගි නැත්නම්, දරුවන් නන්නත්තාරේ යනවා. ඒ වගේ තමයි අපේ රටට වෙලා තියෙන්නේ. මේ රටේ අනාගතය වෙනුවෙන් තමයි මේ සියලු දෙනා සෙල්ලම් කරන්නේ. කවුරු මොනවා කතා කළත්, මේක ඇදගෙන යන තැන කොතැනද කියන එක අපට කියන්න බැහැ. ලක්ෂ 6කට නෙවෙයි ලක්ෂ දහයකට සමෘද්ධිය දුන්නත් අපි ඒකට විරුද්ධ නැහැ. නමුත් මේ රටේ ආර්ථිකය පිළිබඳ කල්පනා කරන්න ඕන. අපි අපි ආඩම්බරයෙන් කතා කළා. තවත් අය සමෘද්ධිය පිළිබඳ විවේචනය කරනවා. සමෘද්ධිය දීම පිලිබඳ සත්‍ය තොරතුරු මම පසුව කියන්නම්. ඒ නිසා මේ වෙලාවෙදි සඳහන් කරනවා මේ යන්නේ කොරහත් බිඳගෙන. මොකද ලක්ෂ 6 කට සමෘද්ධිය දෙනවා කියන්නේ අපේ රටේ කෘෂිකර්මාන්තය, කුඹුරු ටික, හේන් ටික ඒ වගේම රටේ තියෙන ආදායම් මාර්ගය සියල්ලම අඩපණ වෙනවා. අපි මේ ණය අරගෙන ජීවත් වෙන මිනිස්සුන්ට කන්න දීලා මිනිස්සු වැඩක් පලක් කරන්නැතුව ඉන්නවා. පාරවල් දිහා බැලුවම අද පාරක යන්න බැහැ. පොදු කටයුතු ආණ්ඩුවෙන් කරන්න ඕන එහෙම නැත්නම් ප්‍රාදේශීය සභාවෙන් කරන්න ඕන. ගමේ මනුස්සයාට ඒ ගැන කිසි හැඟීමක් නැහැ. ඒ වගේ ආත්මාර්ථකාමී සමාජයක් බිහි කරන එක තමයි වෙලා තියෙන්නෙ. මේ හැමෝටම රජය වන්නේ වෙන්න බැහැ. එක කණ්ඩායමයි රජය වෙන්නේ. ඒ කණ්ඩායම ඉතාමත් දූරදර්ශී වෙන්න ඕන. ඒ වගේම අනාගත පරපුරත් එක්ක තමයි සෙල්ලම් කරන්නේ. ඒ වගේම සමෘද්ධිය මාසයක් දීලා නවත්තන්න බැහැ. ඉදිරි කාලය තුළ දෙන්න ඕන. ඊළඟ රජයෙන් සමෘද්ධිය කැපුවා ගමන් පලි ගත්ත කියලා කියනවා. ඒ නිසා මේ සමෘද්ධිය දීලා බලන්නකෝ මොකද වෙන්නේ කියලා. අද සියලු නීති උල්ලංඝනය කරමින් දිළිඳු සහන පනත උල්ලංඝනය කරමින්, ඒ වගේම ප්‍රාදේශීය ලේකම්ගේ ලයිස්තුව එක් ස්ථානයකට ගිහිල්ලා ආසන සංවිධායක ළඟට ගිහිල්ලා, ඒ විදිහට තමයි මේ සමෘද්ධිය ලියන්නෙ. මම මේවා වගකීමෙන් කියන්නේ. අපි මේ එක්සත් ජාතික පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට දොසක් පවරනවා නෙවෙයි. නමුත් මේ යන ක්‍රමවේදය, වැඩපිළිවෙළ වැරදියි. මේක නිවැරදි මාවතට නොවැටුනොත් ඊළඟට මේකෙ මේ ආණ්ඩුවක් හදන්න නම් මිනිස්සුන්ට සහන දෙන්න ඕන. මේක එක්සත් ජාතික පාක්ෂිකයන්ට විතරක් දීලා ආණ්ඩුවක් හදන්න පුළුවන්ද? ඒ වගේම තෙල් සූත්‍රය දහවැනිදා වෙනකොට ක්‍රියාත්මක වෙනවා. මිනිස්සුන්ට සහනයක් දෙනවා නම් ඇයි මෙහෙම තත්වයක් ඇති වෙන්නේ. දැන් මිනිස්සුන්ට ගොඩක් අමාරු කාලයක් තියෙන්නෙ. සමහර ගෙදරක එක වේලක්

කාලා බඩගින්නෙ ඉන්න තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒකට මේ රජය විතරක් නෙවෙයි සියළු රජයන් වගකිව යුතුයි. ඒ වගේම අපේ මන්ත්‍රීවරු සඳහන් කර සිටියා. ඉදිරියේදී මේ රට සැණකෙළියක් වගේ වෙයි කියලා. පාරවල් කාපට් කරනවා, කොන්ක්‍රීට් කරනවා. නමුත් මම දකිනවා එතනත් වැරදි පූර්වාදර්ශයක් තියෙනවා. මොකද මේ මන්ත්‍රීවරු කවුරු කලත්, මොන ආණ්ඩුවෙන් කලත්, මේ වැඩපිළිවෙල ගැන ඒ වැඩපිළිවෙළේ ඇමතිවරයා දන්නෙ නැහැ. මොකද ඒකට හේතුව ඇමැතිවරයා ගමේ මන්ත්‍රීවරයාට තමයි මේ වැඩේ පවරන්නෙ. මන්ත්‍රීවරයා ප්‍රධාන පාරවල් ටික අත්හැරලා, ගෙවල් දෙක තුනකට යන පාරවල් පිළිබඳ තමයි අවධානය යොමු කරන්නේ. ප්‍රධාන මාර්ගයන් පිළිබඳ සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. ගමේ ප්‍රධාන මාර්ගයන් ටික සකස් කරන්න කියලා මම ඉල්ලීම් කරනවා. ගරු සභාපතිතුමනි, මේවා අනුමත කරළා යවද්දී ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න. උදාහරණයකට උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල සාමාන්‍යයෙන් ප්‍රධාන පාරක්. අද වෙනකොට පාර මඩ වෙලා තියෙනවා. නමුත් ගරු පියසේන ගමගේ ඇමතිතුමා දෙන්නෙක් තුන්දෙනෙක් යන පාරවල් වලට ලක්ෂ දහයක් දාලා සකස් කරලා තියෙනවා. කවුරු සල්ලි දාලා කළත් ඔබතුමාලට ලකුණු වැටෙන වැඩපිළිවෙළක්. ඒ නිසා මේ ප්‍රධාන පාරවල් කෙරෙහි අවධානය යොමු කරන්න. මේ රජය මගින් මොනවා දුන්නත්, රත්තරන් ගොඩවල් ගැහුවත් මේ රජයේ තේරීම් කාරක සභාවක් පාර්ලිමේන්තුවේ දාලා, ප්‍රධානම ආණ්ඩුවෙ පත් කර ගත්ත කෙනා විවේචනය කරනවා. මේ වගේ වැඩ වන විට මොනව දුන්නත්, මිනිස්සු බලන්නේ මේ රටේ ආරක්ෂාව ගැන. අපේ මිනිස්සු ඉතාම බුද්ධිමත්. අපි අනිවාර්යෙන් අනාගතයේදී මේ රටට පැහැදිලි හොඳ නායකත්වයක් ගන්න පුළුවන් කණ්ඩායමක් ඒවි. මොන පක්ෂයෙන්ද කියලා මට අදාල නැහැ. නමුත් මේ රටේ අනාගතය වෙනුවෙන් අපි එහෙම කරන්න ඕන. එවගේම මේ සභාවේ වාර්තාගත වෙනකොට නීත්‍යානුකූල වෙන්න ඕන. ඒවගේම හැම කෙනාගෙම අඩුපාඩුවක් දකිනවා. මේ සභාවේ ආධිපත්‍යය තියෙන්නේ සභාපතිතුමාට. ඒ නිසාම සභාවේ අවසර ගැනීම මූලාසනයෙන් පමණයි විය යුත්තේ. හැමකෙනාම ආපු මන්ත්‍රීවරුන්ගෙන් හැමෝගෙන්ම අවසර ගන්නවා. සමහර වෙලාවට වාර්තාවෙහි සඳහන් වුනොත්, මේක නිවැරදි වාර්තාවක් නොවෙන්නත් පුළුවන්. ඒ නිසා ගරු මන්ත්‍රීවරුන්ට මම ඉල්ලීමක් කරනවා. පළාත් පාලන පනත අනුව අපට අවසර ගන්න තියෙන්නෙ සභාපතිතුමා ගෙන් පමණයි කියන එක සිහිපත් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපේ මේ පත්‍රිකා දීපු මන්ත්‍රීතුමා නොගිහින් පොඩ්ඩක් හිටියනම් හොඳයි. ඔබතුමා මේ පත්‍රිකා දීලා තියෙන්නේ මොකද, අපි මේකට විරුද්ධව කතා කරනකොට, අපේ සමහර මන්ත්‍රීවරු මොකද මේක සභාවේදී දුන්නෙ කියලා හිතනවා. මම නම් මේකේ වැරැද්දක් දකින්නෙ නැහැ. මොකද මුස්ලිම් අය මේ රටට කරන විනාශයත් එක්ක ඒක දැනුවත් කිරීමක් තමයි මෙතන තියෙන්නෙ. ඒ වගේම අපේ සිංහල මිනිසුන්ව දැන් ගබ්සා කිරීම් කරනවා. අපට වඳ බෙහෙත් දෙනවා කියනවා. ඒවා අහුවෙච්ච ස්ථාන තියෙනවා. ඉතින් මෙතන යම් වරදක් තියෙනවා. අපි පහුගිය කාලේ මේ නිෂ්පාදන වලින් වැලකෙන්න කියලා දැනුවත් වීමක් සිදුවුණා. එම පත්‍රිකා සභාවේ බෙදපු නිසා තමයි මමත් ඒ පිළිබඳ කතා කළේ.

ඊළඟට මම මේ වෙලාවේ සිහිපත් කරන්න ඕන. විශේෂයෙන්ම අපේ නන්දන මන්ත්‍රීතුමා හොඳ ප්‍රකාශයක් කළා. මොකද මමත් හැමදාම කියන දෙයක් තමයි අපේ බල ප්‍රදේශයට අදාළ වන දේවල් කතා කරනවා නම් තමයි වැදගත් වෙන්නෙ කියලා. ඇත්තටම මම ඒ පිළිබඳ සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, මමත් අනවශ්‍ය කිසිම දෙයක් කතා කරන්නේ නැහැ. ඊයෙත් මම ඔබතුමාට සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට දුරකතනයෙන් කතා කරලා, අපේ ප්‍රදේශයේ සිදුවන කරදරයක් ගැන සඳහන් කළා. ඒවගේම මම ඊයෙ අධිකාරීතුමා හමුවෙන්න ගිහිල්ලා මේ ගොම ප්‍රශ්නය පිළිබඳව කතා කළා. තල්ගස්වල ඉඳන් මග දිගටම ගොම වැක්කිරිලා තියෙනවා මම දැක්කා. ඊයේ

දවස ඇතුලත ලොරි අටක් අපේ පාරේ ගොම ගෙනිහින් තියෙනවා. මෙම ගොම ගෙනිහින් ගබඩා කරන ස්ථානය, අපේ ප්‍රදේශයේ ඇළ මාර්ග වලට සම්බන්ධ වෙනවා. මෙම අපද්‍රව්‍ය ඇළ මාර්ග වලට සෝදාපාළු වෙනවා. ඒ වගේම ඒ අතර තියෙන නිවෙස් කිහිපයකටම විශාල හානියක් බවට පත්වෙලා තියෙනවා. ඒ තුළින් ඇතිවන මැස්සන්ගෙ දුහද, ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙනවා. මම ගිය ඉරිදා මෙතනට ගිහිල්ලා බැලුවා. වත්තෙ මහත්තරුන්ට කතා කරලා මේ ගැන කිව්වා. සභාපතිතුමාටත් කිව්වා. මම ගත්ත තීරණය තමයි මෙය නැවත සිදුවෙනවා නම්, එක ලොරියක් අරගෙන ගිහිල්ලා ඒ ඉන්න මහත්තයාගේ ගෙදර මිදුලේ දානවයි කියලා මම එයාට කිව්වා. මොකද එහෙම තත්ත්වයකට පත්වෙන්න සිදු වෙන්නේ මේවට ඇහුන්කන් දෙන්නෙ නැති නිසා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරලා, කාබිල් එකේ අන්නාසි කැල්ල තියන තැන නැවත ගොම බෑමට අවස්ථාව ලබාදෙන්න එපා කියන ඉල්ලීම කාරුණිකව සිහිපත් කරනවා.

ඒ වගේම විදුලි පහන් ගැන කතා කලා. ඇත්තටම සතුටුයි. මොකද මුල්ම වකවානුවේ ඔබතුමා ලොකු ප්‍රශ්නයකට මැදි වෙලා හිටියෙ. මොකද හැම කෙනාටම විදුලිය ලබාදීම පිළිබඳව. මුල්ම අදියරේ අපේ විහාරස්ථානයේ පින්කමක් සඳහා සියලු විදුලි පහන් අළුත්වැඩියා කළා. නමුත් එක් නිවසකට අකුණු සැරක් වැදිලා එතන තිබුණ වීපී පහන් 5ක් පිච්චිලා ගියා. ඒ ඔබතුමන්ලා අළුත්වැඩියා කරපු විදුලි පහන්. අපේ ප්‍රධාන ලිපිකරු මිස්ගෙ නිවස ළඟ ඉඳලා එහාට වෙන්න තමයි එම ලාම්පු පිච්චිලා තියෙන්නේ. ඒ ටිකත් අලුත්වැඩියා කරලා දෙන්න කියලා මම සිහිපත් කරනවා.

ඒ වගේම අද මෙතැනදී වාහන පිළිබඳව කතා වුණා. වාහන වල නඩත්තුව පිළිබඳව එක එක අවස්ථාවලදී කතාවට ලක් වෙනවා. මම හිතන්නේ මම මේ කියන යෝජනාව දැනටත් ක්‍රියාත්මක වෙනවා ඇති. ඒ වුණත් අඩුපාඩුකම් තියෙන හින්ද තමයි ප්‍රශ්නයක් ආවම අපට නිසියාකාරව උත්තරයක් ලබා දෙන්න බැරි වෙන්නෙ. මේ හැම වාහනයකටම නඩත්තු ෆයිල් එකක් ඇති. නමුත් ඒක නිසියාකාරව සිදුවෙනවා නම් කිලෝමීටර් 9000 වගේ ගානක් දුවනකම් ඒ වාහනේ ගියා කියන්නේ ඒ වාහනය බ්‍රෑන්ඩ් නිව් හම්බුවෙච්ච වාහනයක්. කිලෝමීටර් කීයකින්ද නැවත ඒවා සර්විස් කරන්න ඕන කියන එක රියදුරු මහත්වරු දැනුවත් වෙලා ඉන්නවද? නැද්ද? එහෙම නම් ඔබතුමාට මම කියනවා, ඒ සියලුම රියදුරු මහත්වරු ගෙන්නලා, ඒගොල්ලන්ව දැනුවත් කිරීමක් කරන්න. ඒ කිලෝමීටර 9000 ක් වාහන දුවනකම්, ඒ රියදුරු මහත්වරුන් ඒ වාහනයට ආදරයක්, කරුණාවක් දක්වනවද කියලා තමයි ප්‍රශ්නෙ. ඒ වගේම ඒ වාහනයට අදාළ නඩත්තු ෆයිල් එකක් තියෙනවනම්, අපේ බන්ධුල මන්ත්‍රීතුමා සිහිපත් කළා වගේ, මේ සේවා කාලයේදී දාන ෆිල්ටරයේ නොම්මරයක් තියෙනවා. ඒ නොම්මරෙත් එක්කම ලියල තියන්න. ඊළඟ සේවා කාලෙදි ඒ ෆිල්ටරයත් ගෙන්නලා බලන්න ඕනේ. ඒ ෆිල්ටරයමද අපට ලැබිලා තියෙන්නේ, එහෙම නැත්නම් වෙනත් ෆිල්ටරයක් අපට ලබාදුන්නද කියලා. ඒ වගේ පහසු ක්‍රම තියෙනවා. ඒ නිසා ඒ වගේ දේවල් කරගෙන, ඔබතුමාගේ, අපේ පහසුව තකා එසේ කටයුතු කරන්න කියලා මම කාරුණිකව සිහිපත් කරනවා.

ඊළඟට සමෘද්ධිය ලබාදීම පිළිබඳව කතා කලා. නමුත් ඒ කිවයුතු දෙන්නම මෙතන නැහැ. මොකද සහබන්දු මන්ත්‍රීතුමා සහ වසන්ත මන්ත්‍රීතුමා ඉන්නම ඕන. නමුත් ඒ දෙන්න මෙතන නැහැ. මොකද අපේ ගමේ ගෙයක් නැති ට්‍රේලර්ෂොප් එකක් බද්දට අරගෙන කරන තරුණයෙක්, මට ඊයෙ ඔහුට සමෘද්ධිය ලැබිලා නැහැ කියලා කිව්වා. මම හිතන්නේ ඒ තරුණයා ඡන්දෙ දුන්නෙ අපිට නෙවෙයි. නමුත් මෙතැනදි ඒක අදාල නෑ. මම ඒ ගැන හොයලා බලන්න අදාළ කටයුතු කරන්න කියලා අපේ වසන්ත මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම හිතන්නේ එතුමගෙ පාක්ෂිකයෙක්. ඒ වගේම ඔහුට ගෙයක්, ඉඩමක් නැතුව, දරුවො දෙන්නෙකුත් එක්ක අනුන්ගේ තැනක ජීවත් වෙන කෙනෙක්. ඒ විතරක් නෙවෙයි ගමේ සමෘද්ධිය නොලැබිය යුතු පිරිසක් විශාල වශයෙන් ඉන්නවා. ඒ ගැනත් මම සිහිපත් කරනවා. මේක වාර්තාගත වුනායින් පස්සේ හරි එතුමට ලබාදෙන්න. මොකද මම එතුමාගේ නම දන්නේ නැහැ.

ඊළඟට පරණතානායම්ගොඩ කොස් ගහ ගැන, මම ඉස්සෙල්ලත් සභාවේදි කතා කළා. ගරු සභාපතිතුමා ඒ සඳහා සෑහෙන්න කැප වුණා. මොකද සභාපතිතුමා කරන්න පුළුවන්, නමුත් නඩු තියෙන ඉඩමක් නිසා මාර්ගයක කොච්චර අවහිර වුණත්, අපට ඒක කපන්න හැකියාවක් නැති තත්වයට පත්වෙලා තියෙනවා. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම්තුමියට ලිඛිතව දැනුම් දුන්නා. නමුත් දැන් මාස හයක් විතර ගත වෙලා. මම හිතන්නේ දහයකට පහළොවකට වැඩිය එතනදී හානියට පත් වුණා. අනතුරු සිද්ධ වුණා. අන්තිමට මම ෆේස්බුක් දුරකථන ජාලය තුල ප්‍රාදේශීය ලේකම් තුමියට දොස් කියලා දැම්මා. ඊට පස්සේ විදුලිබල මන්ඩලයෙන් ඇවිල්ලා අඩි පහක් විතර කැල්ලක් විදුලි රැහැන් වලින් විතරක් අයින් කරලා ගියා. නමුත් ඊයේ පෙරේදා වෙනකන්ම ඒක එහෙමම ඇලවෙලා තිබුණා. බලපත්‍රයක් නැතුව කොස් ගස් පෙරලීම වරදක් කියලා කොහේවත් නැති නිසා, මම සභාපති තුමාගේ අවසරය ඉල්ලලා, සභාපතිතුමාගේ සහයෝගය ඇතිව, මැෂින් එකක් ගිනිහිල්ලා ගහ පැත්තට හේත්තු කරලා තිබ්බා. බාගෙට පෙල්ලලා තියෙන්නෙ. එක හානියක් වෙයිද දන්නෙ නැහැ. මොකද ඒ අසල නිවසක් තියෙනවා. නමුත් අපිට තාම මේකට හරි විසඳුමක් ලැබුණේ නැහැ. සභාපතිතුමා ලොකු උනන්දුවක් දක්වලා ඒ කටයුතු කර ගන්න උදව් කලාට මම ස්තුතිවන්ත වෙන්න ඕන.

ඊළඟට ඉදිරියට එළඹෙන පොසොන් පොහොය නිමිත්තෙන් දන්සලක් දෙමුයි කියලා අදහසක් සභාපතිතුමාට තිබුණා. අපි බලමු. පක්ෂ විපක්ෂ සියලු දෙනා එකතු වෙලා දන්සැල දෙන්න කැමති නම් අපි එකතුවෙමු. වියදම් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපි සාකච්ඡා කරලා සව් දන්සලක් හරි දෙන්න පුළුවන්. මොකද අපේ සභාව යම්කිසි දෙයක් කරනවා කියන එකට. ඉතින් සභාව කියන්නේ මෙම පාලක පක්ෂය, විරුද්ධ පක්ෂය නැතුව අපි ඔක්කොම එකතු වෙලා ඉන්නවනම්, මෙතන ඇවිල්ලා අපිට ඒ දේ කරන්න ශක්තියක් වෙනවා. ඒ ගැන සාකච්ඡා කරලා කරන්න කියලා සිහිපත් කරමින්, අපේ දිල්රුක්ෂි මන්ත්‍රීතුමියට සුභ පතන්න ඕන. මොකද එතුමියට රැකියාවක් ලැබුණා. ඇත්තටම කාලපරාසයක් පහුවෙලා වුණත්, එතුමියගේ වාසනාවට අද රැකියාවක් ලැබිල තියෙනවා. අපි සියලු මන්ත්‍රීවරුන්ගේ සුබපැතුම් ඔබතුමියට එකතු කරනවා. ඒ වගේම සියලුම දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දීර්ඝ වශයෙන් කතා කරල සෑහීමකට පත්වෙලා දැන් කතාකරන්න එපයි කියලා හිතින් හිතන වෙලාවක ගිය සභාවෙත් කතා නොකළ නිසා, මට වචන කීපයක් කතා කරන්න හිතුනා. ගරු සභාපතිතුමනි, සමෘද්ධිය ගැන කතා කලා. ඇත්තටම අපි සමෘද්ධිය ලැබුණු ජනතාවට සුබ පතනවා. සහබන්දු මහත්මයා කිව්ව වගේ, අවුරුදු විස්සක් සමෘද්ධිය නැතුව ඉඳලා ලැබුන නම්, අපි සතුටුයි. ඒත් මම හිතන්නේ නැහැ. අපේ ගම්වල නම් අසාධාරණ විදියට යම් දෙයක් වුණයි කියලා වාර්තා වෙලා නැහැ. මම හිතන්නේ වාර්තා වෙන එකකුත් නැහැ. කොහොම වුනත්, ඔය සමෘද්ධිය ලබා දීල තියෙන ලක්ෂ හයක් ම එක්සත් ජාතික පක්ෂයේ එදා ඉඳලා ක්‍රියාකාරීව ඉන්න අය. ඇත්තටම අපි ඒ ලිස්ට් එක දැකල වත් නෙවෙයි කතා කළේ. මන් හිතන්නෙ මන්ත්‍රීතුමා ඔබතුමාලගේ පක්ෂයේ මහත්වරුන්ටත් සමෘද්ධිය ගන්න, අර රතන හාමුදුරුවන්ට වගේ හෙට අනිද්දා උපවාස කරන්න සිදුවෙයි. ඒ නිසා මේකෙන් අපට හානියක් සිදු වුණේ නැහැ. පක්ෂයක් වශයෙන්, අපට ලොකු ශක්තියක් වුණා. ඒ වගේම අපේ චන්දිමා මන්ත්‍රීතුමියට රැකියාවක් ලැබීම ගැන සතුටු වෙනවා. ඒ වගේම සුබ පතනවා. කොහොම නමුත් මේවගේ ලැබිය යුතු කෙනෙකුට, සුදුසුකම් ඇති කෙනෙකුට රැකියාවක් ලබාදීම පිළිබඳව අපි සතුටුයි.

ඒ වගේම අපේ සහබන්ධු මන්ත්‍රීතුමා අදහසක් දැක්වූවා. ළමයි හතර දෙනකුට වැඩිය ඉන්න පවුලකට රුපියල් 1500 ක මාසික දීමනාවක් දෙන්න අදහසක් දැක්වූවා. මමත් ඒ අදහසට එකඟයි. එතුමගෙ වෙන කතා කොහොම වුණත්, ඒ අදහස නම් හොඳයි. එහෙම ළමයි හතර දෙනෙකුට වඩා ඉන්න

පවුලකට දීමනාවක් දෙන්න ක්‍රමයක් තියෙනවා නම්, අපි බොහොම සතුටු වෙනවා. ජාතියක් වශයෙන් අපි යම් තැනක සිටිය යුතු මොහොතක, අපි දේශපාලන වශයෙන් යම් යම් විදියට තර්ක විතර්ක කරමින් අපි අපි ම විවේචනය කර ගන්නවට වඩා, ජාතියක් වශයෙන් එකට සිටිය යුතු කාලයක් එළඹිලා තියෙන්නේ. ඒ නිසා මම හිතන්නේ අපි සිංහල ජාතිය වශයෙන්, බොහොම කල්පනාවෙන් කටයුතු කරන්න ඕන කාලයක්. ඒ බව ඔබ සියලු දෙනාටම මම සිහිපත් කරනවා.

ඒ වගේම සමෘද්ධිය යම් අසාධාරණ විදිහට ලබා දී තිබුණොත්, මේ අය ලිස්ට් එකක් හදලා ඉදිරිපත් කරලා තිබුණොත්, රජයේ නිලධාරීන් ඒ අනුව කටයුතු කරන්නේ නැහැ. මොකද නිලධාරීන්ට තමයි ගස් යන්න වෙන්නෙ. ප්‍රාදේශීය ලේකම්තුමාට, සමෘද්ධි නිලධාරීන්ට ඒ අයට වගකියන්න වෙයි. ඒ නිසා ඒව ගැන අපට ලොකු තර්ක විතර්ක නැහැ.

ඒ වගේම නව තෙල් මිල සූත්‍රය අනුව පෙට්‍රල් රුපියල් 3කින් මිල ගියා. ඒ ගැන සතුටුයි. ඒකත් තවත් එක ඡන්ද ප්‍රතිඵලයක්. ඒ වගේම මේ කාලේ ආණ්ඩු දිනන එක ගැන අපි කතා කරනවා. කොහොම වුනත් අපි ප්‍රාදේශීය සභාවේ දේශපාලනය කතාකරනවා. නමුත් මම මතක් කලා වගේ, ජාතියක් විදියට අපි බොහොම කල්පනාවෙන් සිටිය යුතු කාලෙක, එක එක්කෙනාට විවේචන කරමින්, අතදික් නොකර, මේ වකවානුව තුළ දේශපාලන වාසි නොතකා අපි කටයුතු කල යුතු වෙනවා. නොයෙක් දේවල් කතා කළත් මේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු මෙතන ඇවිල්ලා ආණ්ඩුව සුද්ධ කලාට, ගෙදර ඉඳන් බනින ඒවා දොර ජනෙල් තමයි දන්නේ. තරංග මන්ත්‍රීතුමා, සහබන්දු මන්ත්‍රීතුමාලත් එහෙම තමයි. මොකද මෙතන ඇවිල්ල බොරුවට ආණ්ඩුවට කඩේ යනවා. ඒක තමයි ඉතින් ක්‍රමේ. ඒක නිසා අපි දන්නවා ඔබතුමාල ජාතියක් වශයෙන් සිංහලයන් විදියට අපිත් එක්ක යම් තැනක ඉන්නවා. ඒ ගැනත් අපි සතුටු වෙමින්, ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මුලින්ම ඔබතුමා කිව්ව වගේ වෙනත් කතා යටතේ කතා කරන ගරු මන්ත්‍රීතුමන්ලා සභාවේ අනිත් අයගේ අදහස් වලටත් ඇහුම්කන් දෙන්න මේ සභාවේ රැඳී ඉන්නවනම් තමයි වැදගත් කමක් තියෙන්නේ. නමුත් නොයෙකුත් අවස්ථාවන් වලදී තමන්ගේ පුද්ගලික අවස්ථාවන් සඳහා පිටව යන්න වෙනවා. නමුත් මේ සභාවේ අනිකුත් මන්ත්‍රීවරුන්ට ඒ කතා කරපු මන්ත්‍රීවරයා පිළිබඳ යම් උත්තරයක් දීලා, ඒ පණිවිඩය ඒ ගරු මන්ත්‍රීවරයාට ලැබුනට, මම හිතන්නේ ඊට වඩා සජීවීව ඒ අවස්ථාවට සම්බන්ධ වෙනවා නම් තමයි වැදගත් කමක් තියෙන්නේ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමුකරලා කටයුතු කරන්න කියලා සිහිපත් කරනවා. අපේ කණ්ඩායමෙත් මන්ත්‍රීවරු දෙන්නෙක් මේ අවස්ථාවේ බැහැරව ගිහිල්ලා තියෙනවා. එහෙම වේලාසන යනවනම් ඔබතුමා දැනුවත් වෙන්න කියලා මම මේ අවස්ථාවේ දී මතක් කර සිටිනවා. මම මුලින්ම අපේ සහබන්දු ගරු මන්ත්‍රීතුමාට මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද මේ සභාවේ වසර හතරක කාලයක් සභාපතිවරයා වෙලා ඉඳලා අද මේ අවස්ථාවේ නැගී සිට වර්තමාන සභාපතිතුමා විවේචනය කරමින්, මේ සභා කාලය තුළ පත්වුණු දුර්වලම සභාපතිවරයා වශයෙන් එතුමාගේ නම මේ සභාවෙන් ප්‍රකාශ කළා. තවම වසරයි මාස ගානක කාලයක් සභාපතිත්වය දරමින් සිටින ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මැතිතුමා, මේ සභාව මෙහෙයවන මේ වකවානුව තුළ එතුමාගෙන් වෙච්ච අඩුපාඩුකම් කිහිපයක් නිසා වෙන්න ඇති එතුමා ප්‍රකාශ කරන්න ඇත්තේ. අපට තේරෙන විදිහට මේ නැහිනිගල පාර තමන් උපන් දා සිටම ජීවත්වන, තමන්ගේ අවශ්‍යතාව සඳහා යන එන පාර. මේ කානුවක් පිළිබඳ ඇතිවෙච්ච ගැටලුවක්. ඒ වගේම එතුමා එන්න කලින් මේ සභාවේ එතුමාගේ ලයිස්තුවක් ප්‍රකාශ කළා. ප්‍රදේශීය ලේකම්තුමිය ලක්ෂ 20ක මුදලක්ද, ලක්ෂ 40 ක මුදලක්ද නැහිනිගල පාරට වෙන් කළාය කියලා එතුමා කලිනුත් කිව්වා. මේ සල්ලිවලින් කානු පද්ධතියක් සකස් කරගන්න පුළුවන්. කාණු පද්ධතියක් දාන එක ප්‍රාදේශිය සභාවක් වශයෙන් ඒ

වගේ සංවර්ධන කාර්යයක් කරන්න අපට පහසුකමක් නැහැ. අපි කවුරුත් දන්නවා ඒක ලක්ෂ 20ක 25ක වැඩක්. ප්‍රාදේශීය සභාවක් වශයෙන් ඒ සම්පත් අපට නැහැ. ඉතින් ඒ පිළිබඳ වැඩපිළිවෙළක් තියෙනවා කියද්දි එතුමා ප්‍රකාශ කළේ අසාර්ථකම සභාපතිවරයායි කියන එකට, මම එතුමාගේ කාලය තුළ යම් කරුණක් සභාවේ නොදන්න මන්ත්‍රීවරුන්ට සිහිපත් කරන්නම්. කටු පොල් වගාවේ අපද්‍රව්‍ය ඇළට දාපුවාම, මමයි, සඳුන් මන්ත්‍රීතුමයි තමයි උඩලමත්ත මාමනදොල ඇලෙන් පරීක්ෂණ සඳහා වතුර බෝතල් සාම්පල් අරගෙන දුන්නේ. ඒ වෙලාවේ රූපවාහිනිය කැඳෙව්වා, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තයා කැඳෙව්වා. සභාව තුල එතුමගේ නිල කාලය තිබුණු කාලය. අන්තිමට ඒකේ ප්‍රතිඵලය ආවේ. ඒ වතුර පානය කරන්න සුදුසු වතුරක් කියලා. දැන් ඒ පරීක්ෂණ වාර්තා 12ක් විතර අරගෙන ඇති. සියළුම පරීක්ෂණ වාර්තා අසමත් වෙලා. අද වටවල වැවිලි සමාගමේ තියෙන අධිකාරී බලය නිසා කිසිම ගුවන් විදුලියක, රූපවාහිනියක කවදාවත් වටවල වැවිලි සමාගම විසින් කටුපොල් වගාවෙන් මාමණදොල ඇළ අපවිත්‍ර කරයි, පරිසරය දූෂණය වෙනවයි කියලා කිසිම වාර්තාවක් සඳහන් වෙලා නැහැ. ඒ සියලු අධිකාරී බලය මේ වතු සමාගම විසින් රැක ගනිමින්, මේ කටයුත්ත කරගෙන යනවා. අපි ඉතාමත් අපහසුතාවයට පත්වෙලා තියෙනවා. පරිසර හානිය පිළිබඳව. එතුමාගේ කාලය තුළ මේවාට අයුතු ප්‍රයෝජන ලැබුණයි කියලා මම සභාව හමුවේ කියන්නේ නැහැ. ඒක වැදගත් නැහැ. අදාළ නැහැ. ඉතින් මම නැවතත් කණගාටු වෙනවා සහබන්දු මන්ත්‍රීතුමාගේ ඒ ප්‍රකාශය පිළිබඳව. ගරු සභාපතිතුමා, ඔබතුමා පිළිබඳව මේ ගරු සභාවේ විශ්වාසය තවදුරටත් තියෙන බව මම මේ අවස්ථාවේ සභාවේ යෝජනා කරනවා. ඒ පිළිබඳ අපි විශ්වාසව කටයුතු කරමු. මෙම ක්‍රියා පටිපාටියේ දී, මේ කාලය තුළ යම් යම් අඩුපාඩුකම් සිදු වුනා නම්, අපිත් පුළුවන් ආකාරයෙන් නීත්‍යානුකූලව, ක්‍රමානුකූලව කටයුතු කරන්න ඕන. කැත්තට පොල්ල වගේ ප්‍රශ්න විසඳන්න බැහැ. දැන් ඔය සර්විස් එක ළඟ ප්‍රශ්නයත්, අවුරුදු විස්සක් විතර තිස්සේ තියෙන ප්‍රශ්න. ඒවත් වැරදියි. සභාවත් වැරදියි. පරිසරය ප්‍රයෝජනයට ගන්න මිනිස්සුත් අපි දැක්කා. බන්දුල මන්ත්‍රීතුමා හිටියා නම් හොඳයි. සර්විස් එක ළඟ ඉඳලා එතුමලගෙ ගෙවල් ලඟටම කෙටල ගාලක් තිබුණා. ඒ සියල්ලම ගොඩ කරලා අද ගොඩනැගිලි හදලා තියෙනවා. වතුර බහින්නවත් කාණුවක් ඉතුරු කළේ නැහැ. මේ පරිසර හානිය නිසා තමයි මෙසේ සිදු වෙලා තියෙන්නෙ. ඉතින් ඒ පිළිබඳව කටයුතු කරන්න ඔබතුමා උත්සාහ කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඊළඟට මම කතා කරන්න කැමතියි. සමෘද්ධි සහනාධාර ලබාදීම පිළිබඳව අපි විවේචනය කරනවා නෙවෙයි. අධීක්ෂණය කරලා, ඒ තෝරගත්ත පුද්ගලයින් පිළිබඳව කරුණු කාරණා සෙව්වා. එසේ වුවත්, අවංකවම අපි කැමතියි. අපේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ට කිව්වා. වර්තමානයේ දීපු සමෘද්ධි ලයිස්තුව සහ ඊට කලින් සමීක්ෂණ දෙකක් කරලා අවසාන දීපු ලයිස්තුවත් ලබාගන්න කියලා. ඒ ලයිස්තු දෙක එකිනෙකට සැසඳෙන්නෙ නැහැ. අන්තිමට දේශපාලන අධිකාරියේ ලයිස්තුවට තමයි සහනාධාරය ලබා දුන්නේ. ඒ සඳහා අපට සාක්ෂි තියෙනවා. නිශාන්ත මහත්මාණන් පිළිගන්නවා එතුමා මේකට සම්බන්ධ නැහැ කියලා. යටලමත්තට අසාධාරණයක් වෙලා තියෙනවා කියලා. මේ සියලු ගම් වල ලේඛන හදන්න මැදිහත් වෙච්ච සියලු දෙනා මම කියන්නම්. ඒ වගේම මම මගේ ගම ගැන වගේම අනිත් ගම් ගැනත් ඕනනම් කියන්නම්. මම ඒ ලයිස්තු තියාගෙන ඉන්නෙ අයුතු ප්‍රයෝජන ගන්න නෙවෙයි. අපට මේක පැහැදිලිව පේන්න ඕන. මොකද්ද මෙතන වෙලා තියෙන්නේ කියලා. මම උඩුගම කොටසේ නායකත්වය දරන තරංග මන්ත්‍රීතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. උඩලමත්තේ සිදුවෙච්ච අසාධාරණකම් දෙකක් ගැන ඔබතුමාට ලිපිනයන් සමග දැනුම් දෙන්නම්. ඒ ලැයිස්තු හදපු පුද්ගල කණ්ඩායමත් ඕන්නම් මම කියන්නම්. ඒක අවශ්‍ය නැහැ. මම පුද්ගලිකව කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි මෙන්න මේ දෙන්න පිළිබඳව අවධානය යොමු කරන්න. උඩලමත්ත, ගාල්ල පදිංචි නිලංකා දේවිකා අකුලගේන ළමයි තුන්දෙනෙක් ඉන්න වැන්දඹු කාන්තාවක්. ස්වාමිපුරුෂයා අනතුරක් වෙලා තුවාල වෙලා, අංගවිකල වෙලා, කිහිලිකරු වලින් ගියා. ඒ මනුස්සයාට මේ පවුල නඩත්තු කර ගන්න බැරි වුනා. ඒ නිසා ගිණි තියාගෙන මැරුණා. දැනට ඉන්නේ මහගෙදර ඉඩමේ ගෙයක් හදාගෙන. ඒ ගේ කපරාරු කරලත් නැහැ. උඩලමත්ත නැගෙනහිර

වසමෙ අංක එකේම දුප්පත් පවුල. නමුත් සමෘද්ධි සහනාධාරය දුන්නේ නැහැ. නමුත් අල්ලපු වැටේ අක්කරයක තේ ඉඩමක් තියෙන එක්සත් ජාතික පක්ෂයේ සභාපතිතුමා කියන්නෙත් සභාපති කියලා. එයාටත් රුපියල් 3500.00 ක සමෘද්ධි සහනාධාරය තියෙනවා. ඒ වගේම උඩලමත්ත දකුණ වසමේ ඉන්න දුප්පත්ම කාන්තාව. ඇය අන්ත අසරණ වැන්දඹු කාන්තාවක්. දූලා දෙන්නෙක් හිටියා. ඔවුන් විවාහ වෙලා වෙන්වෙලා. උඩලමත්ත දකුණේ ග්‍රාම නිලධාරීතුමිය සුමානෙකට සැරයක්, හාල් කිලෝ දෙකක් අරගෙන යන්න එතුමියගෙන් සල්ලි දෙනවා. හැම සුමානෙම සමෘද්ධිය හදාගන්න උඩලමත්ත දකුණේ කාර්යාලයට එනවා. එච්.ජී.නන්දාවතී, දිමුතු වෙළෙඳසැල අසල, උඩලමත්ත ගාල්ල පොඩි ගෙයක තමයි ඉන්නේ. මම දැනට මේ දෙක පමණයි ඉදිරිපත් කරන්නේ. අවශ්‍යතාවයක් තියෙනව නම්, ලබන මාසයේ සියලු තොරතුරු ඉදිරිපත් කරන්නම්. මේ ගැන ඔබතුමාලා උනන්දු වෙන්න.

මම ඊළඟට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මෙතන නොමැති වීම ගැන කණගාටු වෙනවා. මේ යහපාලන ආණ්ඩුවට, හංස පූට්ටුවට සහයෝගය දීලා අද පෝස්ටරයක් අරගෙන එයා කියනවා. මෙන්න ඊළඟ මැතිවරණයේ ප්‍රතිඵලය. ආණ්ඩුවෙන් තෙල් ටැංකි බදු දීම, වරාය, කොළඹ ඉඩම් විකිණීම ගැන පෝස්ටරේ පෙන්නනවා. මේ හංස පූට්ටුව ආණ්ඩුවේ ප්‍රබල සාමාජිකයෙක්. පෝස්ටර් ගහලා රැස්වීම් තියලා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඡන්දය අරන් දුන්නා. ඊළඟට එක්සත් ජාතික පක්ෂය සමග සම්බන්ධවෙලා තරුණයො, තරුණියො හැටදාහක් පමණ මැරුවා. ඔබතුමා ඒ පෝස්ටරය පෙන්නපු නිසා තමයි මම කිව්වේ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කියනවා. සමෘද්ධිය දුන්න නිසා ඊළඟට එයාලා තමයි ජයග්‍රහණය කරන්නේ කියලා. ඔබතුමා පෝස්ටරයක් පෙන්නලා කියනවා. ඊළඟ ජයග්‍රහකයෝ අපි කියලා. ඔබතුමා ගැන කණගාටු වෙනවා. ඔබතුමාලා ඉන්නේ මොන පැත්තෙද? අපි ප්‍රසිද්ධියෙම කියනවා. අපි මීළඟ මැතිවරණයේදී මොන පක්ෂය එක්ක එකතු වුනත්, ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකතු වෙනවා නම් මම මැතිවරණය කරන්නේ නැහැ. අද සමුපකාර ඡන්ද සමස්ත ප්‍රතිඵලය එතුමා කියන්න දන්නෙ නැහැ. බලය රැක ගන්න බැරිවෙච්ච සමුපකාරය මැතකදී හැමෝම කිව්වෙ ජනතා විමුක්ති පෙරමුණ කණ්ඩායම තමයි ජයග්‍රහණය කරන්නේ කියලා. නමුත් අපි කණගාටු වෙනවා. උඩුගම කොට්ඨාසය අපට ජයග්‍රහණය කරන්න බැරි වුණා. මොකද අපට පණිවිඩය ලැබිලා දවස් දෙකයි. ඒ වගේම පාරවල් කොන්ක්‍රීට් කලත්, කාපට් දැම්මත්, සමෘද්ධිය දුන්නත්, රැකියාවල් දුන්නත්, ඡන්දය ලැබෙන්නේ නැහැ. වනමල් මන්ත්‍රීතුමා හිටිය නම් හොඳයි. දැන් එතුමලා සමෘද්ධිය දීලා ලක්ෂ ගණන් කෝටි ගණන් සල්ලි වැඩි වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. නමුත් ගිය ප්‍රාදේශීය සභා මැතිවරණයේදී අපි කැන්නසින් ගියාම කිව්වා. සිමෙන්ති කොට්ට පහ ගත්තෙ එක්සත් ජාතික පක්ෂයේ මූලන පැත්තෙ ශාඛා සමිති සභාපතිවරයාගෙන් ලියුමක් අරගෙන කියලා. නමුත් එක්සත් ජාතික පක්ෂයට ඡන්දෙ දුන්නෙ නැහැ. පොදුජන පෙරමුණට තමයි ඡන්දය දීලා තියෙන්නෙ. ඒ නිසා සංවර්ධන කාර්යය වලින් දේශපාලන තීන්දු තීරණ ගන්න එපා. ගිය සභා වාරේ විපක්ෂ මන්ත්‍රීවරුන් සද්ද නැහැ. තුන්සිය ගානක් මැරුණා. මේකෙ වගකීම භාරගන්න කිසි කෙනෙක් නැහැ. දැන් සහබන්දු මහත්තයා ආරක්ෂක ඇමතිතුමාට වරද පටවන්න හදනවා. ඉතින් ආරක්ෂක ඇමතිතුමා අපේද? ඊයේ දෙරණ ප්‍රවෘත්ති වලදී මහින්ද මහත්තයා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉස්සරහ තියාගෙන එතුමා කියනවා රටේ නායකත්වය වගකීම භාරගන්න ඕනලු. දැන් ගමේ දහයකට පහළවකට සමෘද්ධිය දීලා ලොක්කෝ වගේ කටයුතු කරන්නේ. එනිසා හිතන්නෙපා මැතිවරණයක් ආවම මේ හේතු සාධක මත ජනතාව ඡන්දෙ දෙයි කියලා. ජනතාව බලයට පත් කරන්නේ රට රැකගන්න පුළුවන්, රට ඒකීයභාවයට රැක ගන්න පුළුවන්, රට ආරක්ෂා කරන්න පුළුවන්, රට විකුණන්නෙ නැති කෙනෙකුට කියන එකත් සඳහන් කරමින්, සියලු දෙනාට සුබ පතමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මට පුංචි අවසරයක් ඕන. අපේ උප සභාපතිතුමා සඳහන් කලා වගේම, අපේ ගරු සභාපතිතුමා, අසාර්ථකම සභාපතිතුමා හැටියට සඳහන් කරමින් මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා. ඒ පිළිබඳව උප සභාපතිතුමාගේ අප්‍රසාදය පළ කිරීමේ යෝජනාව මම මේ වෙලාවේ සම්මත කරන ගමන්ම, මම සඳහන් කර සිටිනවා. මේක සභාගත විය යුතු නිසා මම මේක සඳහන් කරන්නේ. මොකද පාට, පක්ෂ භේදයකින් තොරව ඕනම කෙනෙකුට ඇවිල්ලා කතාකරන්න පුළුවන් හැකියාවක් තියෙන පුද්ගලයෙක්. ඇත්තටම මේ සභාවේ හිටපු සභාපති වරු දිහා බැලුවම, අපිට වුණත්, ඕනම කෙනෙකුට ඇවිල්ල මේ සභාපතිතුමා හමුවෙලා, සුහදව යම් ප්‍රශ්නයක් කතා කරලා, ඒ ප්‍රශ්නය විසඳා ගැනීමේ හැකියාවක් තියෙනවා. මේ ප්‍රකාශය සඳහන් කරපු සභාපතිවරයා අවසාන වශයෙන්, මන්ත්‍රී කෙනෙක්වත් වෙන්න බැරි වුණා. ඒ නිසා ඒ පිළිබඳව අපි දැඩි අප්‍රසාදය මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඔබතුමාලගේ යෝජනාවට මම විරුද්ධ වෙනවා නෙවෙයි. ඒක මේ වෙන ප්‍රශ්නයක් නිසා නෙමෙයි. එතුමාගේ ගෙදරට යන පාර සම්බන්ධව ගනිපු තීන්දුත් එක්ක ඔබතුමා ඔය අසාර්ථකයි කියලා කිව්වෙ. වෙන මොකුත් හිතල නෙවෙයි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. දුර්වල සභාපතිගෙ නිර්භීත කතාව අහන්න අපේ චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා නැහැ. අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ නැහිනිගල පාර නිසා තමයි එහෙම කියන්න ඇත්තේ. නැතුව වෙන කිසිම හේතුවක් හින්ද නෙවෙයි. පාරට සිද්ධ වෙච්ච දේ මම පසුව කියන්නම්. අද ශෝකජනක යෝජනාවක් තියෙනවා. බුද්ධාගමට, සිංහලකමට දකුණු පළාතේ නිර්භීත නායකත්වයක් දුන්, අපේ මහා සංඝ පඩිරුවනක් වූ දකුණු පළාතේ ප්‍රධාන සංඝනායක, රුහුණු විශ්වවිද්‍යාලයේ කුලපති, මහෝපාධ්‍යායාය, පල්ලත්තර සුමනජෝති නායක හිමිපාණන් වහන්සේ අපවත් වී ඇති බැවින්, උන්වහන්සේට අපි අමා මහ නිර්වාණ සම්පත්තිය ප්‍රාර්ථනා කරනවා. උන්වහන්සේ වෙනුවෙන් ශෝකය පළ කරන යෝජනාව මම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ඒ එක්කම වසර හයක් ඇතුලත ප්‍රාදේශීය සභාවේ හොඳ සේවයක් කරපු අපේ කළමනාකරණ සහකාර සමීර මහත්මා අද දින සිට ස්ථාන මාරුවීම් ලබා පෝද්දිවල කෘෂිකර්මයට යනවා. එතුමා කැමැත්තෙන් යන්න ගියේ. ස්ථාන මාරුවීම් නවත්වාගන්න මම උත්සාහ දැරුවත්, නමුත් එතුමට මෙතනට වඩා පහසු හා නිදහස් නිසා ඔහු ස්ථාන මාරු වෙලා ගියා. එතුමා මේ අවුරුදු හය තුළ කරපු සේවය සිහිපත් කරමින් අපි අපේ ප්‍රණාමය පුද කරනවා.

අපේ සහබන්දු මන්ත්‍රීතුමා පාර පිළිබඳව වේගවත් කතාවක් කළා. මම අභියෝගයක් කරනවා. අර සහබන්දු මහත්තයා කිව්වා වගේ, විජේපාල මහත්තයා කලා හා සමානව, පුළුවන්නම්, තාප්පෙ කඩන්න කියලා අභියෝගයක් කළොත්, හෙට උදේ නමය වෙනකොට මම තාප්පෙ කඩනවා. මට ඒ බලතල, හැකියාව තියෙනවා. අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න පුළුවන්. එතන තියෙන ප්‍රශ්නේ තමයි අපි අඩි දාසයයි කිය කිය හිටිය ඇත්තටම එතන තියෙන්නෙ අඩි 12යි. ඔය පාර කැඩිච්ච එකත් ඇත්ත. ඒ ගැන හරි කණගාටුයි. මම පලමුවෙන්ම මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ල රුපියල් විසිපන්දාහක් වෙන් කළේ ඒ පාර හදන්න. ඒ ගැන අපේ පතිනායක මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. නමුත් ඒක පහු වුන නිසා, අන්තිමට අපිම ගිහිල්ලා ජේ.සී.බී. එකෙන් පාර කපලා, කොරි පස් දැම්මා. පහුවෙනිදට පහුවෙනිදා ඇති වූ ධාරාණිපාත වර්ෂාව නිසා පාර හෝදගෙන ගියා. ඊට පස්සේ සහබන්දු මහත්තයත් උනන්දු වෙලා සල්ලි ගේනවා කිව්වා. කානුව කපලා දෙන්න කියලා කියලා තමයි අපට කියන්නේ. දැන් අවුරුදු ගණනකට කළින් කාණුව වහනකොට ඔය කතා කරන කවුරුවත් හිටියෙ

නැහැ. කරන්න දෙයක් නැහැ. අපේ පැත්තට තමයි බෝලෙ පාස් කරන්නෙ. මේ කාණුව වහලා තියෙන්නෙ අපි එන්න අවුරුදු ගාණකට උඩදී. ඒ අනුව අපි ජේ.සී.බී. එකෙන් කාණුව කපද්දී, අල්ලපු ගෙදර අයත් මට දොස් කිව්වා. අපේ බොහොම හිතවත් තැනක් තමයි ඉස්කෝලෙ මහත්තයලයි ගෙදර. මම කාගෙවත් පැත්තක් අරගෙන වැඩකරන්නෙ නැහැ. මම අර අභියෝගය කළෙත් ඒකයි. මම ඒ වගේ පැත්තක් අරගෙන වැඩකටයුතු කලානම්, මම මීට වඩා දේවල් කරලා. කොකාගේ සුද පේන්නේ පිහැඹුවොත්නෙ. නමුත් මම තාම කකුලක් උස්සගෙන මාළුවට අනින්න බලාගෙන ඉන්නවා මිසක්, පියාඹන්න ගියේ නැහැ. ඒ නිසා ඒ ගැනත් හිතන්න. මම දුර්වල සභාපති කෙනෙක් නෙවෙයි. මම මේ ප්‍රාදේශීය සභාවෙන් ඉවත් වෙලා යනකොට හොඳම සභාපති වෙලා තමයි මම යන්නේ. මගේ මනුස්සකමට අගෞරව කරන්න එපා. මනුස්සකම හින්ද තමයි මේ හැමදේම වෙන්නේ. මේ පාරෙ ප්‍රශ්නෙට පෙත්සම් ඇවිල්ලා ඒ පෙත්සමේ තියෙනවා ව්‍යාපාරිකයන්ගේ ඕනෑ එපාකම් නිසා ප්‍රතිපාදන වෙන් ව තිබියදීත් ගමට යන පාර අතරමග කියලා. ඒ වගේම එහි තියෙනවා. නිවාස හිමියන් සමග එළඹි එකඟතාවයකට අනුව විධිමත් පරිදි ජලය බැසයාමට කාණු පද්ධතිය සකස් කර මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කර මෙම පෙත්සමේ සඳහන් කර තියෙනවා. මෙම කරුණු සම්බන්ධයෙන් අදාල සිදුවීමේ වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් සකසා අදාළ ආයතන වෙත යොමු කරන්න කියලා මම දැන්වුවා. අපේ තාක්ෂණ නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී සමඟ 2019.04.25 දින අදාළ ස්ථානයේ ඒකාබද්ධ ස්ථානීය පරීක්ෂණයක් සිදුකරන ලද අතර එහි වාර්තාව මෙසේය. “ඉහත සඳහන් කරන ලද ස්ථානය අඩි 12ක් පමණ පළල කොන්ක්‍රීට් යොදා, මාර්ගය සකස් කිරීම හා මාර්ගය දෙපස අඩි 2කට ආසන්න පළලකින් යුක්ත ව හා අඩි එකහමාරක පමණ ගැඹුරකින් යුක්ත ව කානු පද්ධතියක් සකස් කිරීම ද, එහිදී තීරණය කරන ලදී. ඒ සංවර්ධන කටයුතු පිළිබඳව මා විසින් අදාළ නිවසේ නිවෙස් හිමියන් හා ඒ හා සම්බන්ධ අනෙකුත් පාර්ශව කරුවන් හට කරුණු පැහැදිලි කර දුන් අතර, එහිදී ඔවුන්ගේ කිසිදු විරෝධතාවක් ඒ සඳහා නොමැති බව පවසන ලදී. ඉහත සඳහන් සංවර්ධන කාර්යය සිදුවනුයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා වන බැවින්, ඉහත සඳහන් සංවර්ධන කාර්ය අත්‍යවශ්‍ය කාර්යයක් බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කඩිනමින් ඉහත සංවර්ධන කාර්යය සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීම මගින් ඉදිරි කටයුතු ඉටු කිරීම අනුමත බව වාර්තා කරමි.” යනුවෙන් තාක්ෂණ නිලධාරී වාර්තාව ඉදිරිපත් කර තියෙනවා. මේ සඳහා ගාල්ලෙනුත් නිලධාරියෙක් ආවා. මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධව අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී විසින් මැනුම් කටයුතු කරලා තියෙන්නෙ. හෙට වුනත් මට වතුර බහින්න කානුවක් කපන්න පුළුවන්. හැබැයි තියෙන පාරත් නැති වෙයි. අපි අඩි 16 ට ගණන් හදලා තිබුනට තියෙන්නෙ අඩි 12යි. අපි යම් අවස්ථාවල අනවසර කියලා කඩන්න පුළුවන්. නමුත් අඩි 12, 16 කරගන්න බැහැ. අපි ඇත්තටම මේක මීටත් වැඩිය සංවේදීව ඒ මිනිස්සු එක්ක කතා කරා නම් අඩි 16 ගන්න බැරිවෙන්නේ නැහැ. ඉතින් අපි ඒ කටයුත්ත නීත්‍යානුකූලව කරන්න ඕන නිසා තමයි ඒ කටයුත්තේදී එහෙම කළේ. ඒ නිසා තමයි මේක පරක්කු වෙන්නේ. ඊළඟට මේ පාරේ තාර දැමීමට ලක්ෂ පහක් ඇස්තමේන්තු කරලා තිබුණා. නමුත් හිටපු මන්ත්‍රී ලලිත් ගාමිණී මහතාගේ ඉල්ලීමකට අනුව මේ පාර කොන්ක්‍රීට් කරන්න අවසර ඉල්ලලා තියෙනවා. නමුත් තවම අනුමත වෙලා ආවේ නැහැ. ඒක තමයි පරක්කුව. අපේ පතිනායක මන්ත්‍රීතුමාට අපි යෝජනා කළා. අපි කාණුව කපමු කියලා. නමුත් ඊට පස්සෙ අර සල්ලි ඇවිල්ලා තියෙනවා. ඒ කාණුව කැපුවොත් දැන් අපට හදන්න බැහැ. තව තවත් කැඩී යාමක් තමයි සිදු වෙන්නේ. ගරු මන්ත්‍රීතුමන්ලා ඒක තමයි සත්‍යථාවය. නැතුව අපේ අඩුපාඩුවක්වත්, නොහැකියාවක්වත්, දුර්වලකමක්වත් නෙවෙයි. ඒ ගැන සොයා බලන්නෙ නැතුවත් නොවෙයි.

ඒ වගේම අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා. මාපලගම පාරෙ අබේසුන්දර මහතාගේ නිවස අසළ ස්ථානයේ වතුර පිරෙන එක ගැන. ඒකත් අවුරුදු ගාණක් ඇදී ඇදී එන ප්‍රශ්නයක්. ගිය සුමානෙ සන අපද්‍රව්‍ය වැඩසටහනට කැඳවපු අවස්ථාවෙදි මම ආණ්ඩුකාරතුමා මුණගැහෙන්න ගියා. මේ ප්‍රශ්නය

ගැන මම කෙලින්ම ආණ්ඩුකාරතුමාට කිව්වා. ඒ අවස්ථාවේ ආණ්ඩුකාරතුමා ඉදිරියේ PRD එකේ ජෙනරල් මැනේජර් සහ ප්‍රධාන ඉංජිනේරුතුමා හිටියා. ඒ වෙලාවේ ආණ්ඩුකාරතුමා ඔවුන්ට කිව්වා. ඒ වෙලාවෙම දුරකථනයෙන් කතා කරලා ඉංජිනේරු මහත්මයා කිව්වා මේ සුමානේ බලන්න එනවා කියලා. මම කිව්වා එතන කාණුවක් කපා කොන්ක්‍රීට් කරලා දැම්ම නම් හරි නමුත් අපට මුදල් නොමැතිකම තමයි ප්‍රශ්නේ. ඉංජිනේරුතුමා G.M ට කතා කළා. ඊට පස්සෙ මට කතා කරලා කිව්වා ඒ වැඩේ කරනවා කියලා. අපි මේ කටයුත්ත කරන්න මහන්සි වෙනවා. නමුත් මේ කාටවත් පේන්නෙ නැහැ. ඒ අතරතුර කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිළිබඳවද කතා කළා.එහිදී එතුමා මට කිව්වා. එම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මැෂිමක් ලබා දෙන බව.

ඒ වගේම අද සමෘද්ධිය ගැන කතා කළා. කවුරුවත් ඇහුවද ආදාහනාගාරය පිළිබඳව. මේ සභාව සතු සම්පත් නීත්‍යානුකූලව සභාවට පවරා ගත්තේ කොහෙන්ද කියල ඇහුවද? තල්ගස්වල ඉඩම් මැණලා, අපට අයිතිය ගත්ත බව ඇහුවද? 1991 වර්ෂයේ ඉඳල අවුරුදු විසි අටක් සභාව තිබුනා. නමුත් ඔය දේවල් කළාද? මම ඇවිල්ලා අවුරුද්දයි මාස ගානක් නමුත් මං මේ කටයුතු කරගෙන යනවා. විදුලිය වුණත් අවුරුදු හත අටකින් හැදුවේ නැති ඒව දැන් මම හදනවා. ඒ වගේම මම ගයන්ත ඇමතිතුමාට ගරු කරනවා. එතුමා අපට උදව් කරන්නෙ මගේ පෞද්ගලික දැන හැඳුනුම්කම නිසා. සමහරු මට කියන්නෙ, මම එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයෙක් වගේ කියලා. නමුත් මම ඔරිජිනල් ශ්‍රී ලංකා කාරයා, ඒකයි පොහොට්ටුකාරයා මහින්ද වාදියා වෙන්නෙ.. නමුත් මම කා එක්කත් ඇයිහොඳයිකම් තියාගෙන ඉන්නවා. මගේ ළඟ ක්‍රෝධකම් නැහැ. ඒ නිසා ඒ මැති ඇමතිවරු අපට උදව් කරනවා. ඒ වෙනුවෙන් අපි ගරු කරන්න ඕන. ඒක තමයි අපේ යුතුකම. ඒ සම්බන්ධකම් කියලා අපි යටි කූට්ටු වැඩ කරන්නේ නැහැ. මම කෙලින්ම කිව්වා එච්චරයි. ඇත්තටම ගයන්ත ඇමතිතුමා අපි පාර්ලිමේන්තුවට කැඳවලා අපේ ඉඩම් පිළිබඳව අවශ්‍ය කටයුතු කළා. අපේ මහින්ද මහත්තයාගේ කාලේ මේ නාගොඩවිතාන සභාපති වෙලා හිටිය නම්, මේවා මේ වෙනකොට කරල ඉවරයි.

ඒ වගේම තල්ගස්වල කඩපේලිය අලුත්වැඩියා කිරීම ඇත්තටම විය යුතු දෙයක්. ඒක හුඟක් කල් ඉඳලා ඉල්ලුම් කරන දෙයක්. උප සභාපතිතුමනි, අපි ඒ ගැන සාකච්ඡා කරලා, ඒ කටයුතු කරමු. අපි සියලු දෙනාගේ එකඟත්වයෙන් යුතුව විනිවිධව කටයුතු කරන්න ඕන. නැත්නම් අපට පෞද්ගලික ප්‍රශ්න වලට මුහුණපාන්න වෙනවා. ඊළඟට තල්ගස්වල පොළට මෙහා වත්තට හැරෙන තැන කඩ පේළියක් සකස් කරන්න අදහසක් තියෙනවා. පොළවල් පිළිබඳව කතා කරද්දි වෙරංග මන්ත්‍රීතුමා උඩුගම පොළ පිළිබඳව ගොඩක් උනන්දු වෙනවා. ඊළඟට අර ඉටිකොළ බැඳගෙන යනවා කිව්ව කතාව ඇත්ත වෙන්න ඇති. නමුත් අපේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු වර්ග කිලෝමීටර් 178 ක ප්‍රමාණයටම වැඩ කරන්න ඉන්නේ කම්කරුවන් හය දෙනයි. නමුත් අපේ ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තියෙන පාසලේ වැඩ කරන්න කම්කරුවෝ 12 දෙනෙක් ඉන්නවා. ඉතින් කොහොමද අපි වැඩ කරන්නේ. මේවා හිතන්න ඕන දේවල්. අපි දැන් පාරවල් සුද්ද නොකර, පොළවල් ටික සුද්ද කරන්න තමයි මගේ බලාපොරොත්තුව තියෙන්නේ.

ඒ වගේම විදුලිය සම්බන්ධව අපට දැන් සතුටුවිය හැකි තත්වයක් තියෙනවා. දැන් 70%- 80% ක් වගේ ප්‍රමාණයක් වැඩ ඉවරයි. අපේ උප සභාපතිතුමාලගෙ ප්‍රදේශයේ නම් ඒ කාර්යය ටිකක් අඩුයි. ඊළඟට ඔබතුමන්ලා උඩුගම පිට්ටනියේ කඳන් දාපු සිදුවීම ගැන කතා කලා. හිටපු අපේක්ෂකයෙක් වන පොඩි ජගත් කියන මහත්මයා මට දුරකථනයෙන් කතා කරලා ඇහුවා. පිට්ටනියෙ කඳන් දාන්නද කියලා. මම කිව්වා හැබැයි පිට්ටනියට හානි කරන්නේ නැතුව වැඩේ කරගන්න කියලා. ඊට පස්සෙන්දා ධනංජය මන්ත්‍රීතුමා මගෙන් කතා කරලා ඇහුවා. කවුද මේ කොටන් දාන්නෙ කියලා. එතුමා ඒ සිදුවන හානිය ගැන කිව්වම, මම ඒක බලන්නත් ගියා. මේ සම්බන්ධව වෙරංග මන්ත්‍රීතුමාත් කතා කලා. කොහොම නමුත් මම කිව්වා කරුණාකර මේ ටික අයින් කරගන්න කියලා. ඒ වගේම වත්තටත් කිව්වා. රෑ 12 වෙනකොට ගස්ටික අයින් කරගන්න කියලා මම ඒ අදාළ පුද්ගලයටත්

කිව්වා. ඒ වගේම එම පිට්ටනියෙ බස් දාලා තියෙනවා. පාසල් වාහන දාලා තියෙනවා. එතකොට ඒකට කවුරුත් කතා කළේ නැහැ. එහෙමනම් ඒකත් අපට කියන්න ඕන. මෙන්න මේ පිට්ටනියෙ වාහන ගාල් කරනවයි කියලා. නමුත් අපි කතා කලානම් මොකද වෙන්නේ. පාසල් ළමයින්ගේ බස් එකක් වත් දාන්න දෙන්නේ නැති සභාපතියි කියාවි. ඒ වගේම ඔය පොළේ වාහන දාන්න ස්ථානයක් නැති නිසා තමයි පිට්ටනියෙ වාහන ගාල් කරන්නේ. ඒ සඳහා අපි මොකක්හරි ක්‍රියාමාර්ගයක් ගන්න ඕන. එම ස්ථානයේ විදුලි ලාම්පු නැත කිව්වම අපි ලයිට් එකක් දාලා දුන්නා. සියළුම ප්‍රශ්න එකපාරටම විසඳන්න බැහැ. මගේ පෞද්ගලික යාළු මිත්‍රකම් වලට මම වැඩ කරලා නැහැ.

ඊළඟට සමෘද්ධිය පිළිබඳව මම දන්නෙත් නැහැ. කතා කරන්නෙත් නැහැ. සමෘද්ධියට සීයට කෝටියක් ම මම විරුද්ධයි. කිසිම කෙනෙකුට දිය යුතු නැහැ. ඕනෙම නම් මෙහෙම සමෘද්ධිය ලැබිය යුතු පුද්ගලයන් ගමක එක්කෙනෙක් දෙන්නෙක් විතර ඇති. මේක ලක්ෂ 6කට දෙනවා කියන්නේ, අපේ රට හිඟන තත්ත්වයක වැටිලා කියන එක. පසුගිය කාලේ සමෘද්ධියෙ වටිනාකමක් තිබුණා. ළමයෙක් විශ්වවිද්‍යාලයට තේරුණාම එයා සමෘද්ධි තියෙන පවුලක ළමයෙක් නම් ලකුණු දුන්නා. රැකියාවල් වලට යනකොට සලකා බැලුවා. පොඩි මතයක් ඇති කරලා තිබුණා. ඒ නිසා සමෘද්ධිය වැදගත් වුණා. නැත්නම් ඇත්තටම මේ සමෘද්ධියට රුපියල් 3000.00ක් හම්බවුනොත් සමෘද්ධිලාභීන් දවස් දෙක, තුනක් එක එක වැඩසටහන්වලට යනවා. එයා දන්නේ නැහැ එයාගේ ආදායම ඒ දවස් තුනේ වැය වෙලයි කියලා. සමෘද්ධිය කියන්නේ විහිලුවක්. නිකන් දෙන්න අවශ්‍ය නැහැ. නිකන් දුන්නොත් අපි ඒකටම ඇබ්බැහි වෙලා ඉන්නවා. සමෘද්ධිය ලැබිය යුතු පුද්ගලයන් ඉන්නවා. අපේ රජයේ කාලෙත් ඔය සමෘද්ධිය දීපුවා අපි අනුමත කරල නැහැ.

ඒ වගේම ඉනෝකා මන්ත්‍රීතුමිය කියපු පැමිණිල්ල පිළිබඳව සොයා බලන්න මම තාක්ෂණ නිලධාරී මහතා යවලා තියෙන්නෙ. එම වාර්තාවට අනුව මම ඉදිරියේදී අදාල පියවර ගන්නම්. වසන්ත මන්ත්‍රීතුමා මාපලගම වැසිකිලිය පිළිබඳව කතා කළා. ඒකට කවුරුත් ආධාර උපකාර කරන්න ඕන. ඒකට සජිත් මහත්තයලගෙ අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරලා තියෙනවා. නමුත් ගිය සැරේ පළාත් සභාවෙන් ලක්ෂ 37ක් ආවා. ඒ කාර්යය සිදු නොවන නිසා ඒ ලක්ෂ 37 වෙනත් ව්‍යාපෘතියක් වෙනුවෙන් වැය කළා. ඒ වගේම අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කතා කළා. පාසල්වල ආරක්ෂාව පිළිබඳව. දැන් ඇත්තටම පාසල්වලට ආරක්ෂාවක් අවශ්‍ය නැහැ. ඇත්තටම අපරාදෙ දෙමව්පියෝ පාසල් ලඟට වෙලා ඉන්නවා. ගෙදර කැරපොත්තාටත් බය දෙමව්පියෝ මෙතන IS ත්‍රස්තවාදී සටන්කාමීන්ගේ බෝම්බයට ඇටැක් කරන්න එනවා. ඒක ඇත්තටම විහිළුවක්. ඒ වගේම දැන් බලන්න පෞද්ගලික පන්ති වලට කිසිම ආරක්ෂාවක් නැහැ. ඒ වගේම මහ බැංකුව කඩපු අර්ජුන මහේන්ද්‍රන් දැන් මිනිස්සුන්ට මතක නැහැ. ඊළඟට කුඩු මධුෂ්, සක්විති ඒ අය අමතකයි. ඊට පස්සේ සහරාන්, ඊබ්‍රාහිම් දැන් ඒ අයත් ටිකක් අමතක වීගෙන යනවා. දැන් දොස්තර සාෆි, ඊට පස්සේ අපේ රතන හාමුදුරුවෝ. අන්න ඒ වගේ එක එක කාලෙට සිදු වන දේවල් සතියයි, දෙකයි මිනිස්සුන්ට මතක තියෙන්නෙ. ඒක තමයි යථාර්ථය. ඒ වගේම රතන හාමුදුරුවෝ තමයි දැඩි ප්‍රයත්නයක් දරලා මෛත්‍රීපාල මැතිතුමා ජනාධිපති කෙරෙව්වේ. එම හිමියන්ට ගිහිල්ල කියන්න බැරිද ජනාධිපතිතුමනි, මේ දෙන්න අයින් කරන්න කියලා. ඇයි එහෙම බැරි. ඒ අය පත් කරපු අයනෙ. ඊට පස්සේ මුස්ලිම් ජන සමාජ එකතු වුණා. අර බෙදෙන්න හිටිය එක්සත් ජාතික පක්ෂය විශ්වාසභංගයට එකතු වුණා. අපි වුනත් එහෙමයි. නාගොඩ ප්‍රාදේශීය සභාවට බද්දේගම ප්‍රාදේශීය සභාව ඇටැක් කළොත්, කොහොම නමුත් මෙතන ඉන්න අපි සියළු දෙනා එකතුවෙනවා. ඒක තමයි සත්‍යය. කොහොම නමුත් මේක රට එකතුවිය යුතු අවස්ථාවක්. ඉතින් මේ සමහර කටයුතුවලට මම කැමතියි. සමහර කටයුතු වලට අකමැතියි. අපේ හිටපු ලේකම්තුමිය මුස්ලිම් නිලධාරිනියක්. අපි අතර ජාතිවාදයක් තිබ්බෙ නැහැ. හැමකෙනාම එහෙම නැහැ. නමුත් මේවායේ යම් ඇත්තක් තියෙනවා. ඒ නිසා අපි කල්පනාවෙන් ඉන්න ඕන. නැත්නම් අපේ රටට බොහොම අභාග්‍යසම්පන්න තත්වයක් ඇති වේවි.

වාසනාවට බුද්ධාගම අදහන රටක් නිසා 21 වෙනිදා මේ ප්‍රහාරය සිදු වුණා. තව මාස 06- 10 කට පසුව මෙය සිදුවුණා නම්, සිදුවන විනාශය කොපමනදැයි හිතා ගැනීමට බැහැ.

ඒ වගේම තොටුපළවල් සංවර්ධනය කිරීම පිළිබඳ කතා කිරීමේදී, මාපලගම තොටුපල පුරාවිද්‍යාවට භාර අරගෙන තියෙන දෙයක්. අපි මේවා කරනකොට පුරාවිද්‍යාවෙන් අවසර අරගෙන, පුරාවිද්‍යාවට දැනුම් දෙන්න ඕන. මෙහි සංරක්ෂණය කිරීම පුරාවිද්‍යාවට භාර අරගෙන තියෙන තොටුපළක් කියලා තමයි සඳහන් වෙන්නේ.

රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කතා කළා. ගුරු සංගම් පිළිබඳව. අපටත් ඡන්දයක් නැති වෙලාවෙ පොඩි අවස්ථාවක් ආවා. අපිත් අධ්‍යාපන සමුපකාර නිලධාරීන් තෝරන ඡන්දයට ඉදිරිපත් වුණා. එක්සත් ජාතික පක්ෂය මේ සඳහා ඉදිරිපත් වුනේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ ඔබතුමාලා තමයි අවුරුදු 10 ක් 12 ක් මේකෙ බලයෙ හිටියෙ. ඔබතුමාලට බලය දුන්නෙ ජනතා විමුක්ති පෙරමුණ සාධාරනයි, හරි අවංකයි හරියටම ඒ වැඩේ කරයි කියලා. නමුත් ඒක නොවන නිසාත්, අපිට මොනවහරි ඡන්දයක් අවශ්‍ය නිසා නොහියව ඉදිරිපත් වුණා. නමුත් හුඟක් දෙනෙක් ඡන්දය දෙන්න ගියේ නැහැ. නමුත් මුළු ලංකාවෙම ඔබතුමාලගෙ සංගමයට වඩා අපි ජයග්‍රහණයක් ලබලා තියෙනවා. ගාලු දිස්ත්‍රික්කය විශේෂයෙන්ම ජයග්‍රහණය කරලා තියෙනවා.

ඒ වගේම කටුපොල් කර්මාන්තශාලාවේ අපද්‍රව්‍ය ගැන කවුරුවත් කතා කළේ නැහැ. දැන් ඒ ප්‍රශ්නයෙ 95% ක්ම අප ජලය පිරිසිදු කිරීම සඳහා ඉදි කර ඇති පද්ධතියේ වැඩ කටයුතු ඉවරයි කිව්වා. ඒ වගේම දැන් ජලය සුදුසු මට්ටමකට ඇවිල්ලා තියෙනවා කිව්වා. මේ සුමානේ වෙනකොට පරිසර අධිකාරියෙන් අවසර ලැබෙනවා කිව්වා. ඒ ගැන මං පසුගිය දවස්වල සම්බන්ධ වුණ පරිසර කමිටුවෙදී කතා කළා. වැලි ප්‍රශ්නය හා කටුපොල් ප්‍රශ්නය ගැන කතා කළා. ඉදිරියේදී බොහොම සාධාරණ තීරණයක් ඒවි. එහෙමනම් මම මීට වඩා යමක් කියන්නේ නැහැ. අපේ උප සභාපතිතුමාගේ අදහස් වලට අපි ගරු කරමින්, එහෙමනම් අද සභාව මෙතෙකින් අවසන් කරනවා. සියළුම දෙනාට සම්මා සම්බුදු සරණයි. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:- ..............................